වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

Annual Report

2015

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

நிர்மாணக் கைத்தொழில் அபிவிருத்தி அதிகாரசபை

Construction Industry Development Authority

නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

வீடமைப்பு மற்றும் நிர்மாணத்துறை அமைச்சு

MINISTRY OF HOUSING & CONSTRUCTION

පටුන

1.0 දැක්ම ……………………………………………………..1

2.0 මෙහෙවර…………………………………………………1

3.0 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත……1

4.0 මූලික පරමාර්ථ ……………………………………………1

5.0 සංවිධානය ………………………………………………...2

6.0 ක්‍රියාකාරී ක්ෂේත්‍රයන් ………………………………………5

- **6.1** උපදේශන සේවා අංශය ……………………………7
- **6.2** සංවර්ධන අංශය ……………………………………… 9
- **6.3** විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශය ……………...............14
- **6.4** කර්මාන්ත පුහුණු අංශය …………………………….. 24
- **6.5** මානව සම්පත් සහ පරිපාලන අංශය …………………....36
- **6.6** මූල්‍ය අංශය……………………………………….....44

ඉදිකිරිම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA)

1.0 දැක්ම

''ගෝලීය ප්‍රමිතින් හා සමාන්තරව දිවෙන විශ්වාසනීය හා යෝග්‍ය වූ ඉදිකිරීම් කර්මාන්තයන් ශ්‍රී ලංකාවේ බිහිකිරීම.''

2.0 මෙහෙවර

''ජාතික ඉදිකිරීම් ප්‍රතිපත්තිය හරහා රෙගුලාසි පැනවීම, ශක්‍යතා වර්ධනය සහ නැංවීම මඟින් තිරසාර ජාතික සංවර්ධනයට ඉවහල් වන්නාවූ ගෝලීයසහ දේශීය අවශ්‍යතාවයන් සපුරාලිය හැකි උසස් ප්‍රමිතීන් ප්‍රවර්ධනය තුළින් ශක්තිමත් මෙන්ම වෘත්තිය තත්ත්වයෙන් යුතු කර්මාන්තයන් සහතික වීම තුළින් ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය සඳහා උපායශීලි නායකත්වයන් ලබාදීම.''

3.0 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි දීර්ඝ වූ නිල නාමය මඟින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියෙහි සමස්ථ අරමුණු සහ ඉලක්කයන් පහත පරිදි පිළිඹිබු කරයි:

''ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා විධිවිධාන සැලැස්වීම පිණිසද, ඉදිකිරීම් කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීම, ලියාපදිංචි කිරීම, විධිමත් කිරීම සහ ප්‍රමිතිකරණය කිරීම සඳහා ද, ඉදිකිරීම් සම්බන්ධ ජාතික උපදේශන සභාව පිහිටුවීම සඳහාද, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය පිහිටුවීම සඳහා ද, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අරමුදල සහ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ අරමුදල පිහිටුවීම සඳහාද, කර්මාන්තයට අදාළ වෘත්තිකයන්, නිෂ්පාදනයන්, සැපයුම්කරුවන්, කොන්ත්‍රාත්කරුවන් සහ ශිල්පීන්ගේ දියුණුව සහ සුභසාධනය සඳහා විධිවිධාන සැලසීම පිණිසද, ඉදිකිරීම් කටයුතු වලට අදාළ ආරවුල් නිරවුල් කිරීම සඳහා ද, ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය තුළ මහජන ආරක්ෂාව තහවුරු කිරීම සහ ඒ හා සම්බන්ධිත හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.''

4.0 ප්‍රධාන අරමුණු

සිඩා(CIDA)හි ප්‍රධාන අරමුණු වන්නේ:

- ගරු අමාත්‍යතුමාගේ මග පෙන්වීම හා සමගාමීව ඉදිකිරීම් කර්මාන්තය පිළිබඳව ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට සහතික වීම.
- ඉදිකිරීම් අංශය තුළ තිරසාර වර්ධනය, ප්‍රතිසංස්කරණය සහ වැඩිදියුණුව තීව්‍ර කිරීම අරමුණු කොට මෙම කර්මාන්තයේ නිරතව සිටින පාර්ශවකරුවන්ට අවශ්‍ය නායකත්වය ලබාදීම.

- වරින් වර නියම කරනු ලබන ආකාරයට ඉදිකිරීම් කර්මාන්තයේ නියුතු පාර්ශවකරුවන් ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචිය අලුත් කිරීම.
- බලශක්තිය කාර්යක්ෂමව පරිභෝජනය කළ හැකි වන ආකාරයට ගොඩනැගිලි සහ ආකෘති සැළසුම් කිරීම සඳහා විශේෂ අවධානයන් යොමු කිරීමෙන් ඉදිකිරීම් කර්මාන්තයේ තිරසාර සංවර්ධනය ප්‍රවර්ධනය කිරීම.
- ඉදිකිරීම් කර්මාන්තයට සහ එහි වර්ධනයට අදාළ වන්නා වූ ඕනෑම කරුණක් පිළිබඳව පර්යේෂණ කටයුතු ප්‍රකාශනයට පත්කිරීම සහ ඒවා ව්‍යාප්ත කිරීම සහ නිසි පර්යේෂණයන් ප්‍රවර්ධනය කිරීම.
- අනෙකුත් අදාළ බලධාරින්ගේ උපදෙස් සමඟ ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රමිතීන් විධිමත්ව සකස් කිරීම සහ ඒවා අනිවාර්ය සහ ඉච්ඡානුගත ප්‍රමිතින් වශයෙන් වර්ගීකරණය කිරීම.
- බලධාරියා විසින් විධිමත්ව සකසා ඇති පරිදි පරිචයන්, ක්‍රියාපරිපාටින් සහ ක්‍රියාදාමයන් ක්‍රියාවට නැංවීම.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (සිඩා)හි කාර්යයන් පහත දක්වා ඇති පරිදි අංශ 4 ක් මඟින් පවත්වාගෙන යනු ලබන අතර සෑම අංශයක්ම අධ්‍යක්ෂවරයකුගේ ප්‍රධානත්වයෙන් පාලනය කෙරෙයි.

අ. උපදේශන සේවා අංශය

ආ. සංවර්ධන අංශය

ඇ.විද්‍යුත්යාන්ත්‍රික සේවා අංශය

ඈ. කර්මාන්ත පුහුණු අංශය

පනතෙහි දක්වා ඇති කාර්යයන් නියමිත කාලරාමුව තුළ ක්‍රියාත්මක කිරීම සහතික වෙමින් එම සියලුම කාර්යයන් ආවරණය වන පරිදි ඒකාබද්ධ සැළැසුම සකස් කර ඇත. 2016 වසරේ සිට 2022 දක්වා කාලය සඳහා පිළියෙල කර ඇති ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන ප්‍රතිපත්තිය, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත සහ ඒකාබද්ධ සැළසුම ආදිය අනුසාරයෙන් 2015 වසර සඳහා වාර්ෂික ක්‍රියාකාරි සැළසුම පිළියෙල කර ඇත.

ඉලක්කගත කාලය සමඟ 2015 වසරේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කළ කාර්යයන් සහ එක් එක් කාර්යයන්ගෙන් අපේක්ෂිත ආදායම සහ ලබා ඇති ප්‍රතිඵල එම අදාළ අංශයන් යටතේ සවිස්තරව දක්වා ඇත.

5.0 සංවිධානය

හැඳින්වීම

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි විධිවිධාන යටතේ ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනයට (ඉක්ටාඩ්) අනුප්‍රාප්තිකයා වශයෙන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (සිඩා) ස්ථාපිත කර ඇත. එහි මූලිකත්වය කළමනාකරණ මණ්ඩලයේ සභාපති විසින් දරනු ලබයි.

කළමනාකරණ මණ්ඩලය

	නම සහ පෞද්ගලික ලිපිනය	තනතුර	පත්වීම් දිනය
1	ඉංජිනේරු, සී.එච්.ඩී. තිසේරා 605, දේසිංහ මාවත, පැලවත්ත, බත්තරමුල්ල.	සභාපති	09.02.2015
2	ජී. වන්නිනායක මහතා නීතීඥ, 17/3,පිරිවෙන පාර, බොරලැස්ගමුව	සාමාජික	04.03.2015
3	පී.බී.එස්.සී. නෝනිස් මහතා අධ්‍යක්ෂ, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරය, කොළඹ 01.	සාමාජික	27.02.2015
4	මහාචාර්ය චිත්‍රා වෙඩික්කාර අංක31 A, ඇල්බට් පෙදෙස, දෙහිවල.	සාමාජික	09.02.2015
5	හේමන්ත අපොන්සු, වරලත් ප්‍රධාන සමීක්ෂණ අංක45/B, පාසල් මාවත, නාවල.	සාමාජික	09.02.2015
6	ඉංජිනේරු එල්.ඩබ්.පාලිත අධ්‍යක්ෂ (නාගරික පදිංචිකිරීම්) නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශය 'සෙත්සිරිපාය' බත්තරමුල්ල.	සාමාජික	16.02.2015
7	කලීල් කාසිම් මහතා අංක16, අනුලා පාර, කොළඹ 06.	සාමාජික	16.02.2015
8	මේජර් රංජිත් ගුණතිලක කළමනාකාර අධ්‍යක්ෂ, ෂන්කෙන් ලංකා (පුද්ගලික) සමාගම, අංක295, මාදම්පිටිය පාර, කොළඹ 14.	සාමාජික	16.02.2015
9	මහාචාර්ය ඒ.කේ.ඩබ්. ජයවර්ධන උප කුලපති මොරටුව විශ්වවිද්‍යාලය, කටුබැද්ද, මොරටුව.	සාමාජික	09.03.2015
10	ඉංජිනේරු ජේ.කේ.ලංකාතිලක ශ්‍රී ලංකා සංස්ථාපිත ඉංජිනේරු ආයතනය 27/B, උඩුමුල්ල, බත්තරමුල්ල. 14, ශේඩ් ග්‍රෝව් මාවත, කොළඹ08.	සාමාජික	20.11.2015

11	රුක්ෂාන් ජයවර්ධන මහතා අංක55, මල්පාර, කොළඹ 07.	සාමාජික	16.02.2015
12	රන්ජිත් හේවගේ මහතා ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමය, "ඉදිකිරීම් මැදුර", 350A, පන්නිපිටිය පාර, පැලවත්ත, බත්තරමුල්ල.	සාමාජික	20.11.2015
13	ඉංජිනේරු එච්.පී.ආර්. ගුණවර්ධන මහතා, ශ්‍රී ලංකා ඉංජිනේරු උපදේශකයින්ගේ සංගමය, 415, බෞද්ධාලෝක මාවත, කොළඹ 07.	සාමාජික	20.11.2015
14	ඉංජිනේරු කේ.පී.අයි.යූ. ධර්මපාල ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය, 120/15, විජේරාම මාවත, කොළඹ 07.	සාමාජික	20.11.2015

සභාපතිගේ ප්‍රධානත්වයෙන් යුතු අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ අංශ 4 ක් මගින් ඉක්ටාඩ් ආයතනයේ කාර්යයන් පවත්වා ගෙන යනු ලැබේ. සෑම අංශයක්ම අධ්‍යක්ෂවරයකුගේ ප්‍රධානත්වයෙන් යුතු වේ:

අ. උපදේශන සේවා අංශය

ආ. සංවර්ධන අංශය

ඇ. විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශය

ඈ. කර්මාන්ත පුහුණු අංශය

ආයතනයේ කාර්ය මණ්ඩලයේ පරිපාලනමය වගකීම සභාපතිතුමන්ගේ මග පෙන්වීම යටතේ ප්‍රධාන විධායක නිලධාරී අධ්‍යක්ෂ ජනරාල් විසින් දරනු ලබයි. මෙහෙයුම් අංශ වන මානව සම්පත් සහ පරිපාලන අංශය සහ මුදල් අංශය පිළිවෙලින් පරිපාලන කටයුතු සහ මුදල් කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරයෙකු යටතේ පාලනය වේ. (කරුණාකර ආංශික කාර්යයන් පිළිබඳ වගුව බලන්න.)

6.0 ක්‍රියාකාරී ක්ෂේත්‍රයන්

සංවිධාන ව්‍යුහය
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (සිඩා)

ජාතික උපදේශක සභාව — **සභාපති සහ අධ්‍යක්ෂ මණ්ඩලය සහ උප සභාපති**

අධ්‍යක්ෂ ජනරාල්

අධ්‍යක්ෂ (සංවර්ධන)

සංවර්ධන අංශය

අ. කර්මාන්ත සංවර්ධන

ආ. කළමනාකරණ

ඇ. තාක්ෂණ සහ පර්යේෂණ

අධ්‍යක්ෂ (උපදේශන සේවා)

උපදේශන සේවා අංශය

අ. උපදේශන සේවා

ආ. ඉදිකිරීම් ආර්ථික විද්‍යාව

අධ්‍යක්ෂ (පුහුණු)

කර්මාන්ත පුහුණු අංශය

අ. ශිල්පීය පුහුණු (NVQ අදියර iv සහ පහල)

ආ. පර්යේෂණ සහ සංවර්ධන

ඇ. කළමනාකරණ සහ අධීක්ෂණ මට්ටම පුහුණු (NVQ අදියර vii)

අධ්‍යක්ෂ(විද්‍යුත්යාන්ත්‍රික සේවා)

විද්‍යුත්යාන්ත්‍රික සේවා අංශය (ඊ.එම්.එස්.)

අ. කර්මාන්ත සඳහා පහසුකම් සැපයීම.

ආ. ඉදිකිරීම් උපකරණ පුහුණුව

ඇ. අරමුදල් කළමනාකරණය ආදායම සහ ගෙවීම්

අධ්‍යක්ෂ (මුදල්)

මූල්‍ය කළමනාකරණ අංශය

අ. ගිණුම්, අයවැය සහ තොරතුරු කළමනාකරණය

ආ. තොග සහ ප්‍රාග්ධන වත්කම් කළමනාකරණය

ඇ.අරමුදල් කළමනාකරණය ආදායම් සහ ගෙවීම්

අධ්‍යක්ෂ (මානව සම්පත් හා පරිපාලන)

මානව සම්පත් හා පරිපාලන අංශය

අ.මානව සම්පත

ආ. පාලන සහ නඩත්තු

ඇ. ප්‍රසම්පාදන කළමනාකරණය

*කාර්ය සාධන නිරීක්ෂණ ඒකකය

* නීති අංශය

* සම්පත් මධ්‍යස්ථානය

*අභ්‍යන්තර විගණන

6.1 උපදේශන සේවා අංශය

කොන්ත්‍රාත් කළමනාකරණය සහ පාලනය, උපදේශනය සහ ව්‍යාපෘති කළමනාකරණ සේවා සහ ගිවිසුම් ආරවුල් නිරාකරණය යන කරුණු වලට අදාළව අවශ්‍ය වන්නා වූ උපදේශන සේවා සඳහා වන ප්‍රතිපාදනයන්ගේ අවශ්‍යතාවය හැඳිනගැනීමත් සමගම උපදේශන සේවා අංශය විධිමත්ව සකස් කරන ලදි.

2015 වසර තුළදී උපදේශකයින්, කොන්ත්‍රාත්කරුවන්, ප්‍රතිපත්ති සම්පාදකයින් ආයෝජකයින් වැනි පාර්ශවකරුවන් සඳහා පහත ක්ෂේත්‍රයන් වෙත උපදේශන සේවා අංශය මඟින් තම සේවය ප්‍රදානය කොට ඇත.

1. උපදෙස් සැපයීම, උපදේශන සේවා ආරවුල් නිරාකරණය, ගිවිසුම් ප්‍රකාර ගැටළු සඳහා තීරකයින් පත්කිරීම.
2. ව්‍යාපෘති කළමනාකරණ සේවා සැපයීම.
3. ඉදිකිරීම් සංඛ්‍යාලේඛන විවරණතාව ප්‍රකාශනය සහ අලෙවිය.
4. සිඩා(CIDA) ප්‍රකාශන අලෙවිය සහ ප්‍රකාශයට පත්කිරීම.
5. ඉදිකිරීම් කර්මාන්තයට අදාළ මාතෘකා සම්බන්ධව සම්මන්ත්‍රණ පැවැත්වීම.
6. කාර්මික විගණනය සඳහා කාර්ය පරිපාටි ස්ථාපනය කිරීම සහ තත්ත්ව කළමනාකරණ විගණකයින් සඳහා අවශ්‍ය සුදුසුකම් සැකසීම. (නිමා කර නොමැත)
7. සුදුසුකම් සහිත පුද්ගලයින්ගේ නාම ලේඛනයක් සහ හඳුනාගත් ඉදිකිරීම් වැඩ සඳහා ලේඛනයක් පවත්වාගෙන යාම (නිමාකර නොමැත.)

1. ගිවිසුම්ගත කරුණු සම්බන්ධයෙන් හා උපදේශන සේවා සැපයීම, ආරවුල් නිරාකරණය, තීරකයින් පත්කිරීම.

මෙම අංශය මඟින් ටෙන්ඩර් ලේඛන පිළියෙල කිරීම, ගිවිසුම් පාලනය, ආරවුල් නිරාකරණය, සිඩා සූත්‍ර ක්‍රමය සහ සිඩා සම්මත ටෙන්ඩර් ලේඛන පිරිවිතර ආදිය සඳහා උපදෙස් සේවා සැපයීම සිදුකරයි. විශාල සංඛ්‍යාවක් වූ කොන්ත්‍රාත්කරුවන් මුහුණ දී ඇති කොන්ත්‍රාත් ලේඛණයන්ට අදාළ ගිවිසුම්ගත ආරවුල්, ගෙවීම් සහ ගිවිසුම් පරිපාලනය සම්බන්ධයෙන් මෙම අංශයේ උපදෙස් ලබාගෙන ඇත. මෙම අංශය විසින් 2015 වසර තුළ ඉහත සඳහන් කර ඇති ගැටලු වලට අදාළව උපදෙස් සේවා 360 ක් පමණ සංඛ්‍යාවක් ලබා දී ඇත. ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්තිකාර්යාංශය, විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වැනි ආයතන සඳහා විශේෂ උපදෙස් සේවා මෙමඟින් සපයනු ලබයි.

ගිවිසුම්වලට අදාළ පාර්ශවයන්ගේ ඉල්ලීම මත 2015 වසර තුළතීරකයින් 15 දෙනෙකු පත්කරන ලදි. තීරකයින්ගේ ලැයිස්තුව සිඩා (CIDA)වෙබ් අඩවියෙහි පළකර ඇත.

2. ව්‍යාපෘති කළමනාකරණ සේවා සැපයීම

රාජ්‍ය සංවිධාන තම ගොඩනැගිලි ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ සේවාවන් මෙම අංශය මඟින් ලබා ගනියි. ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා උපදෙස් සැපයීම, ටෙන්ඩර් ලේඛන පිළියෙල කිරීම, කොන්ත්‍රාත්කරුවන් සහ උපදේශකයින් තෝරා ගැනීම, ටෙන්ඩර් ඇගයීම, කොන්ත්‍රාත් පරිපාලනය සහ අන්තර් ගෙවීම් සහතික පිළියෙල කිරීමයන අංශයන් මෙම සේවාවන්ට අයත් වේ.

ව්‍යාපෘති කළමනාකරණ සේවාවන් සපයා ඇති ප්‍රධාන සංවිධාන පහතින් දැක්වේ.

- මධ්‍යම පරිසර අධිකාරිය.
- ප්‍රතිපත්ති සැළසුම් දෙපාර්තමේන්තුව භාවිතා කරන භූමිය.
- ශ්‍රී ලංකාවේ හස්ත කර්මාන්තය.
- ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව.
- ආයුර්වේද රෝහල, කයිතඩි.
- රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.
- ලංකා විදුලිබල මණ්ඩලය – රත්නපුර
- ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය.

3. ඉදිකිරීම් සංඛ්‍යාලේඛන ඇතුළත් සිඩා (CIDA)මාසික විවරණතාව ප්‍රකාශයට පත්කිරීම.

සිඩා ඉදිකිරීම් සංඛ්‍යාලේඛන විවරණය මාසිකව ප්‍රකාශයට පත් කෙරෙයි. මේ සඳහාඉදිකිරීම් අමුද්‍රව්‍ය මිල ගණන්, කම්කරු වේතන සහ යන්ත්‍රෝපකරණ කුළියට දීමේ මිල ගණන් ආදිය පිළිබඳව තොරතුරු රැස් කිරීම, පරීක්‍ෂා කිරීම සහ විශ්ලේෂණය කිරීම සිදුකරනු ලබයි. මෙම විවරණතාවන් ප්‍රධාන වශයෙන් භාවිතා කරන්නේ ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා භාවිතා කරන යෙදවුම්වල මිල ගණන් උච්චාවචනයන් ගණනය කිරීම සඳහාය. මෙම විවරණතාවන්ගේ පිටපත් 1565 ක් පමණ ඉදිකිරීම් කර්මාන්තයේ නියැළී සිටින පාර්ශවකරුවන්ට මෙම වසර තුළදී අලෙවි කර ඇත.

4. සිඩා (CIDA) ප්‍රමිතීන් සංශෝධනය සහ කෙටුම්පත් කිරීම.

වෘත්තියවේදීන්ගේ සංවිධානයන් විසින් නම් කරනු ලබන විද්වතුන්ගෙන් සමන්විත සිඩා (CIDA) ක්‍රියාකාරි කමිටුව වෙත සිඩා (CIDA) නව ප්‍රකාශනයන් එළිදැක්වීම සඳහා උපදෙස් සැපයීම/දැනට පවතින ප්‍රකාශන සංශෝධන ආදිය සඳහා බලය පවරා ඇත. සිඩා (CIDA) ප්‍රකාශන සංශෝධන පිළිබඳව නියෝග සහ තීරණ ලබාදීම, නවතම ප්‍රකාශනයන් එළිදැක්වීම සඳහා සුදුසු ක්ෂේත්‍රයන් හඳුනාගැනීම, සිඩා (CIDA) ප්‍රකාශනයන් සංශෝධනය/යාවත්කාලීන කිරීම සඳහා උප කමිටු පත්කිරීම සහ ඒ පිළිබඳව සිඩා අධ්‍යක්‍ෂ මණ්ඩලය සඳහා නිර්දේශ කිරීම වැනි දෑ ක්‍රියාකාරී කමිටුවේ කාර්යයන් වේ.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ විධිවිධානයන්ට අනුකූලව ඉදිකිරීම් කර්මාන්තය පිළිබඳ නීති සහ රෙගුලාසි මෙන්ම ප්‍රමිතීන් සැකසීම සඳහා කමිටු 3 ක් පත්කර ඇත.

අ. කාර්මික ප්‍රමිතීන්,නීති සහ රෙගුළාසි පිළිබඳ කමිටුව.

ආ. පාරිසරික සහ මහජනසෞඛ්‍ය ප්‍රමිතීන් පිළිබඳ කමිටුව.

ඇ. සදාචාරය, සමාජීය සහ සමාජීය වගකීම්හි ප්‍රතිපාදන පිළිබඳ කමිටුව.

මෙම කමිටු සඳහා පත්කිරීමට අදාළව විද්වත් කණ්ඩායම් වලින් නාමයෝජනා කැඳවා ඇත.

නව ලේඛණ කෙටුම්පත් කිරීම / පවතින ප්‍රකාශන සංශෝධනය වැනි කටයුතු සඳහා උප කමිටු පත්කර ඇත.

2015 වසරේදී සංශෝධනය කරන ලද ලේඛන,

- වාර ගැන්වූ විදිපිරි කොන්ක්‍රීට් කනු සඳහා පිරිවිතර -ICTAD/DEV/16

- ගොඩනැගිලි සහ සිවිල් ඉංජිනේරු වැඩ සඳහා ස්ථානීය පරීක්ෂාවන් සඳහා පිරිවිතර - ICTAD/DEV/17- සම්මත සිවිල් ඉංජිනේරු
- මිණුම්කරණ ක්‍රමවේදයන් – CESMMSL
- වාරිමාර්ග සහ ජලපවාහන වැඩ සඳහා පිරිවිතර -SCA/3/1

5. සම්මන්ත්‍රණ පැවැත්වීම

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ශක්‍යතා වර්ධනය කිරීම සඳහා හඳුනාගත් පහත සඳහන් මාතෘකා යටතේ සම්මන්ත්‍රණ 4 ක් මෙම අංශය මඟින් පවත්වා ඇත.

i. ව්‍යාපෘති කළමනාකරණය සහ කොන්ත්‍රාත් පරිපාලනය.
ii. කොන්ත්‍රාත් රක්ෂණය.
iii. සිඩා(CIDA)මිල උච්චාවචන සූත්‍රය සහ ගිවිසුම්ගත හිමිකම්.
iv. කරුණු අධ්‍යයනය කිරීම මඟින් මෙහෙයවනු ලබන ඉදිකිරීම් කර්මාන්ත ටෙන්ඩර් ඇගයීමට අදාළ රෙගුළාසි.

6. කාර්මික විගණනය

අධිකාරිය විසින් තත්ත්ව කළමනාකරණ විගණනයන් පිළිබඳ ලේඛනයක් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි විධිවිධාන වලට අනුකූලව කාර්මික විගණනයක් සිදුකිරීම සඳහා පවත්වා ගෙන යනු ලබයි. මේ කාර්යය සිදුකිරීමට කමිටුවෙහි සාමාජිකයින් පත් කිරීමට නාම යෝජනා වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය පිළිබඳ ජාතික ආයතනය, ශ්‍රී ලංකා ප්‍රමාණ සමීක්ෂකයින්ගේ ආයතනය (IQSSL), ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය (IESL), ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥයින්ගේ ආයතනය (SLIA), මධ්‍යම පරිසර අධිකාරිය, ශ්‍රී ලංකා ඉංජිනේරු උපදේශකයින්ගේ සංගමය, ශ්‍රී ලංකා හැටුම් ඉංජිනේරුවන්ගේ සංගමය (SSESL) සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය වෙතින් කැඳවා ඇත.

7. සුදුසුකම්ලත් පුද්ගලයින් ලියාපදිංචි කිරීම

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි විධිවිධානයන්ට අනුකූලව සුදුසුකම්ලත් පුද්ගලයින්ගේ නාමලේඛණයක් අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබයි. අදාළ වෘත්තිය ඒකකයක් නියෝජනය කරනු ලබන සහතිකලත් කමිටුව සුදුසුකම්ලත් පුද්ගලයින් ලියාපදිංචිකිරීමේ නිර්ණායකයන් වර්ධනය කිරීමේ කාර්යය සඳහා පත්කරනුලැබ ඇත.

8. බේරුම්කරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව

පුවත්පත් දැන්වීම් මඟින් 2015 දෙසැම්බර් මස පැවැත්වෙන ඉදිකිරීම් විනිශ්චය ඩිප්ලෝමාව සඳහා දෙවනවර බඳවා ගැනීමට අයදුම්පත් කැඳවා ඇත.

9. තේමා උද්‍යානය

සිඩා(CIDA)සමඟ ජාතික ඉංජිනේරු සංස්ථාව, NERDC යන ආයතනයන්ගේ එකමුතුවෙන් ගොඩනැගුනකි. ඉදිකිරීම් තාක්ෂණ තේමා උද්‍යානය මහ භාණ්ඩාගාරය විසින් අරමුදල් වෙන්කරනු ලබයි නම් තේමා උද්‍යානයේ II අදියර ආරම්භ කිරීමට නියමිතව ඇත.

6.2 සංවර්ධන අංශය

1.0 ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සඳහා ජාතික ලියාපදිංචි කිරීමේ සහ ශ්‍රේණිගත කිරීමේ පරිපාටිය.

කිසියම් කොන්ත්‍රාත්කරුවෙකුට කොන්ත්‍රාත්තුවක් පිළිබඳව නිසි වර්ගීකරණයක් නොකර විවිධ ප්‍රමාණයේ සහ වර්ගයේ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සඳහා පවතින සාමාන්‍ය හැකියාව හෙවත් ශක්‍යතාවය මැන බැලීමේ ක්‍රමවේදයන් ලියාපදිංචිය සහ වර්ගීකරණය කොන්ත්‍රාත්කරුගේ තාක්ෂණ හා මූල්‍ය තත්ත්වය පරීක්ෂා කිරීම මගින් ලියාපදිංචිය සහ වර්ගීකරණය කිරිම තීරණය කෙරේ.

2015 වසර තුළ නව ලියාපදිංචිකිරීම් 402 ක් නිකුත් කළ අතර කොන්ත්‍රාත්කරුවන් 254 දෙනෙකුගේ ශ්‍රේණි ඉහළ දමා ඇත. එසේම ලියාපදිංචිය අලුත් කිරීම් 241 ක් ද සිදුකරන ලදි.

ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් [ප්‍රධාන (ගොඩනැගිලි සහ සිවිල්), විශේෂ (විද්‍යුත් යාන්ත්‍රික), විශේෂ (නිමැවුම සහ අනෙකුත් විශේෂ කාර්යයන්)] සඳහා ලියාපදිංචි වීම පිණිස පාදක වන්නා වූ මාර්ගෝපදේශය සංශෝධනයන් මෙම වසර තුළදී නිමකර ඉදිකිරීම් ක්ෂේත්‍රයේ යහපත තකා එය 2015 වසරේ ජනවාරි මසදී සිදුකරනු ලබයි.

වෙබ් අඩවිය පාදක වූ කොන්ත්‍රාත්කරුවන්ගේ ලියාපදිංචිය පිළිබඳව මාර්ගත නිරීක්ෂණ ක්‍රමවේදය සහ ජාතික ඉදිකිරීම් කර්මාන්ත තොරතුරු පද්ධතිය.

මෙම ව්‍යාපෘතිය 2014 අගෝස්තු මස සිට ක්‍රියාවට නංවා ඇත.

මෙම ක්‍රියාවලිය මහබැංකු අරමුදල් යොදවා ක්‍රියාත්මක කර ඇත. මාගීගත ලියාපදිංචිය ඉදිකිරීම් කර්මාන්තයේ නියැලී සිටින පාර්ශවයන්ගේ දැඩි අවශ්‍යතාවයක්ව පැවතුනකි. එමගින් ගමනාගමනයට වැයවන කාලය මෙන්ම අනෙකුත් වියදම් ද අවම කර ගත හැක.

2014 අගෝස්තු මස සිට C1 ශ්‍රේණියේ කොන්ත්‍රාත්කරුවන් සඳහා මෙම ක්‍රමය යටතේ ලියාපදිංචිය අනිවාර්ය කර තිබේ. එමෙන්ම 2015 පෙබරවාරි මස සිට C2සහ C3ශ්‍රේණි සඳහාද මෙහි ලියාපදිංචිය අනිවාර්ය කර තිබේ.

ජාතික ඉදිකිරීම් කර්මාන්ත තොරතුරු පද්ධතිය (NCIIS)

ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම්හි ප්‍රගතිය නිරීක්ෂණය සහ වාර්තා කිරිම අරමුණු කොට වර්ධනය කරන ලද්දාවූ වෙබ් පෝටලය NCIIS වේ. එහි ඕනෑම අයෙකුගේ භාවිතය සඳහා අවශ්‍ය වන්නා වූ කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය සඳහා වන ජාතික දත්ත, ඉදිකිරීම් කර්මාන්ත රෙගුලාසි, ඉදිකිරීම් සඳහා අදාළ වන පර්යේෂණ සහ සංවර්ධනය ආදිය පිළිබඳ තොරතුරු අන්තර්ගතය. තවදුරටත් ජාත්‍යන්තර දත්ත පිළිබඳව දැනගැනීමට පාදක වන්නාවූ විශ්වාසනීය මාර්ගයන් වශයෙන්ද මෙය හැඳින්විය හැක. ඉදිකිරීම් කර්මාන්තයට දායක වන්නා වූ සාධකයන්හි උච්චාවචනයන්, රජයේ ව්‍යවස්ථාවන්, නීති සහ රෙගුලාසි මෙන්ම කොන්ත්‍රාත්කාර්ය සාධනය යනාදි කරුණු වලට අනුකූලව මෙය නිරන්තරයෙන් වර්ධනය කරනු ඇත.

මෙම වෙබ් පෝටලයේ සංවර්ධන කටයුතු වැඩි වශයෙන් සිදුකරන ලද්දේ වසර 2015 දීය.

මෙම පෝටලය අන්තර්ජාතික ඉදිකිරීම් ප්‍රජාවගේ ජාතික සේවාවන් වශයෙන් ශ්‍රී ලංකාවේ වඩාත් ඵලදායි හා කාර්යක්ෂම කර්මාන්තයන් පවත්වා ගෙන යාම පෙරදැරිව 2016 වසරේ පළමු කාර්තුව තුළ ජාලගත කිරීමට සැළසුම් කර තිබුණි.

2.0 ඉදිකිරීම් විශිෂ්ටතාවය සඳහා ඉක්ටාඩ් සම්මාන

ඉදිකිරීම් කර්මාන්තය සම්බන්ධයෙන් වෘත්තීමයභාවය සහ විශිෂ්ටතාවය ප්‍රවර්ධනය කරමින් 1990 වසරේදී ආරම්භ කෙරුණු වාර්ෂික සම්මාන ප්‍රදාන වැඩ පිළිවෙල 26 වන වරටත් අඛණ්ඩව 2015 වසරේදී පවත්වන ලදි. මෙම ඉදිකිරීම් සම්මාන ප්‍රදාන වැඩ පිළිවෙල මගින් ඉදිකිරීම් කළමනාකරණයේ විශිෂ්ඨ කුසලතාවය, තාක්‍ෂණික හා තත්ත්ව නිපුණතාවයෙන් යුත් උසස් වෘත්තීමයභාවය, නම්‍ය හා යෝග්‍ය තාක්‍ෂණය හඳුන්වාදීම හා වෘත්තීය කාර්මිකයින් පුහුණුව සඳහා සහභාගිත්වය ආදිය හඳුනාගෙන ඒවා ඇගයීමට ලක්කරනු ලැබේ.

2015 වසර තුළදී වැඩබිම් පරීක්‍ෂණ 39 ක් ද/කමිටු රැස්වීම් ද පවත්වා ඇත. ඉදිරිපත් කිරීම් 3 ක් වසර අගදී පැවැත්වූ අතර CIDA සහ NCASL එකමුතුවෙන් බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවෙහි පැවැත්වූ 2015 සම්මාන ප්‍රදානෝත්සවයේදී සම්මාන ප්‍රදානය කරන ලදි. දිවයින පුරා විහිදී සිටින ඉදිකිරීම් ශිල්පීන්ගේ සැඟවී ඇති කුසලතා උකහා ගැනීම සඳහා යොදාගෙන ඇති සංකල්පයන් වශයෙන් ඉදිකිරීම් සඳහා ජාතික සම්මාන ප්‍රදානය හඳුන්වා දිය හැක. මෙය පොදු උත්සවයක් බවට පත්කරමින් ඉදිකිරීම් කර්මාන්තය සඳහා විශාල දායකත්වයක් සැපයූ වෘත්තියවේදීන් සහ විශිෂ්ට පුද්ගලයින් හඳුන්වාදීම සඳහා වූ වැඩසටහනක් ලෙස සම්මාන ප්‍රදානෝත්සවය හඳුන්වා දිය හැක.

ඉදිකිරීම් විශිෂ්ටතාවය සඳහා ජාතික සම්මාන ප්‍රදානය – 2015
ජයග්‍රාහකයින් - ගොඩනැගිලි අංශය

සම්මාන වර්ගය	ව්‍යාපෘතිය සහ ලබන්නා	කොන්ත්‍රාත්කරු
විශිෂ්ටතා සම්මානය	කොළඹ නගරය තුල අඩු පහසුකම් සහිත වාසස්ථාන නැවත ස්ථාපිත කිරිම, අංක 194 සිරිල් සී. පෙරේරා මාවත, කොළඹ 14.	ඉන්ටර් නැෂනල් කන්ස්ට්‍රක්ෂන්ස් කොන්සෝටියුම් (පුද්) සමාගම.
විශිෂ්ටතා සම්මානය	සිටිසන් ඩිවලොප්මන්ට් බිස්නස් ෆයිනෑන්ස් (පුද්) සමාගම සඳහා කාර්යාල ගොඩනැගිල්ල, කොළඹ 10.	තුඩාවේ බ්‍රදර්ස් (පුද්) සමාගම
විශිෂ්ටතා සම්මානය	නෙස්ට්ලේ ලංකා (පුද්) සමාගමේ කුරුණෑගල කර්මාන්ත ශාලාව සඳහා භාණ්ඩ ගබඩා ගොඩනැගිල්ල.	ආර්.එන්.කන්ස්ට්‍රක්ෂන්ස් (පුද්)සමාගම.

ඉදිකිරීම් කාර්යසාධනය සඳහා ජාතික සම්මාන -2015
ජයග්‍රාහකයින් - සිවිල ඉංජිනේරු අංශය

කාර්ය සාධන සම්මාන

වර්ගය I –රු. මිලියන 1000 ඉන් වන වටිනාකම

අනු අංකය.	ව්‍යාපෘතියේ නම	කොන්ත්‍රාත්කරු
2	ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය -2 පුනරුත්ථාපනය සහ අලුත්වැඩියාව මහියංගන- දිඹුලාගල – දලුක්කන මාර්ගය (24.10 km – 72.807 km) මනම්පිටිය – අරලගංවිල – මාදුරුඔය මාර්ගය (0-3.0 km) කොන්ත්‍රාත් අංකය. RDA/RNIP/PRP2/PKGC/C15	කේ.ඩී.ඒ. වීරසිංහ සහ පුද්ගලික සමාගම.
3	තිහගොඩ – කඹුරුපිටිය – මාවරැල්ල – කොටපොල මාර්ගය (TKMK) (24+000 km – 67+000 km)	මාගා ඉංජිනේරු (පුද්) සමාගම.
6	පොලොන්නරුව – තඹල – සුන්ගවිල – සෝමාවතිය මාර්ගය පුනරුත්ථාපනය සහ අලුත්වැඩියාව (00+000 to 3+760km) කොන්ත්‍රාත් අංකය. RDA/DW/NCP/GOSL/2011/289)	ඉංජිනේරු සහ කොන්ත්‍රාත් උපදේශක(පුද්) සමාගම.

වර්ගය II–වටිනාකම පරාසය මිලියන 500 සහ මිලියන 1000

අනු අංකය	ව්‍යාපෘතියේ නම	කොන්ත්‍රාත්කරු
1	වේයන්ගොඩ ගුවන් පාලම් ව්‍යාපෘතිය සැළසුම, සැපයුම සහ ඉදිකිරීම කොන්ත්‍රාත් අංකය. RDA/SB/F/10/G	ඇක්සස් ඉංජිනේරු (පුද්) සමාගම
4	අම්පාර ජල සැපයුම් ව්‍යාපෘතිය (ටර්න්කි ව්‍යාපෘතිය) ඉදිකිරීම් සැළසුම සහ නිමකිරීම.	ෂන්කෙන් කන්ස්ට්‍රක්ෂන්ස් (පුද්)සමාගම.

වර්ගය III–වටිනාකම පරාසය මිලියන 100 සහ මිලියන 500

අනු අංකය	ව්‍යාපෘතියේ නම	කොන්ත්‍රාත්කරු
7	ගමන් පහසුව වැඩි දියුණු කිරීම සහ ඇස්පැල්ට් ඇතිරීම – පැකේජය 3 කොන්ත්‍රාත් අංකය. MCUDP/CMC/W/08	රාජ්‍ය සංවර්ධන සහ ඉදිකිරීම් සමාගම

වර්ගය IV –මිලියන 100 දක්වා

අනු අංකය	ව්‍යාපෘතියේ නම	කොන්ත්‍රාත්කරු
5	කොකාවිට ඉහළකුඩා ජල බලාගාර ව්‍යාපෘතිය, කොකාවිට, කලවාන. කොන්ත්‍රාත් අංකය. Terr/Kokaw/Upper/N/08/2009	නිම්නා එන්ටර්ප්‍රයිසස්

3.0 සේවාදායකයන්ගේ පැමිණිලි විසඳීම

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා ජාතික ඉදිකිරීම් සංගමය (NCASL)සහ (CIDA)යන ආයතනයන්ගේ සාමාජිකයින්ගෙන් සමන්විත මූලික විමර්ශන මඩුල්ලක් කොන්ත්‍රාත්කරුවන්ගේ පැමිණිලි විමර්ශනය කිරීම සඳහා ස්ථාපිත කර ඇත.

වසර 2015,

විස්තරය	ආරවුල්2015
ඉක්ටාඞ් තොරතුරු සඳහා පමණක්	04
කොන්ත්‍රාත්කරුවන්ගෙන් නිදහසට කරුණු විමසීම සහ ඒ සඳහා ඔවුන්ගෙන් ලැබෙන්නා වූ පිළිතුරු	11
විසඳා අවසන් ගැටලු	09
ඉදිරියේදී සිදුකිරීමට තිබෙන්නා වූ පරීක්ෂණ	05
එකතුව	29

4.0 සිඩා ජර්නලය – 2015

2015 වසර සඳහා වන සිඩා ජර්නලය 2015 දෙසැම්බර් මස පවත්වන ලද ඉදිකිරීම් සඳහා වන ජාතික සම්මාන ප්‍රදානෝත්සවයේදී ප්‍රකාශයට පත්කොට එළිදක්වන ලදි. ඉදිකිරීම් කර්මාන්තයට අදාළ ගැටලු පිළිබඳ තොරතුරු බෙදාහැරීම මෙහි අරමුණ වේ. ඉදිකිරීම් කර්මාන්තයේ වර්ධනයට ඉවහල් වන්නා වූ ලිපි සහ තොරතුරු මෙමඟින් ප්‍රකාශයට පත් කෙරෙයි.

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියැදෙන්නන් හා වෘත්තිකයන්ගේ උපරිම සහයෝගයෙන් හා කැපවීමෙන් ඉක්ටාඞ්/සිඩා ඉතිහාසයේ පස්වන වරටත් මෙම ජර්නලයේ 13 වන ප්‍රකාශය ජාත්‍යන්තරව පිළිගත් ජර්නලයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලදි.

5.0 සිඩා තොරතුරු තාක්ෂණ පද්ධතිය

පහත සඳහන් අත්‍යවශ්‍ය අංගයන්ගෙන් සමන්විතව තොරතුරු තාක්ෂණ පද්ධතිය සහ වෙබ් අඩවිය සතුටුදායක මට්ටමින් පවත්වාගෙන යනු ලැබේ.

1. කොන්ත්‍රාත්කරුවන්ගේ දත්ත පද්ධතිය සඳහා "Save" & "Print" යන විකල්පයන් හඳුන්වාදීම.
2. ජාලගත කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම සඳහා මාර්ගගත ගෙවීම් පද්ධතියට අදාළ වන ව්‍යාපෘතිය නිම කිරීම.
3. ලේඛණ සංරක්ෂණ පද්ධතිය නිමකිරීම සහ නොකඩවා ලේඛණාරක්ෂණය කිරීම සහ අලුත් ලිපිලේඛන පද්ධතියට ඇතුළත් කිරීම. (සංවර්ධන අංශයෙහි ලියාපදිංචි ගොනු).
4. කොන්ත්‍රාත්කරුවන් සඳහා ජාලගත නිරීක්ෂණ පද්ධතියට අදාළ ව්‍යාපෘතිය නිමකිරීම.(C1,C2&C3) සහ දැනටමත් C1ශ්‍රේණියේ කොන්ත්‍රාත්කරුවන්ගෙන් 50% පමණ මෙම පද්ධතියේ ලියාපදිංචි වී ඇත.
5. 2014 වසරෙහි ඇරඹි ඉදිකිරීම් කර්මාන්ත දත්ත බැංකු ව්‍යාපෘතිය NCIIS (ජාතික ඉදිකිරීම් කර්මාන්ත තොරතුරු පද්ධතිය)නොකඩවා දෙසැම්බර් මස අග දක්වා ක්‍රියාත්මක කිරීම සහ එහි ව්‍යාපෘති ඉලක්කයන්ගේ 85% ක් පමණ නිමකිරීම.
6. ඉක්ටාඞ්/සිඩා හි අන්තර්ජාල පහසුකම නිරීක්ෂණය/පාලනය කිරීම සඳහා දත්ත සර්වරයන් (Data Servers)සංවර්ධනය කිරීම සහ ඒ සඳහා අවශ්‍ය ජාල සැකසුම සිදුකිරීම.
7. සිඩා හි තොරතුරු තාක්ෂණ අංශයන් පිහිටුවා ඒ සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය පත්කර ගන්නා ලදි.

8. ඉක්ටාඩ් වෙබ් අඩවිය සිංහල, ඉංග්‍රීසි, දෙමළ යන භාෂා ත්‍රිත්වයටම පරිවර්තනය කර ප්‍රදර්ශනය කිරිම.
9. එදිනෙදා කටයුතුවල නඩත්තුව සහ සිඩා වෙබ් අඩවිය යාවත්කාලීන කිරිම.
10. සිඩා හි සියලුම ක්‍රියාකාරි අංශයන්හි දත්ත සන්නිවේදනයේ සහ කළමනාකරණයේ මනා ක්‍රියාකාරීත්වය සඳහා අවශ්‍ය සියලුම දෘඩාංග ඒජනයන් මිලදී ගැනීම.

6.0 2015 වසරේ පැවැත්වූ සම්මන්ත්‍රණ/සමුළු/වැඩමුළු

මෙම වසර තුළදී පහත සඳහන් වැඩසටහන් සාර්ථකවම පවත්වන ලදි.

- ජල රැඳවුම් ආකෘති සහ දියවරන තාක්‍ෂණයේ සැළසුම් සහ ඉදිකිරීම් අංශයන් පිළිබඳ වැඩමුළුව.–2015 පෙබරවාරි 13
- ඉදිකිරීම් වැඩබිම්හි ආරක්‍ෂාව පිළිබඳ වැඩමුළුව – 2015 මාර්තු 12
- ඉදිකිරීම් කර්මාන්තයට අදාළ පාරිසරික නීති රෙගුළාසි පිළිබඳ වැඩමුළුව - 2015 අප්‍රේල් 02
- මාර්ග ඇතිරීමේ තාක්‍ෂණය පිළිබඳ සමුළුව – 2015 මැයි 21
- ජාලගත "ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේ කාර්ය සාධන නිරීක්‍ෂණ පද්ධතිය" පිළිබඳ වැඩමුළුව – 2015 ජූනි 10
- පාර්ශවකරුවන් සඳහා ජාතික ඉදිකිරීම් කර්මාන්ත පද්ධතිය පිළිබඳ පොදු සංසදය – 2015 ජූලි 23
- නිවැරදි වැඩබිම් පරිචයන් පිළිබඳ වැඩමුළුව – 2015 අගෝස්තු 06
- අඛණ්ඩ ශක්‍යතා වර්ධනය පිළිබඳ වැඩසටහන් – ඉදිකිරීම් කර්මාන්තය සඳහා (තෙවන රැස්වීම) 2015 අගෝස්තු 13, 2015 සැප්තැම්බර් 11 සහ 2015 නොවැම්බර් 13
- ගංගාවල වැලි භාවිතය පිළිබඳ ඉදිකිරීම් කර්මාන්ත පරිචයන් සංශෝධනය කිරීම සඳහා වන වැඩමුළුව සහ ඒ සඳහා විකල්පයන් හඳුන්වා දීම.–2015 සැප්තැම්බර් 28
- විදේශීය කොන්ත්‍රාත්කරුවන් තාවකාලිකව ලියාපදිංචි කිරීම සඳහා වැඩමුළුව – 2015 ඔක්තෝබර් 08
- විදේශයන්හි ක්‍රියාත්මක කිරීමට සහාය ලබාදීම සම්බන්ධ වැඩසටහන් – 2015 නොවැම්බර් 12

මෙම වැඩසටහන්/වැඩමුළු පැවැත්වීම සිදුකරනු ලබන්නේ ඉදිකිරීම් කර්මාන්තයට අදාළ තොරතුරු ව්‍යාප්ත කිරීමේ අරමුණු පෙරදැරි කර ගෙනය.

6.3. විද්‍යුත් යාන්ත්‍රික සේවාඅංශය

විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශයෙහි මෙහෙවර වන්නේ, ඉදිකිරීම් කර්මාන්තයෙහි සැලකිය යුතු ඵලදායිතාවයන් ළඟාකර ගැනීම සඳහා එම කර්මාන්තයේ නියැළී සිටින ශ්‍රම බලකායෙහි වර්ධනය අරමුණු කොට ඉදිකිරීම් යන්ත්‍රෝපකරණක්‍රියාකරවීම, නඩත්තුව සහ ඒවා කළමනාකරණය කිරීමට අදාළ වන දැනුම සහ කුසලතාවයන් ලබා දීමයි.

විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශයෙහි අරමුණු වන්නේ :

1. ඉදිකිරීම් යන්ත්‍රෝපකරණකාර්මිකයින් සහ ක්‍රියාකරුවන්හට තමතමන්ගේ කාර්යය කාර්යක්ෂමව සහ ඵලදායිතාවයෙන් යුක්තව කරගෙන යාමට අවශ්‍ය හැකියාවන් නංවාලීම.

2. ඉදිකිරීම් යන්ත්‍රෝපකරණඅධීක්ෂණ සහ කළමනාකරණකාර්ය මණ්ඩලයට තම රාජකාරිය කාර්යක්ෂමතාවයකින් සහ ඵලදායිතාවයකින් යුතුව ඉටුකිරීමට හැකිවන අයුරින් ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කිරීම.

3. ඉදිකිරීම් යන්ත්‍රෝපකරණභාවිතය වැඩිදියුණු කරමින් ඒවා භාවිතාකරන්නන් අතර නිසියාකාර නඩත්තු පරිචයන් ඇති කිරීම මඟින් අලුත්වැඩියා පිරිවැය සහ ඒ සඳහා වැයවන කාලය අවම කර ගැනීම.

4. ඉදිකිරීම් කර්මාන්තයට අවතීරණ වන ඉදිකිරීම් යන්ත්‍රෝපකරණකාර්මිකයින් සහ ක්‍රියාකරුවන්හට නිසියාකර මූලික පුහුණුවක් ලබාදීම.

5. ඉදිකිරීම් පුහුණු මධ්‍යස්ථානයේ ආදර්ශ වැඩමුළු සඳහා අවශ්‍ය පුහුණුව ලබාදීම මඟින් ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියා වැඩබිම්වල තත්ත්වය ඉහළ නැංවීම සඳහා දායක වීම.

6. ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් උපකරණ කාර්මිකයින් සහ ක්‍රියාකරුවන්ගේ සමාජ පිළිගැනීම ප්‍රවර්ධනය කිරීම.

සිඩා (CIDA)හි විද්‍යුත් යාන්ත්‍රික සේවා අංශය කොටස් දෙකකින් සමන්විත වේ. උදා: ක්‍රියාකරු පුහුණු විදුහල (OTC) සහ ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC)



6.3.1 ක්‍රියාකරු පුහුණු විදුහල

දැක්ම :

"ඉදිකිරීම් කර්මාන්තයේ නියැළී සිටින සියළුම පුහුණුකරුවන් සහ සේවාදායකයින් සඳහා ප්‍රමුඛ සේවාවක් ලබාදීමට කැපවුණු ශක්තිය තුළින් සහ ඉදිකිරීම් කර්මාන්තයට අවශ්‍ය නිපුණ ශ්‍රම බලකායන් සැපයීම මගින් වඩාත් ප්‍රමුඛතාවයකින් යුතු රාජ්‍ය සංවිධානය බවට පත්වීම"

මෙහෙවර:

"ඉදිකිරීම් කර්මාන්තයේ කුසළතා බෙදාදීම සහ මෙහෙයුම් කටයුතු ලෙසද දැනුම, නඩත්තුව හා ඉදිකිරීම් උපකරණ කළමනාකරණය තුළින් දක්ෂ ශ්‍රම බලකායන් ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ බිහිකිරීම සහ එමගින් ඉදිකිරීම් නිෂ්පාදන ඵලදායිතාවයේ මිනිය හැකි වර්ධනයක් ලබා ගැනීම."

අරමුණු:

- ස්ථාපිත ජාතික නිපුණතා තත්ත්වයට සමවන අයුරින් ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් පුහුණු කරවීම.
- යන්ත්‍ර සහ අධීක්ෂණ කළමනාකරණය පිළිබඳව පාඨමාලාවන් පැවැත්වීම.
- ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් සඳහා ජාතික වෘත්තීය පරීක්ෂණ සහ NVQ පරීක්ෂණ පැවැත්වීම.
- ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරවන්නන්හට තම කාර්ය කාර්යක්ෂමව සහ ඵලදායිතාවයෙන් යුතුව ඉටුකිරීම සඳහා ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කිරිම.
- ඉදිකිරීම් කර්මාන්ත සඳහා යන්ත්‍ර සහ උපකරණ කුළියට දීම.
- රාජ්‍ය ඉදිකිරීම් ව්‍යාපෘතීන්හි පාර්ශවකරුවකු වශයෙන් නවක ක්‍රියාකරුවන්ට අත්දැකීම් ලබාගැනීම මෙන්ම ජාතික සංවර්ධනයට දායක වීම.

හැඳින්වීම

ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ ආයතනය මගින් රෝලර්, ට්‍රැක්ටර්, ලෝඩර්, එක්කැවේටර්ස්, මෝටර් ග්‍රේඩර්ස් වැනි ඉදිකිරීම් උපකරණ පිළිබඳ පුහුණු කිරීම් සිදුකරන අතර ඒවායේ ආරක්ෂාව, මූලික නඩත්තුව හා ක්‍රියාකරවීමේ තාක්ෂණය පිළිබඳව විශේෂ අවධානය යොමු කරයි. OTC අංශය ඉදිකිරීම් උපකරණ 56 ක ඇනියකින් ද ප්‍රමාණවත් පුහුණු නිලධාරීන් හා මාර්ගෝපදේශකයන්ගෙන් ද යුක්ත වේ.

පුහුණුවන්නන්ගේ පුහුණු කාලයෙන් 70% ක් ප්‍රායෝගික පුහුණුව සඳහා ද 30% ක් න්‍යායික පුහුණුව සඳහා ද වෙන්කර ඇත. සමහර ඉදිකිරීම් උපකරණ කුළියට දීම තුළින් ආදායම් උපදවන අතරම පුහුණුවන්නන්ට රැකියා අවස්ථා ද එමගින් ලබා දෙයි. OTC පුහුණු පාඨමාලාවන් ආයතනික පුහුණුව මෙන්ම රැකියා පුහුණුව යන දෙඅංශයෙන්ම සමන්විතය. ආයතනික පුහුණුව නිමකරන ලද පුහුණුකරුවෙකු අවම වශයෙන් තුන්මසක පුහුණුවක් ක්‍රියාකරු පුහුණු කිරීමේ මධ්‍යස්ථානයෙන්

පුහුණු ලබාගැනීමෙන් අනතුරුව ඔහු හෝ ඇය ජාතික වෘත්තිය සුදුසුකම් සඳහා හිමිකම් දරයි. (NVQ)ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරුවන් සඳහා ජාතික වෘත්තීය පරීක්‍ෂණ සහ NVQපරීක්‍ෂණ පැවැත්වීම සඳහා ජාතික ආධුනිකත්ව සහ කර්මාන්ත පුහුණු අධිකාරිය (NAITA)විසින්ක්‍රියාකරු පුහුණු විදුහල**(OTC)**පිළිගෙන ඇත.

වර්තමානයේ දී ක්‍රියාකරු පුහුණු විදුහල(OTC)මඟින් පවත්වාගෙන යනු ලබන පාඨමාලාවන්,

1. ප්‍රාථමික පුහුණුව
    1.1 මූලික ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ නඩත්තුව.
2. කුසලතා වර්ධනය
    2.1 සැහැල්ලු ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ
    2.2 ඩම්ප් ට්‍රක් (ගොඩගසන ට්‍රැක්ටර්)
    2.3 ෆාම් ට්‍රැක්ටර්
    2.4 සෙල්ෆ් ප්‍රොපෙල්ඩ් වයිබ්‍රේටිං රෝලර්
3. පස් ඉවත්කරන උපකරණ මූලික මොඩියුල
    3.1 ක්‍රෝලර් ට්‍රැක්ටර්
    3.2 වීල් ලෝඩර්
    3.3 මෝටර් ග්‍රේඩර්
    3.4 හයිඩ්‍රොලික් එස්කැවේටර්
    3.5 බැකෝ ලෝඩර්
    3.6 ස්කිඩ් ස්ටියර් ලෝඩර්
4. විශේෂිත උපකරණ
    4.1 මොබයිල් ක්‍රේන්
    4.2 ප්ලාන්ට් ට්‍රාන්ස්පෝටර්
    4.3 ෆෝක් ලිෆ්ට් ට්‍රක්
    4.4 ට්‍රක් මවුන්ඩ් ක්‍රේන්
5. වෘත්තීය පරීක්‍ෂණ
    5.1 ජාතික වෘත්තිය පරීක්‍ෂණ
    5.2 NVQ පරීක්‍ෂණ

❖ **පාරිභෝගික අවශ්‍යතා මත සකස් කළ පුහුණු වැඩසටහන්**

මෙම පාඨමාලාවන් 2014 සහ 2015 යන වසර වලදී විශ්වවිද්‍යාල සිසුන් සඳහා සකසන ලදි. OTC මඟින් පවත්වනු ලබන සියළුම පාඨමාලා සඳහා ගාස්තු අයකරන අතර සමහර පාඨමාලා සඳහා පාසල් හැරගිය අය, රැකියා වියුක්ත තරුණයන් අතර වැඩි ඉල්ලුමක් පවතී.

සම්මන්ත්‍රණ /වැඩමුළු

ඉදිකිරීම් කර්මාන්තයේ ඉල්ලුම මත උපකරණ කළමනාකරණය සහ අධීක්ෂණ වැඩසටහන් සහ කුසලතා පරීක්ෂණ OTC මඟින් පවත්වනු ලබයි. වැඩි ප්‍රතිලාභසහ OTC හි කාර්යයන් විවිධාංගිකරණය අරමුණු කොට 2014 වසරේදී රියැදුරන් සඳහා විශේෂ වැඩමුළුවක් ද පවත්වන ලදි.

2015 වසරේදී එක් එක් පුහුණු පාඨමාලාවන්ට අදාළ පුහුණුවන්නන්ගේ ඉලක්කගත ප්‍රතිඵල සහ ජයග්‍රහණයන් පහත වගුවේ දක්වා ඇත.

	පුහුණු වැඩසටහන	අපේක්ෂිත ප්‍රමාණය		සහභාගි වූ ප්‍රමාණය	
		වැඩසටහන් ගණන	සහභාගිවූ ගණන	වැඩසටහන් ගණන	සහභාගිවූ ගණන
1.0	**ප්‍රාථමික පුහුණුව**				
	1.1 මූලික ඉදිකිරීම් උපකරණ නඩත්තුව	26	710	23	543
2.0	**කුසලතා සංවර්ධනය**				
	2.1 සැහැල්ලු උපකරණ	04	13	--	--
	2.2 ට්‍රැක්ටර්	ඉල්ලුම මත	ඉල්ලුම මත	02	03
	2.3 සෙල්ෆ් ප්‍රොපෙල්ඩ් රෝලර්	06	18	06	20
	2.4 ඩම්ප් ට්‍රක්	04	08	01	01
3.0	**පස් ඉවත්කරන උපකරණ මූලික මොඩියුල**				
	3.1 ග්‍රෝලර් ට්‍රැක්ටර්	04	10	04	13
	3.2 වීල් ලෝඩර්	06	30	03	18
	3.3 මෝටර් ග්‍රේඩර්	09	60	10	65
	3.4 හයිඩ්‍රොලික් එස්කැවේටර්	09	90	12	108
	3.5 බැකෝ ලෝඩර්	13	200	12	139
	3.6 ස්කිඩ් ස්ටියර් ලෝඩර්	09	27	03	05
4.0	**විශේෂිත උපකරණ**				
	4.1 මොබයිල් ක්‍රේන්	07	20	05	18
	4.2 ප්ලාන්ට් ට්‍රාන්ස්පෝමර්	10	31	08	22
	4.3 ෆෝක් ලිෆ්ට් ඔපරේටර්	10	30	07	22
	4.4 ටුන්ග් මවුන්ටඩ් ක්‍රේන්	09	45	--	--
	එකතුව	**126**	**1292**	**96**	**977**

(වගුව 5.3.5)

ඉදිකිරීම් උපකරණ කුළියට දීම

ක්‍රියාකරු පුහුණු විදුහල මගින් සපයනු ලබන අමතර සේවාවකි. ඉදිකිරීම් උපකරණ කුළියට දීම එමගින් අමතර වැඩි ආදායමක් විදුහලට ලබා දෙයි. අවශ්‍ය යන්ත්‍ර ප්‍රමාණය පුහුණු කටයුතු සඳහා වෙන් කිරීමෙන් අනතුරුව ඉතිරිව තිබේ නම් කුළී පදනම මත යන්ත්‍ර සූත්‍ර කොන්ත්‍රාත්කරුවන්ට සහ රාජ්‍ය ආයතනවලට සැපයීමේ ක්‍රියාවලියට ප්‍රමුඛත්වයක් දෙනු ලබයි.

ඉදිකිරීම් උපකරණ ක්‍රියාකරු පුහුණුව - නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශය

දකුණු පළාතේ රැකියා විරහිත තෝරාගත් තරුණ තරුණියන් වෙනුවෙන් විශේෂ පුහුණු වැඩසටහනක් ඔවුන්ගේ හැකියාවන් වර්ධනය කිරීම උදෙසා පවත්වන ලදි. මෙම වැඩසටහන සඳහා නොමිලයේ නවාතැන් පහසුකම්, ආහාර සහ ප්‍රවාහන පහසුකම් සපයන ලදි. මේ යටතේ පුහුණුවන්නන් 40 දෙනෙකු තමාගේ ප්‍රමුඛත්වය මත ඉදිකිරීම් උපකරණ පුහුණුව ලබාගන්නා ලදි.

2015 වසර තුළ ක්‍රියාකරු පුහුණු විදුහල මගින් උපයාගන්නා ලද ආදායම

රැකියා වර්ගය	ආදායම (රු.)
පුහුණු පාඨමාලාවන්	14,917,210.95
යන්ත්‍ර සූත්‍ර කුළියට දීම	1,294,366.85
වෘත්තීය පරීක්ෂණ	16,000.00
ක්‍රියාකරුගේ හැඳුනුම්පත	290,750.00
නිදනශාලා ගාස්තු	6,833.33
වෙනත්	366,989.54
එකතුව	**16,892,150.67**

6.3.2 ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය

සිඩා(CIDA) ආයතනයේ යාන්ත්‍රික පුහුණුඅංශය වන ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය (CETRAC), බත්තරමුල්ල පැලවත්තේ ඩී.පී.විජේවර්ධන මාවතේ අංක 17 දරන ස්ථානයේ පිහිටා ඇත. ඉදිකිරීම් උපකරණ නඩත්තුව අලුත්වැඩියාව සහ කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලාවන් පැවැත්වීමට මෙම අංශය හොඳින් සකස් කර තිබේ. තවද ව්‍යාපෘති සහ නඩත්තු කළමණාකරුවන්, යාන්ත්‍රික ඉංජිනේරුවන්, වැඩසටහන් අධීක්ෂකයින්, ජ්‍යෙෂ්ඨ කාර්මිකයින්, කාර්මිකයින්, යන්ත්‍ර සහායකයින් සහ පාසල් හැරගිය අයහට මෙහි පුහුණු පාඨමාලා පැවැත්වේ.

- **CETRAC ඉදිකිරීම් යන්ත්‍රෝපකරණ පුහුණු මධ්‍යස්ථානය මගින් පවත්වනු ලබන පුහුණු වැඩසටහන්**

1996 ඔක්තෝබර් සිට 2001 සැප්තැම්බර් දක්වා පැවති තාක්ෂණ සහයෝගිතා කාලපරිච්ඡේදයේදී ජපාන විශේෂඥයින්ගේ සහයෙන් ඉදිකිරීම් උපකරණ නඩත්තුව සඳහා වූ CETRAC පුහුණු වැඩසටහන් දියුණු කරන ලදි. CETRAC මූලිකවම ඉදිකිරීම් උපකරණ නඩත්තු සහ කාර්මික ශිල්පීන්, අධීක්ෂකයන් හා ඉංජිනේරුවන් සඳහා පුහුණුව ලබාදේ. මෑතකදී ඉක්ටාඩ් විසින් CETRAC හි ගොඩනැගිලි සේවා ඉංජිනේරු පුහුණු වැඩසටහන් ආරම්භ කර සාර්ථකව පවත්වාගෙන යනු ලබයි.

- **කර්මාන්තයට පිවිසෙන නවකයන් සඳහා පැවැත්වෙන පාඨමාලාවන්**

ඉදිකිරීම් කර්මාන්තයේ ඉහළ ඉල්ලුමක් පවතින්නා වූ මිනිස් සම්පතෙහි අවශ්‍යතාවය සපුරාලමින්, තරුණයින්ගේ රැකියා වියුක්තියට පිළියමක් වශයෙන් කලින් පාසල් හැරගිය අය සඳහා වෘත්තිය පුහුණු පාඨමාලා වැඩි ප්‍රමාණයක් පැවැත්වීමට හා වැඩිදියුණු කිරීමට තීරණය කරන ලදි. ඒ අනුව, 2015 වසරේදී පහත සඳහන් පාඨමාලාවන් පවත්වන ලදි.

1.ඉදිකිරීම් උපකරණ යාන්ත්‍රික පුහුණු පාඨමාලාව

මූලික යාන්ත්‍රික පුහුණු පාඨමාලාව ජාතික ආධුනිකත්ව මණ්ඩලය සහ ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු අධිකාරියේ සහයෝගය ඇතිව පවත්වනු ලබයි. එය CETRAC හි මාස 9 ක ආයතනික පුහුණුවක් සහ මාස 27 ක කර්මාන්තය තුළ රැකියා පුහුණුවකින් ද සමන්විත අවුරුදු 3 ක පාඨමාලාවකි. මෙම පාඨමාලාව සඳහා සුදුසුකම්ලාභීන් වන්නේ අ.පො.සසාමාන්‍ය පෙළ සමත් පාසල් හැරගිය අය වේ. මෙම පාඨමාලාව මගින් නවීන ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියාව සහ නඩත්තුව පිළිබඳ සියළු කරුණු ආවරණය කරයි. මීට වාර්ෂිකව පුහුණුවන්නන් 60 ක් බඳවා ගනියි.

පුහුණු කාලය අතරතුර නොමිලයේනවාතැන් පහසුකම්, පාඨමාලා සටහන්, වැඩමුළු පහසුකම්, නිල ඇඳුම්, ආරක්ෂණ උපකරණ, මෙවලම් ආදිය මෙම පුහුණුවන්නන් සඳහා ලබාදෙනු ඇත. සෑම වසරකට විවිධ කාණ්ඩවලට අයත් පුහුණුකරුවන් 100 ට ආසන්න ප්‍රමාණයක් CETRAC හි මෙම ආයතනික පුහුණුව ලබන අතර මේ සඳහා රු.මි. 10 ක් පමණ වන එහි සියලු බරපැන රජයට දැරීමට සිදුවෙයි. මෙම වැඩසටහනෙන් පුහුණුව ලැබූවන් සියල්ලම වාගේ දේශීයව හා විදේශීයව රැකියා අවස්ථා ලබාගෙන ඇත. ඔවුන්ගෙන් ඇතැමෙක් ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියාව හා නඩත්තු කිරීම සඳහා තමන්ගේ වැඩබිම් පිහිටුවාගෙන ඇත.

2. සේවකයන්ගේ කුසළතා වර්ධනය සඳහා වන වැඩිදුර පුහුණු පාඨමාලා

ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියාව, නඩත්තු කිරීම, කළමනාකරණය හා සම්බන්ධ කාර්මික ශිල්පීන්ගේ, අධීක්ෂකයන්ගේ හා කළමණාකරුවන්ගේ තාක්ෂණික දැනුම ඉහළ දැමීම සඳහා වැඩිදුර පුහුණු පාඨමාලා සැලසුම් කර ඇත. සෑම පුහුණුවන්නෙකුටම අවධානය යොමු කිරීම සඳහා බඳවා ගැනීම පුහුණුවන්නන් 10 ට සීමා කොට ඇත. මෙම පාඨමාලා හැදෑරීම සඳහා අදාළ ක්ෂේත්‍රයේ ප්‍රමාණවත් පළපුරුද්දක් අවශ්‍ය වේ.

3. කණිෂ්ඨ කාර්මික ශිල්පීන් සඳහා පුහුණු වැඩ සටහන (අදියර2)

ඉදිකිරීම් උපකරණ අලුත්වැඩියා කරන ස්ථාන වල සේවය කරන කණිෂ්ඨ කාර්මික ශිල්පීන්ගේ දැනුම හා කුසළතාවය වැඩිදියුණු කිරීම සඳහා මෙම වැඩසටහන සැලසුම් කර ඇත. මෙම පාඨමාලාව හැදෑරීම සඳහා අවුරුදු 2 ත් 5 ත් අතර පළපුරුද්දක් අවශ්‍ය වේ. සේවායෝජකයන්ට ඔවුන්ගේ පුහුණු

අවශ්‍යතා මත පදනම්ව ඔවුන්ගේකාර්මික ශිල්පීන් ඕනෑම තෝරාගත් මොඩියුලයක් පුහුණු වීම සඳහා යෙදවීම පිණිස මෙම පුහුණු පාඨමාලාව විවිධ මොඩියුලයන්ට බෙදා ඇත. හයිඩ්‍රොලික් (ද්‍රාව විද්‍යා) මෙකාට්‍රොනික්ස් (යාන්ත්‍ර විද්‍යුත් විද්‍යාව) වැනි ඇතැම් මොඩියුල සඳහා ඉහළ ඉල්ලුමක් ඇති බැවින් මෙම මොඩියුල සඳහා ඇතැම් විට අමතර පාඨමාලා පැවැත්වීමට සිදුවේ.

4. ජ්‍යෙෂ්ඨ කාර්මික ශිල්පීන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම (අදියර 3)

මෙම උසස් පුහුණු වැඩසටයන ජ්‍යෙෂ්ඨ කාර්මික ශිල්පීන්ගේ දැනුම හා කුසලතා ඉහළ දැමීම හා ඔවුන්ගේ වැරදි පිළිබඳව නිශ්චිතව හඳුනාගැනීමට හා ඒවා නිවැරදි කිරීමට සුදුසු පරිදි සැළසුම් කර තිබේ. අවුරුදු 5 ට වැඩි පලපුරුද්දක් ඇති කාර්මික ශිල්පීන් මෙම පාඨමාලාව සඳහා සුදුසුකම් ලබයි. සේවායෝජකයන්ට තම කාර්මික ශිල්පීන් ඔවුන්ගේ පුහුණු අවශ්‍යතා අනුව තෝරාගත් ඕනෑම පුහුණු වැඩසටහනක් සඳහා යෙදවීමට හැකිවන පරිදි සැකසූ විවිධ මොඩියුල 6 ක් මෙම පුහුණු

වැඩසටහන් සමන්විත වේ. හයිඩ්‍රොලික් සහ මෙකාට්‍රොනික්ස් පාඨමාලා සඳහා කර්මාන්තය තුළ ඉහළ ඉල්ලුමක් ඇති බැවින් ඇතැම් විට මෙම මොඩියුල සඳහා අමතර පාඨමාලා පැවැත්වීමට ද සිදුවේ.

5.අධීක්ෂකයින් සඳහා පුහුණු වැඩසටහන්

ඉදිකිරීම් උපකරණ නඩත්තු කිරීම පිළිබඳ වගකීම දරන වැඩබිම් අධීක්ෂකයන්ගේ දැනුම වර්ධනය කිරීම සඳහා මෙම අධීක්ෂණ පුහුණු වැඩසටහන සැලසුම් කොට තිබේ. අදාළ ක්ෂේත්‍රයේ වසර 2 ක පළපුරුද්ද ඇති අධීක්ෂකයන් මෙම පාඨමාලාව සඳහා බඳවා ගනු ලැබේ.

6. ඉංජිනේරුවන්/ කළමනාකරුවන් සඳහා පුහුණු වැඩ සටහන

ඉදිකිරීම් උපකරණ භාවිතා කිරීමේ හා නඩත්තු කිරීමේ යෙදී සිටින ඉදිකිරීම් උපකරණ ඉංජිනේරු වැඩබිම් කළමනාකරුවන්, ව්‍යාපෘති කළමනාකරුවන් ආදීන්ගේ දැනුම වර්ධනය සඳහා මෙම පුහුණු වැඩසටහන සකසා ඇත. මෙම පාඨමාලාව වසර දෙකක පළපුරුද්දක් ඇති ඉංජිනේරුවන් බඳවා ගනු ලැබේ.

ඉදිකිරීම් උපකරණ නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීමේ වගකීම දරන යාන්ත්‍රික ඉංජිනේරුවන්ට හා ඉදිරිපෙළ කළමනාකරුවන්ට තාක්ෂණික දැනුම ලබාදීම සඳහා ''ඉදිකිරීම් උපකරණ නඩත්තු කිරීම'' පිළිබඳ පුහුණු පාඨමාලාව සකස් කොට ඇත. ඊට සහභාගීවන්නන්ට වසර 2 ක පළපුරුද්දක් තිබිය යුතුය.





7. ගබඩා/සැපයීම/ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා වන පුහුණු වැඩසටහන්

සාමාන්‍යයෙන් ඉදිකිරීම් කර්මාන්තය තුළ සේවය කරන ගබඩා/සැපයීම්/ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට ක්‍රමවත් පුහුණුවක් ලබා ගැනීමට තිබෙන අවස්ථා සීමිතය. මෙම තත්ත්වය අලුත්වැඩියා මධ්‍යස්ථානවල මනා ක්‍රියාකාරිත්වයට බාධා පමුණුවන විවිධ ප්‍රායෝගික ගැටළු ඇති කරයි. මෙම පුහුණු වැඩසටහන මෙම පුහුණු අවශ්‍යතාවය සපුරා ගැනීම සඳහා ඇති කරන ලදි.

8. ගොඩනැගිලි සේවා ඉන්ජිනේරු වැඩසටහන්

ගොඩනැගිලි ඉංජිනේරු සේවා ක්ෂේත්‍රයේ ඉංජිනේරුවන් හා ගෘහ නිර්මාණ ශිල්පීන් සඳහාCETRAC විසින් බොහෝ පාඨමාලා පවත්වනු ලැබේ. වාණිජ ගොඩනැගිලි නඩත්තු කිරීම සඳහා අවශ්‍ය වන ගොඩනැගිලි සේවා ආවරණය කිරීමට වැඩසටහන් සුළු ප්‍රමාණයක් සකස් කොට තිබේ.

ඒවා ගිනි ආරක්ෂක පද්ධතිය, විදුලි පද්ධතිය, වායු සමීකරණ හා සුළං කවුලු පද්ධති, ජල සම්පාදන හා අපවහන පද්ධති ආවරණය කරයි. පසුගිය වසර තුළදී මෙවැනි වැඩසටහන් ගණනාවක් සාර්ථකව නිමකරන ලදි.

9. සේවාදායකයන්ගේ සේවා අවශ්‍යතා මත සකස් වූ පුහුණු වැඩසටහන්

CETRAC ආයතනය දීර්ඝ කාලීනව ලබා ඇති පළපුරුද්ද සමඟින් රටේ වෙනස්වන ඉල්ලුමට සරිලන පරිදි සේවාදායක අවශ්‍යතා මත ගොඩනැගුණු පුහුණු වැඩසටහන් වැඩිදියුණු කිරීම තුළින් විවිධ හා විශේෂිත පුහුණු ඉල්ලීම සාර්ථකව සපුරාදීමට යටත්ව ඇත.

2015 වසරේදී CETRAC කාර්ය සාධනය පහත පරිදි දැක්වේ :

වගුව 1 : 2014 වසරේ CETRAC කාර්ය සාධනය

	පුහුණු පාඨමාලා	ලියාපදිංචි ගත		අවසන් කළ	
		පාඨමාලා ගණන	සහභාගි වන්නන් ගණන	පාඨමාලා ගණන	සහභාගි වන්නන් ගණන
01	**පාසැල් හැරගිය අය හට(පළමු අදියර)ඉදිකිරීම් උපකරණ යාන්ත්‍රික පුහුණු පාඨමාලාව (BM)**	2	60	2	52
	පුහුණු පාඨමාලා	**ඉලක්කගත නිමැවුම්**		**සැබෑ නිමැවුම්**	
		පාඨමාලා ගණන	සහභාගි වන්නන් ගණන	පාඨමාලා ගණන	සහභාගි වන්නන් ගණන
02	**ආධුනික ශිල්පීන් (අදියර II)**				
	ඩීසල් එන්ජින් නඩත්තුව	1	15	1	37
	හයිඩ්‍රොලික් පද්ධතිය නඩත්තුව - 15M22	2	30	2	33
	ඩීසල් ජෙනරේටර් නඩත්තුව - 15M25	2	30	2	58
	සුක්කානම, තිරිංග හා ක්ලච් පද්ධති නඩත්තුව - 15M26	2	30	1	09
	ව්‍යවර්ථ මාරු කිරිම හා විසුරුවාලීම් පද්ධතිය නඩත්තුව - 15M27	2	30	1	11
	ඉදිකිරීම් යන්ත්‍රෝපකරණවල ඉලෙක්ට්‍රොනික්ස් සහ මෙකාට්‍රොනික්ස් නඩත්තුව - 15MT	2	30	1	18
	වතුර පොම්ප හා සම්පීඩන නඩත්තුව - 15WPC	1	15	2	35
	ස්වයංක්‍රීය ඉලෙක්ට්‍රොනික් පද්ධති නඩත්තුව -15M24	2	30	1	10
	ඉදිකිරීම් උපකරණ නඩත්තුව -15SCE	2	30	--	--
03	**ජ්‍යෙෂ්ඨ කාර්මික ශිල්පීන් (අදියර III)**				
	හයිඩ්‍රොලික් හා මෙකාට්‍රොනික්ස් පද්ධති නඩත්තුව - 15M32	1	15	--	--
	ස්වයංක්‍රීය විදුලි පද්ධති නඩත්තුව -15M34	1	15	--	--
04	**ඉංජිනේරුවන්**				
	ඉදිකිරීම් උපකරණ භාවිතය – 15CPM	1	15	--	--
	ඉදිකිරීම් උපකරණ නඩත්තුව - 15CEM	1	15	--	--
05	**අධීක්ෂණ**				
	ඉදිකිරීම් උපකරණ නඩත්තුව - හයිඩ්‍රොලික් විමෝජන - 14SUP 1	1	15	--	--
	ඉදිකිරීම් උපකරණ නඩත්තුව - එන්ජින් සහ මැකට්‍රොනික්ස් 14SUP2	1	15	--	--
06	**සහාය කාර්ය මණ්ඩලය**				
	මානව සම්පත් කළමනාකරණය පිළිබඳ පදනම් පාඨමාලාව	1	20	1	10
	ගබඩාකරණය පිළිබඳ පදනම් පාඨමාලාව	2	30	1	14
	අපත ජලපිරිපහදු යන්ත්‍රාගාර මෙහෙයවීම සහ අධීක්ෂණය	1	40	1	26
	ගබඩාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව	2	60	2	51
	ගබඩාකරණය පිළිබඳ උසස් සහතිකපත්‍ර පාඨමාලාව	1	10	1	24
	ගබඩා පිරික්සීම පිළිබඳ එක් දින වැඩමුළුව	2	84	2	79

	පුහුණු පාඨමාලා	ලියාපදිංචි ගත		අවසන් කළ	
		පාඨමාලා ගණන	සහභාගි වන්නන් ගණන	පාඨමාලා ගණන	සහභාගි වන්නන් ගණන
07	**පාරිභෝගික අවශ්‍යතා මත ඇති කළ පාඨමාලාව (CET)**				
	මොබයිල් ක්‍රේන් ක්‍රියාකරවීම	1	10	1	3
	ෆෝක් ලිෆ්ට්, ට්‍රක් ක්‍රියාකරවීම	1	25	4	15
	ෆෝක් ලිෆ්ට් ට්‍රක් ක්‍රියාකරවීම පිළිබඳ දැනුවත්වීමේ වැඩ සටහන	1	30	--	--
	වාහන නඩත්තුව පිළිබඳ විද්‍යාත්මක පිවිසුම	1	25	--	--
	හයිඩ්‍රොලික් පද්ධති නඩත්තුව	1	30	--	--
	ඉදිකිරීම් කාර්මික උපකරණ නඩත්තුව	1	30	--	--
	ජලපොම්ප සහ සම්පීඩන නඩත්තුව	1	35	--	--
	ඩීසල් විදුලි උත්පාදන යන්ත්‍ර	1	30	--	--
	කර්මාන්තයේ ආරක්ෂාව	1	30	--	--
	කර්මාන්ත හයිඩ්‍රොලික්ස්	1	30	--	--
08	**පාරිභෝගික අවශ්‍යතා මත ඇති කළ පාඨමාලා (BSE)**				
	ගොඩනැගිලි වල ගිණි ආරක්ෂණ පද්ධති පිළිබඳ වැඩමුළුව	1	40	1	36
	වානිජ ගොඩනැගිලිවල නඩත්තු සැලසුම පිළිබඳ වඩාත් සුදුසුම පරිචයන්	1	40	1	33
	වායු සමීකරණ පද්ධති සඳහා පරිසරාක්ෂිත විසඳුම්	1	40	1	27
	ගොඩනැගිලිවල බලශක්තිය කාර්යක්ෂමතාවය සහ ඉතිරිය	1	40	1	36
	ජල නල පද්ධති පිළිබඳ වැඩසටන	1	30	1	22
	පිහිනුම් තටාක නඩත්තුව	1	30	--	--
	විද්‍යුත් පද්ධති සවිකිරීම් පද්ධතිය	1	40	--	--
	ජලාපවහන පද්ධතිය	1	40	--	--
	ගිනිනිවාරන පද්ධතිය	1	40	--	--
09	**සම්මන්ත්‍රණ**				
	රියදුරු පුහුණුව	1	100	7	363
	සේවකයින් ඵලදායී ක්‍රියාකාරීත්වය සදහා යොමු කරන්නේ කෙසේද?	1	100	1	67
	හයිඩ්‍රොලික් පද්ධතීන් නඩත්තුව සහ දෝෂ නිවැරදි කිරීම	1	100	1	49
	ප්‍රවාහනය කළමනාකරණය	1	100	2	112
	විද්‍යාත්මක සුරක්ෂිත සහ පිරිමැසුම්දායක ධාවනය	1	100	1	82
	පිරිමැසුම්දායක සහ විද්‍යාත්මක ධාවන තාක්ෂණය	1	100	--	--
	හයිඩ්‍රොලික් සංකේත සහ පරිපථ	1	100	--	--
	පරිපාලන රෙගුලාසි සහ මානව සම්පත් කළමනාකරණය	1	100	--	--
	විද්‍යාත්මක ආරක්ෂාව සහ සකසුරුවම් මෝටර් රථ ධාවනය	1	100	--	--
	පොදු දුම්රිය ඩීසල් ඉන්ධන පද්ධතිය	1	100	--	--
	මුළු එකතුව	62	2089	43	1312

2015 වසර තුළ ඉපයූ ආදායම

කාර්ය ප්‍රභේදය	ආදායම (රු.මිලියන)
පුහුණු වැඩසටහන්, වැඩමුළු සහ සම්මන්ත්‍රණ	8.42
වැඩපොල අලුත්වැඩියා රැකියා සහ වෙනත් වැඩමුළු සේවාවන්	1.84
පහසුකම් කුලියට දීම	9.58
මුළු එකතුව	19.84

6.4 කර්මාන්ත පුහුණු අංශය

මෙම ක්ෂේත්‍රයේ වර්තමාන සහ අනාගත මානව ප්‍රාග්ධන අවශ්‍යතාවය ඇගයීම, වර්තමාන මානව ප්‍රාග්ධනයේ නිපුණතා මට්ටම ඉහළ දැමීම සඳහා පුහුණු වැඩසටහන් ආරම්භ කිරීම, ක්ෂේත්‍රයේ නවකයින්ව පුහුණු කිරීම, නවීන තාක්ෂණය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වර්ධනය සඳහා යොදා ගැනීම තුළින් මෙහි ප්‍රතිරූපය වර්ධනය කිරීම සහ නව මිනිස් සම්පත අද්දවා ගැනීම සහපවතින මිනිස් ප්‍රාග්ධනය රඳවා ගැනීම වැනි වගකීම් මෙම අංශය වෙත පවරා ඇත. මෙම කර්මාන්තයේ නවතම තාක්ෂණ වර්ධනය හා සමඟ මුහුණ දීම සඳහා අඛණ්ඩ දැනුම සහ නිපුණතාව වර්ධනය අරභයා සංවර්ධන වැඩ සටහන් ඇරඹීමට උනන්දු කිරීම ද අත්‍යවශ්‍ය කාරණාවකි. ඉදිකිරීම් කර්මාන්තයේ පුහුණු අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ජාතික මට්ටමේ ඉදිකිරීම් සමාගම්, රාජ්‍ය සහ අනෙකුත් අදාළ පුද්ගලික ආයතන සමඟ සිඩා (CIDA) ආයතනය එකමුතුව වැඩකරනු ලබයි.

මෙම අංශය ප්‍රධාන කොටස් දෙකකින් සමන්විතය ;

අ. ජාතික මට්ටමේ හැකියාවන් ඔප් නැංවීම සඳහා පුහුණු ඒකකය (ප්‍රධාන කාර්යාලයේ පිහිටුවා ඇත.)

ආ.ව්‍යුහාත්මක පුහුණු වැඩසටහන් සඳහා නිවාස සැළසුම් සහ ගොඩනැඟිලි මධ්‍යස්ථානය

පිවිසුම ;

ඉදිකිරීම් කර්මාන්තයේ වර්තමානයේ පුහුණු ශ්‍රමයේ දැඩි හිඟයක් පවතින අතර එමඟින් මෙම නැඟී එන වර්ධනයට නිශේධනාත්මක බලපෑමක් සිදු කරයි. පසුගිය වසර කිහිපය පුරාවට තරුණ පරම්පරාව මෙම කර්මාන්තයට දායක වීමේ අඩුවක් දැකගත හැකි අතර තරුණ පරපුර විශේෂ හැකියාවන් හෝ වෘත්තීය පුහුණුවක් නොමැති ත්‍රිවිලර් රථ ධාවනය, ආරක්ෂණ නියාමන වැනි රැකියාවන්ට යොමු වීමේ ප්‍රවණතාවයක් මේ හේතුව නිසා ඇති වී තිබේ.

මෙම නිසා ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තයේ වර්ධනයට සහ තිරසාරත්වයට සියළුම අංශයන්ගෙන් දායක වන්නා වූ රාජ්‍ය සහ පුද්ගලික අංශය මෙන්ම තනි පුද්ගලයින්ටද අවශ්‍ය වන්නා වූ පුහුණු අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා වාර්ෂිකව පුහුණු වැඩසටහන් පුහුණු අංශය මඟින් සැළසුම් කිරීම මෙන්ම ඒවා පවත්වනු ලැබීමද සිදු කරයි. ප්‍රධාන වශයෙන්ම පුහුණු වැඩසටහන් ප්‍රධාන කළමනාකරණ ත්‍රිත්වයන් වන, .

- කළමනාකරණ
- අධීක්ෂණ
- ශිල්පීය යන අංශයන් යටතේ සිදුකරනු ලබයි.

ඉහත කටයුතු අඛණ්ඩව සිදුකිරීම සඳහා පහත සඳහන් වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු 2015 වසරේදී සිදුකරන ලදි.

අ. ජාතික මට්ටමේ කුසළතාවයන් නංවාලීම සඳහා වනපුහුණු ඒකකය (ප්‍රධාන කාර්යාලයේ පිහිටුවා ඇත.).

❖ **කොන්ත්‍රාත් සහ ප්‍රසම්පාදන කළමනාකරණ උසස් සහතික පත්‍ර පාඨමාලාව.**

රාජ්‍ය සහ පුද්ගලික අංශයන්හි ගිවිසුම් සහ ප්‍රසම්පාදන කළමනාකරණ කටයුතු වල නිරත වී සිටින කුඩා සහ මධ්‍යම පරිමාණ කළමනාකරුවන්ගේ දැනුම සහ හැකියාවන් වර්ධනය සහ යාවත්කාලීණ කිරීම සඳහා සිඩා (CIDA) විසින් වාර්ෂිකව නව මසක පුහුණු පාඨමාලාවක් ''ගිවිසුම් සහ ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාවක්'' පවත්වනු ලබයි. මෙම වැඩසටහන 2015 වසරේ පෙබරවාරි සිට ඔක්තෝබර් දක්වා පැවැත්වූ අතර ඒ සඳහා රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ගිවිසුම් සහ ප්‍රසම්පාදන ක්ෂේත්‍රයේ පුද්ගලයින් 53 දෙනෙකු පමණ සහභාගි වුහ.

❖ **'ටෙන්ඩර්' සහ 'බිම් මැනුම් සහ මාසික බිල්පත් සැකසීම.'**

කුඩා සහ මධ්‍ය පරිමාණ කොන්ත්‍රාත්කරුවන්ගේ කළමනාකරණ කුසළතාවයන් වර්ධනය කිරීම සඳහා 'ටෙන්ඩර්' සහ බිම් මැනුම් සහ මාසික බිල්පත් සැකසීම පිළිබඳ පුහුණු පාඨමාලාවන් පුහුණු අංශය මඟින් වාර්ෂිකව සංවිධානය කරනු ලබයි. මෙම වැඩසටහන සිංහල සහ දෙමළ යන භාෂා දෙකෙන්ම පවත්වනු ලබයි. 2015 වසරේ මාධ්‍ය දෙකෙන්ම පුහුණු පාඨමාලාවන් 14 ක් පවත්වන ලද අතර එම පුහුණු වැඩසටහන් සඳහා කොන්ත්‍රාත්කරුවන් 458 දෙනෙකු සහභාගි විය.

❖ **දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සේවය කරන කාර්මික නිලධාරින්ගේ ජාතික මට්ටමේ කාර්මික කුසළතාවයන් නැංවීම සඳහා වන වැඩ සටහන.**

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ඉල්ලුම මත දීප ව්‍යාප්ත ප්‍රාදේශීය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයන්හි සේවය කරනු ලබන කාර්මික කාර්යය මණ්ඩලය වෙනුවෙන් ඉහත පුහුණු වැඩසටහන සකස් කර ඇත. සියලුම පළාත් ආවරණය කරමින් වැඩසටහන් 9 ක් පැවැත්වීම මඟින් නිලධාරීන් 676 දෙනෙකු පුහුණු කරන ලදි.

පළාත්	දිස්ත්‍රික්කය	සහභාගී වූ ගණන	මධ්‍යස්ථානය	පාඨමාලා විෂය මාලාව
බස්නාහිර පළාත	කොළඹ/ ගම්පහ	92	සච්සිරිපාය ශ්‍රවනාගාරය	1. ව්‍යාපෘති සැකසීම සහ ක්‍රියාත්මක කිරීම. 2. වැඩබිම් සංවිධානය 3. ප්‍රගති පාලනය 4. ඉදිකිරීම් වැඩබිම්හි ආරක්ෂාව 5. නිවාස 6. නිවාස විදුලි රැහැන් ඇදීම 7. ගොඩනැගිලි ද්‍රව්‍ය හඳුන්වාදීම. 8. ප්‍රසම්පාදන ක්‍රම. 9. බිම් මැනුම් සහ තලවිතිකරණය 10. ඔටෝ කැඩ් 11. ඇළුමිනියම් ව්‍යුහය
මධ්‍යම පළාත	නුවර/ නුවරඑලිය/ මාතලේ	82	ශ්‍රවනාගාරය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවර	
දකුණු පළාත	මාතර/ ගාල්ල/ හම්බන්තොට	99	ශ්‍රවනාගාරය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර	
වයඹ පළාත	කුරුණෑගල/ පුත්තලම	81	ශ්‍රවනාගාරය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල	
සබරගමුව පළාත	රත්නපුර/ කෑගල්ල	60	ශ්‍රවනාගාරය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර	
ඌව පළාත	බදුල්ල/ මොනරාගල	60	ශ්‍රවනාගාරය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, බදුල්ල	
උතුරු මැද පළාත	අනුරාධපුර/ පොලොන්නරුව	59	ශ්‍රවනාගාරය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අනුරාධපුරය	
උතුරු පලාත	කිලිනොච්චිය/ මුලතිවු/ වවුනියා/ යාපනය/ මන්නාරම	59	ශ්‍රවනාගාරය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කිලිනොච්චිය	
නැගෙනහිර පළාත	මඩකලපුව/ අම්පාර/ ත්‍රිකුණාමලය	84	ශ්‍රවනාගාරය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මඩකලපුව	
මුළු එකතුව		**676**		

❖ ඉදිකිරීම් සුරක්ෂිතතාවය සහ වෘත්තිය සෞඛ්‍යය පිළිබඳ පුහුණු වැඩසටහන්

ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය ක්‍රමක්‍රමයෙන් නවීකරණය වෙමින් පවතින අතර අවසානයේදී ගුණාත්මක භාවයෙන් යුත් නිෂ්පාදනයක් එළිදැක්වීම සඳහා ඉදිකිරීම් කර්මාන්තය තුළ වඩාත් සංකීර්ණ ක්‍රම සහ විධි භාවිතයට යොමුව ඇත. වැඩබිම්හි නිරතව සිටින මානව සහ අනෙකුත් සම්පත් වලට සිදුවිය හැකි අවදානම සහ හානිය අවම කිරීම පෙරදැරිව වෘත්තිය සනීපාරක්ෂාව සහ ඉදිකිරීම් වැඩබිම්හි සුරක්ෂිතතාවය වැඩිදියුණු කිරීම ඉතා වැදගත් අවශ්‍යතාවයකි. කම්කරු දෙපාර්තමේන්තුවේ වෘත්තිය සනීපාරක්ෂාව පිළිබඳ අංශය සමඟ සිඩා (CIDA)හි එකමුතුවෙන් පහත සඳහන් අදියර යටතේ පුහුණු වැඩසටහන් 2 ක් සකස් කර ඇත.

- **ඉදිකිරීම් වෘත්තිය සුරක්ෂිතතාවය සහ සනීපාරක්ෂාව පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව (DCOSH):**

කළමනාකරණ මට්ටම සහ ඉන් පහළ අදියරයන්හි පුද්ගලයින් පුහුණු කිරීම සඳහා සෑම සතියකම සිකුරාදා සහ සෙනසුරාදා සය මසක පුහුණු පාඨමාලාවක් පවත්වනු ලබයි.

- **ඉදිකිරීම් වෘත්තිය සුරක්ෂිතතාවය සහ සනීපාරක්ෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව(CCOSH):**

කම්කරුවන්ට සැලකිය යුතු අවම මට්ටමේ අවදානම් පරිසරයක් සහිත වැඩබිම් පරිසරයක් සංවිධානය කිරීමට අවශ්‍ය දැනුම අධීක්ෂණ මට්ටමේ සහ ඉන් පහළඅදියරයන්හි නිරත පුද්ගලයින් හට ප්‍රායෝගිකව ලබාදීම අරමුණු කොට සෑම සතියකම බ්‍රහස්පතින්දා දින සිව් මසක පුහුණු වැඩසටහනක් පවත්වනු ලබයි.

සහතික පත්‍ර පාඨමාලාවන් 2015 නොවැම්බර් මස සිට 2016 අප්‍රේල් මස දක්වා පැවැත්වීමට නියමිතව තිබූ අතර මේ සඳහා රාජ්‍ය සහ පුද්ගලික අංශයේ පුද්ගලයින් 45 දෙනෙකු පමණ සහභාගි විය.

❖ 2015 වසරේ පැවැත්වූ සම්මන්ත්‍රණ සහ වැඩමුළු

මාසය	වැඩසටහන	සහභාගි වූ ගණන
පෙබරවාරි	කාර්මික කාර්ය මණ්ඩලය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් පිළිබඳ වැඩමුළුව	62
පෙබරවාරි	ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් සඳහා අගය මත බදු (VAT) පිළිබඳ සම්මන්ත්‍රණය	185
මාර්තු	කාර්මික නිලධාරීන්ගේ රාජකාරි සහ වගකීම් පිළිබඳ වැඩමුළුව	84
ජූනි	උපත ජල පිරිපහදුව සැළසුම් කිරීමේ ක්‍රමවේදය පිළිබඳ පුහුණු වැඩසටහන, ඉවතලෑම සහ නැවත භාවිතය, වැසි වතුර ගලා යාමේ පද්ධතිය.	79
අගෝස්තු	ඉදිකිරීම් සුරක්ෂිතතාවය සහ වෘත්තිය සනීපාරක්ෂාව පිළිබඳ පුහුණු වැඩසටහන.	45

❖ **RPL / NVQ** වැඩසටහන

NVQ ජාතික වෘත්තිය සුදුසුකම් සහතිකය ලබා ගැනීම සහ සුදුසුකම්ලත් දක්ෂ කාර්මික ශිල්පීන් බිහිකිරීමේ ලා ප්‍රවර්ධනය කිරීම උදෙසා RPL/NVQ වැඩසටහන් (27) ක් ඔකේවෙල, කොළඹ, අනුරාධපුරය, රත්නපුර, මාතර, කල්මුනෙයි, වලස්මුල්ල, තිස්සමහාරාමය, හම්බන්තොට, බෙලිඅත්ත, යාපනය, කෑගල්ල, මන්නාරම, කුරුණෑගල, කටුවාන, මහනුවර, අම්පාර, පොළොන්නරුව, නින්දාර්, මඩකළපුව, වලස්මුල්ල, බත්තරමුල්ල, මීරිජ්ජවිල යන ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශ තුළ පවත්වා ඇත. මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා පෙදරේරුවන්, වඩු කාර්මිකයින් සහ ජලනල කාර්මිකයින් ඇතුළුව ශිල්පීන් 3201 දෙනෙකු සහභාගි වී ඇත.

ආ. නිවාස සැළසුම් සහ ගොඩනැගිලි පිළිබඳ [CHPB] විද්වත් පුහුණු වැඩසටහන් සඳහා මධ්‍යස්ථානය

සිඩා (CIDA)කළමනාකරණ අධිකාරිත්වය යටතට ගැනෙන විවිධ අංශයන්ගෙන් සමන්විත ආයතනයන් නිවාස සැළසුම් සහ ගොඩනැගිලි පිළිබඳ මධ්‍යස්ථානය තාක්‍ෂණ විශේෂඥයින් සහ වෘත්තිකයන්ගේ වෘත්තිය ප්‍රගමණය උදෙසා පාඨමාලාවන් පැවැත්වීම පිළිබඳව මූලික වූ ආයතනයකි. CHPB (නිවාස සැළසුම් සහ ගොඩනැගිලි පිළිබඳ මධ්‍යස්ථානය) වඩාත් සුදුසු පාඨමාලාවන් පැවැත්වීම පිළිබඳව CHPB ආයතනයේ වෘත්තිමයභාවයට සාක්‍ෂයකි. මෙම කාර්මික සැසියන් සඳහා ලැබෙන්නා වූ ප්‍රතිචාරයන් අසීමිත ය.

CHPB පුහුණු වැඩසටහන්

ඉදිකිරීම් කළමනාකරණය සහ ප්‍රමාණ සමීක්‍ෂණය යන ප්‍රධාන අංශ දෙක යටතේ වන හිදැස පිරවීම සඳහා පුහුණුව විශේෂයෙන් CHPB මගින් සළසනු ලබයි. උසස් ඉදිකිරීම් කළමනාකරණ පාඨමාලාවන් නිශ්චිතව හඳුනාගෙන ඇත්තේ, උසස් ඉදිකිරීම් කළමනාකරණ ඩිප්ලෝමා (DACM) සහ ඉදිකිරීම් වැඩ කළමනාකරණය (CWM) ලෙසය.

B.1 උසස් ඉදිකිරීම් කළමනාකරණ ඩිප්ලෝමාව DACM:

ඉදිකිරීම් කර්මාන්තයේ නිරත විධායක නිලධාරින්, ව්‍යාපීති කළමණාකරුවන්, ඉංජිනේරුවන්, වාස්තු විද්‍යාඥයින්, ප්‍රමාණ සමීක්‍ෂකයින් සහ අනෙකුත් වෘත්තිකයන්ගේ යහපත තකා මෙම පුහුණු පාඨමාලාව සකසා ඇත.

B.2 CWM වැඩසටහන (ඉදිකිරීම් වැඩ කළමනාකරණය):

ශිෂ්‍යයන්ගේ අවශ්‍යතාවයන් තේරුම් ගෙන පූර්ණ කාලීණ සහ අර්ධ කාලීණ වශයෙන් මෙම වැඩසටහන සැළසුම් කර ඇත.

- ඉදිකිරීම් කර්මාන්තයට ඉදිකිරීම් අධීක්ෂකයින් වශයෙන අවතීර්ණ වීමට කැමැත්තක් දක්වන්නාවූ පාසැල් හැරගිය අය සහ උනන්දුවක් දක්වන තරුණයින් සඳහා පූර්ණ කාලීණ CWM පාඨමාලාව සකසා ඇත.
- දැනටමත් ඉදිකිරීම් කටයුතුවල නිරත වී සිටින පූර්ව කාර්මික දැනුමක් හෝ සුදුසුකම් නොමැති ඉදිකිරීම් අධීක්ෂකයින් සහ ඉදිකිරීම් අධීක්ෂකයින් වීමට කැමැත්තක් දක්වන්නා වූ පුද්ගලයින්ව අර්ධ කාලීණ පාඨමාලාව ඉලක්ක කර ඇත.

B.2.1 CWM ඉදිකිරීම් වැඩ කළමනාකරණ පූර්ණ කාලීණ පාඨමාලාව :

මෙම කර්මාන්තය තුළ අධීක්ෂණ මට්ටමේ සේවකයින් සඳහා දැඩි ඉල්ලුමක් පවතී. දක්ෂ ඉදිකිරීම් අධීක්ෂකයින් හට විදේශ ඉදිකිරීම් ක්ෂේත්‍රයන්හි ඉහල ඉල්ලුමක් තිබෙන බැවින් ඔවුන් දේශීය කර්මාන්තය තුල වැඩිකල් රැඳී සිටින්නේ නැත. ඊට අමතරව මෙම කර්මාන්තය වෙත නවකයින්ගේ ප්‍රවේශයේද ඇත්තේ උදාසීන භාවයකි. කලින් පාසැල් හැරයන්නන් සඳහා පාඨමාලාවන් සකස් පැවැත්වීමෙන් තරුණ විරැකියාවට පිළිතුරක් ලැබෙන අතර ඔවුන්ව මෙම නැඟී එන ක්ෂේත්‍රයට ආකර්ශණය කර ගැනීමට අවකාශය සලස යි. මෙම (CWM) ඉදිකිරීම් වැඩ කළමනාකරණ පූර්ණකාලීන පාඨමාලාව මේ ක්ෂේත්‍රය සඳහා ඇති දැඩි අවශ්‍යතාවය සපුරාලයි.

නිවාස සැළසුම් සහ ගොඩනැගිලි මධ්‍යස්ථානයෙහිCHPB පස් මසක (මාස 5) ආයතනික පුහුණුවක් සහ ඉදිකිරීම් වැඩබිම් පරිශ්‍රයක මාස 7 ක ආධුණික පුහුණුවකින් මෙම එක් අවුරුදු පාඨමාලාව සමන්විත වේ.

B.2.2 CWMඉදිකිරීම් වැඩ කළමනාකරණ පාඨමාලාව අර්ධකාලීණ

දැනටමත් ඉදිකිරීම් අධීක්ෂණයින් වශයෙන් ඉදිකිරීම් කටයුතුවල නිරතව සිටින පුද්ගලයින්ගේ අවශ්‍යතාවය සහ යහපත තකා මෙම පාඨමාලාව සකසා ඇත.

B.3 :ප්‍රමාණ සමීක්ෂණ වැඩසටහන:

ප්‍රමාණ සමීක්ෂණ පාඨමාලා:

ප්‍රමාණ සමීක්ෂණ පාඨමාලාව සහතික පත්‍ර, ඩිප්ලෝමා සහ උසස් ඩිප්ලෝමාව යනුවෙන් පිළිවෙලින් අදියර තුනකින් සමන්විත වේ. මෙහිදී ඉලක්කගත කණ්ඩායම වන්නේ පළපුරුදු ඉදිකිරීම් වැඩ අධීක්ෂකයින්, කාර්මික නිලධාරීන්, සහාය ප්‍රමාණ සමීක්ෂකයින්, කාර්මික නිලධාරීන්, සහාය ප්‍රමාණ සමීක්ෂකයින් සහ සුදුසුකම් ඇති මේ පිළිබඳ උනන්දුවක් දක්වන්නා වූ කොටසයි. ඉහත පාඨමාලා දෙවර්ගම ජාතික වෘත්තීය සුදුසුකම (NVQ) විෂය නිර්දේශය මාර්ගෝපදේශ කොට ඇත.

B.3.1 ප්‍රමාණ සමීක්ෂණ උසස් ඩිප්ලෝමා පාඨමාලාව

ඉදිකිරීම් කටයුතු වල නිරතව සිටින කාර්මික නිලධාරින්, සහාය ප්‍රමාන සමීක්ෂකයින්, මධ්‍යම සහ පහළ මට්ටමේ නිලධාරින් සහ අනෙකුත් පුද්ගලයින්ගේ ප්‍රයෝජනය තකා මෙම පාඨමාලාව සකස් ඇත. මෙය හැදෑරීම සඳහා CHPD ඩිප්ලෝමාව සම්පූර්ණ කර තිබීම, CHPB පූර්ව සහ පශ්චාත් කොන්ත්‍රාත් පාඨමාලාව සහ පිළිගත් ආයතනයකින් පවත්වන ප්‍රමාණ සමීක්ෂණ ඩිප්ලෝමාවන් අවශ්‍ය සුදුසුකම් වේ. මෙම පාඨමාලාවේ කාලය අවුරුදු එකක් වේ. (සතියකට දින 01, සම්පූර්ණ දින 60)

B.3.2 ප්‍රමාණ සමීක්ෂණ ඩිප්ලෝමා පාඨමාලාව

මෙම පාඨමාලාව සකස් කර ඇත්තේ කාර්මික නිලධාරීන්, සැළසුම්කරුවන්, අධීක්ෂකයින්, මධ්‍යම සහ පහළ මට්ටමේ පුද්ගලයින් සහ ඉදිකිරීම් කටයුතුවල නිරතව සිටින අනෙකුත් පුද්ගලයින් සඳහාය. මෙය හැදෑරීම සඳහා අවශ්‍ය සුදුසුකම් වන්නේ CHPBප්‍රමාණ පත්‍ර සහ ඇස්තමේන්තු, NCT-QS, NT-QS, NVQ අදියර 4 හෝ සමාන සුදුසුකම්ය. මෙම පාඨමාලා කාලය මාස 10 කි. මෙම පාඨමාලාව සඳහා ඇතුළත් වීමට අයැදුම්කරුවන්හට ඇතුළත් වීමේ පරීක්ෂණයකට පෙනී සිටීමට සිදු වේ. CHPBප්‍රමාණ සමීක්ෂණ සහතිකපත්‍රලාභීන්ට මෙම ඇතුළත් වීමේ පරීක්ෂණයට පෙනී සිටීම අවශ්‍ය වන්නේ නැත.

B.3.3 ප්‍රමාණ සමීක්ෂණ සහතික පත්‍ර පාඨමාලාව

ඉදිකිරීම් අංශයේ නිරතව සිටින කාර්මික නිලධාරීන්, සැළසුම්කරුවන්, අධීක්ෂකයින්, මධ්‍යම සහ පහළ මට්ටමේ කාර්මිකයින් සහ අනෙකුත් පුද්ගලයින් සඳහා මෙම පුහුණු පාඨමාලාව සකසා ඇත. මෙය හැදෑරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් වන්නේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ වසර 2 ක පළපුරුද්ද සහ පිළිගත් කාර්මික සුදුසුකම්ය. පාඨමාලා කාලය මාස 6 කි. (සතියට දින 1, සම්පූර්ණ දින 24)

සේවකයින්ගේ හැකියාවන් නංවාලීම සඳහා වැඩිදුර පුහුණු පාඨමාලා

ඉදිකිරීම් සේවකයින්ගේ, අධීක්ෂකයින්ගේ, කාර්මික නිළදාරින්ගේ, ඉංජිනේරුවන්ගේ විධායකයින් සහ ව්‍යවසායකයින්ගේ හැකියාවන් නංවාලීම සඳහා මෙම පුහුණු පාඨමාලාවන් සකස් කර ඇත.

ඔටෝ කැඩ් (ද්විධාරා)Auto CAD 2D & 3D (ත්‍රිමාණ)ආදර්ශ ආකෘති සඳහා පුහුණු පාඨමාලාව

ඉදිකිරීම් සැළසුම් කාර්යයන් සඳහා පරිසරාශ්‍රිත සැළසුම් සහ දළ සටහන් ශිල්පක්‍රම ප්‍රායෝගිකව භාවිතය දියුණු කිරීම සපුරාලීම සඳහා මෙම පාඨමාලාව සකස් කර ඇත.

මයික්‍රොසොෆ්ට් ව්‍යාපෘති පුහුණු පාඨමාලාව 2013

ඉදිකිරීම් කර්මාන්තයේ අවශ්‍යතාවයන් වන ඉදිකිරීම් ක්ෂේත්‍රයේ MS-ව්‍යාපෘති සඳහා ඉදිකිරීම් සැළසුම් හා නිරීක්ෂණ භාවිතයේ ප්‍රායෝගික පුහුණුවක් ඇති අය වෙනුවෙන් මෙම පාඨමාලාව සකස් කර ඇත.

පාරිභෝගික අවශ්‍යතා මත සැකසූ පුහුණු පාඨමාලා

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නිරතව සිටින රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතනයන්ගෙන් කෙරෙන නිශ්චිත පුහුණු අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා සාර්ථකව පාරිභෝගික අවශ්‍යතා මත වැඩසටහන් නිර්මාණය කර ඉදිරිපත් කිරීමට CHPBසමත් වී ඇත.

සම්මන්ත්‍රණ සහ වැඩමුළු

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පුරාවට විහිදී ඇති විවිධ සේවා අංශයන්හි නියැලී සිටින පුද්ගලයින්හට විවිධ මාතෘකා යටතේ දැනුම සහ ප්‍රායෝගික අත්දැකීම් ලබාදීම සඳහා මාසිකව සම්මන්ත්‍රණ සහ වැඩමුළු සංවිධානය කරයි.

විද්‍යුත් තාක්ෂණ උසස් පාඨමාලාව

ලී පිළිබඳ වැඩමුළුව

ජල නල එලීම – වැඩමුළුව

ගිවිසුම් නීතිය සම්මන්ත්‍රණය

පදනම් – වැඩමුළුව විචල්‍යයන් – සම්මන්ත්‍රණය

නිවාස සැළසුම් සහ ගොඩනැගිලි මධ්‍යස්ථානයේ 2015 වසරේ කාර්ය සාධනය පහත පරිදි දැක්වේ,

නිවාස සැළසුම් සහ ගොඩනැගිලි මධ්‍යස්ථානයේ(CHPB) කාර්ය සාධනය - 2015

අනු අංකය	පාඨමාලාව	2015 දෙසැම්බර් දක්වා වැඩසටහන් සංඛ්‍යාව	2015 දෙසැම්බර් දක්වා සහභාගි වූ ගණන	2015 දෙසැම්බර් දක්වා ආදායම (රු.මිලියන)
01	**ප්‍රමාණ සමීක්ෂණ පාඨමාලා**			
	❖ සහතික පත්‍ර පාඨමාලාව	04	97	2.182
	❖ ඩිප්ලෝමා පාඨමාලාව	04	140	6.603
02	**ඉදිකිරීම් වැඩ කළමනාකරණ පාඨමාලාව**			
	❖ පූර්ණකාලීන සහ අර්ධ කාලීන	02	24	0.889
03	**උසස් ඉදිකිරීම් කළමනාකරණ පාඨමාලාව**	01	20	0.470
04	**පරිගණක පාඨමාලා**			
	❖ MS ව්‍යාපෘති පාඨමාලාව	04	92	1.084
	❖ ඔටෝ කැඩ්	03	63	0.915
05	පාරිභෝගික අවශ්‍යතා මත සැකසූ පාඨමාලා			
5.1	ප්‍රමාණ පත්‍ර මිලහරණය සහ ගාස්තු ඇගයීම	02	100	1.179
5.2	මිනින්දෝරු පාඨමාලා	02	28	0.420
5.3	කොන්ත්‍රාත් සහ NHDA කාර්මික නිලධාරීන් සඳහා පදනම	01	38	0.103
5.4	ශ්‍රී ලංකා ටෙලිකොම් නිලධාරීන් සඳහා පිරිවැය කාර්යක්ෂම නිවාස	01	25	0.075
5.5	ශ්‍රී ලංකා ටෙලිකොම් නිලදාරීන් සඳහා ජලනල තාක්ෂණය	01	63	0.145
06	**සම්මන්ත්‍රණ සහ වැඩමුළු**			
6.1	❖ කොන්ක්‍රීට් තාක්ෂණය සහ අත්තිවාරම් වර්ග	01	111	0.333
6.2	❖ ඉදිකිරීම් කොන්ත්‍රාත්හි මිල උච්චාවචනය	01	118	0.413
6.3	❖ ජලනල තාක්ෂණය	01	101	0.303
6.4	❖ පිරිවැය කාර්යක්ෂමතා නිවාස	01	166	0.491
6.5	❖ නේවාසික විදුලි තාක්ෂණය	01	140	0.420

6.6	❖ විදුලි තාක්ෂණය කර්මාන්ත	01	74	0.222
6.7	❖ ගිවිසුම් නීතිය	01	130	0.390
6.8	❖ ඉදිකිරීම් කර්මාන්තය සඳහා ලී භාවිතය	01	136	0.312
6.9	❖ පරිසර හිතකාමී නිවාස ව්‍යාපෘතිය	01	127	0.381
	පුහුණු වැඩසටහන් සහ සම්මන්ත්‍රණවල මුළු එකතුව		**1793**	**17.391**
07	**අනෙකුත් ආදායම්**			
7.1	❖ පහසුකම් කුළියට දීම (ශ්‍රවණාගාරය, සම්මන්ත්‍රණ ශාලා, පරිගණක රසායනාගාරය ආදී)			2.266
7.2	❖ පහසුකම් කුළියට දීම නේවාසිකාගාර පහසුකම්)			1.207
7.3	❖ ස්ථානීය වාරිකය			1.160
7.4	❖ ප්‍රකාශන අළෙවිය			0.129
	එකතුව			**4.762**
	මුළු එකතුව			**22.153**

6.5 මානව සම්පත් සහ පරිපාලන අංශය

සිඩා (CIDA) ආයතනයේ මානව සම්පත් සංවර්ධනය සහ පරිපාලනයට අදාළ කාර්යයන් එම ආයතනයේ මානව සම්පත් සහ පරිපාලන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවරා ඇත. මානව සම්පත් සැළසුම, මානව සම්පත් සංවර්ධනය සහ සම්පත් ඉපැයීම, සංරක්ෂණය, ඒවායේ උපරිම ප්‍රයෝජන ගැනීම ආදිය සඳහා උපාය මාර්ගයක් පැහැදිළිව ඉදිරිපත් කිරිම අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රධාන කර්තව්‍යයක් වේ. ආයතනයේ මානව සම්පත සහ පරිපාලන කාර්යයන්ගේ මනා ක්‍රියාකාරිත්වය මඟින් කළමනාකාරිත්වයට උපාය මාර්ගගත, ව්‍යාපාර සහ මෙහෙයුම් අදියරයන්හි තීරණ වලට එළඹීමට හැකි වී ඇත.

වසර 2015 තුළ සිදුකරන ලද කැපී පෙනෙන කාර්යයන් පහත දැක්වේ.

○ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදි සමාජවාදි ජනරජයේ අංක 1896/19 දරන 2015.01.06 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය ප්‍රකාරව 2014.12.29 වන දින සිට බලාත්මක කෙරුණු 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි ප්‍රතිපාදනයන්ට අනුව වඩාත් පුළුල් වූ පරාසයකින් සහ බලය පැවරුමකින් යුක්තව ඉක්ටාඩ් හි නෛතික අනුප්‍රාප්තිකයා වශයෙන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA) ස්ථාපිත කරන ලදි. මානව සම්පත සහ මූල්‍ය කටයුතුවලට අදාළව සිඩා (CIDA) පනත ක්‍රියාවට නැංවීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ගයක් පිළිබඳව කාර්ය මණ්ඩලය දැනුවත් කිරීමේ අරමුණින් සව්සිරිපාය ශ්‍රවණාගාරයේ දී රැස්වීමක් 2015.04.22 දිනැතිව පවත්වන ලදි.

○ ඉහත සඳහන් පනතෙහි 65(2) උප වගන්තියේ ප්‍රතිපාදනයන්ට අනුව තව විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාවට ළඟා නොවූ සියළුම සේවක සේවිකාවන්ට ඉහත නියෝගයෙහි නිශ්චිතව දක්වා ඇති දිනයට පෙර දින දක්වා එම සේවකයින්ට අදාළ වන කොන්දේසි සහ නියමයන්ගේ වාසිසහගත තත්ත්වයන්ට කිසිඳු අඩුවක් නොවන පරිදි සිඩා(CIDA)හි රැකියා අවස්ථාවක් පිරිනමා ඇත.

රැකියා ලබාදීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව පහත දැක්වේ. :

අංකය	කාර්ය මණ්ඩලය	වැටුප් කේතය	අංකය
1	ජ්‍යෙෂ්ඨ කළමණාකරු	HM 2-1	01
2	ජ්‍යෙෂ්ඨ කළමණාකරු	HM 1-3	05
3	මධ්‍යම කළමණාකරු	MM 1-1	18
4	කණිෂ්ඨ කළමනාකරු	JM 1-2	24
5	කළමනාකරණ සහකාර (කාර්මික)	MA 2-2	16
6	කළමනාකරණ සහකාර (කාර්මික නොවන)	MA 1-2	71
7	ප්‍රාථමික මට්ටම (පුහුණු)	PL-3	66
8	ප්‍රාථමික මට්ටම (අර්ධ පුහුණු)	PL-2	04
9	ප්‍රාථමික මට්ටම (නුපුහුණු)	PL-1	34
10	ආරක්ෂක කාර්ය මණ්ඩලය		23
	එකතුව		**262**

- සිඩා (CIDA)හි සේවය කිරීම සඳහා අවස්ථාවක් පිරිනමනු ලබන බව යම් සේවකයෙකුට දැනුම් දුන් දින සිට මාස 3 ක් ඇතුළත ඉහත පනතෙහි අනු වගන්ති 65(2) හි සඳහන් කර ඇති ඕනෑම සේවකයෙකුට තමාගේ කැමැත්ත පරිදි සිඩා(CIDA), හි කාර්ය මණ්ඩලයෙන් ඉවත් විය හැක. ඉහත පනතෙහි අනු වගන්ති 65(3) හි සඳහන් කර ඇති පරිදි අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සමඟ ක්‍රියාත්මක කිරීමට නියමිත ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීමේ පරිපාටිය යටතේ එම සේවකයාට වන්දි ගෙවනු ලැබේ.
- සිඩා (CIDA)අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරන ලද කමිටුවක් විසින් යෝජිත ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීමේ ක්‍රමවේදය සිඩා (CIDA) අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟත්වය සමඟ අමාත්‍ය මණ්ඩලය වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති අතර ඒ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂාවෙන් සිටියි.

- ඉක්ටාඩ්(ICTAD),සිඩා(CIDA)වශයෙන් පරිවර්තනය වීම ආයතනයේ වැදගත් සිදුවීමකි. ඉක්ටාඩ් (ICTAD) අධ්‍යක්ෂ මණ්ඩලයේ තීරණයක් මත මෙම ආයතනයේ වැඩි දියුණුව තකා අද දක්වාම තම වටිනා ශ්‍රමයෙන් දායක වන ඉක්ටාඩ්හි පෙර සේවය කළ සභාපති, අධ්‍යක්ෂ ජනරාල්, කළමනාකාර අධ්‍යක්ෂ ඇතුළුව අද දක්වා සේවයේ නිරත කාර්ය මණ්ඩලය මෙන්ම 2014 වසරේදී දිගු කලක් සේවය කොට විශ්‍රාම ගිය කාර්ය මණ්ඩල සාමාජිකයින්ට ද ඇගයීමට ලක්කිරීම හා පිළිගැනීම සඳහා අභිනන්ද උත්සවයක් සච්සිරිපාය ශ්‍රවණාගාරයේ දී 2015.12.15 දින පවත්වන ලදි.
    - සේවා කාලය වසර 15-20
    - වසර 20 ට වැඩි සේවා කාලය

- සාමුහික ක්‍රියාදාමයන් වශයෙන් සිඩා (CIDA)පනත, ක්‍රියාත්මක කිරීම අරමුණු කොට සිඩා ඒකාබද්ධ සැලැස්ම අභ්‍යන්තර ව්‍යායාමයක් වශයෙන් සකසා ඇත.

- සිඩා(CIDA) පනතෙහි අරමුණු ළඟාකර ගැනීම සඳහා ඒකාබද්ධ සැළසුමට සමාන්තවර සිඩාහි(CIDA)සංවිධානාත්මක ආකෘතියද වැඩි දියුණු කරන ලදි. සිඩා හි (CIDA)ඒකාබද්ධ සැළැස්ම හා සංවිධානාත්මක ආකෘතියට අනුව නව කාර්ය මණ්ඩල තනතුරු සහ සේවක ගණය හඳුන්වා දී ඇත. පසුව එක් එක් කාර්ය මණ්ඩල සාමාජිකයින්ට තම අදාළ කාර්යය කාර්යක්ෂමව සහ ඵලදායි ලෙස ඉටුකිරීමසඳහා ඒවා නිශ්චිතව හඳුන්වා දෙමින් විස්තරාත්මක රැකියා විස්තර පිළියෙල කර ඇත.
- සිඩා(CIDA)හි බඳවා ගැනීම් පරිපාටිය කෙටුම්පත් කර ඇති අතර එය අදාළ අමාත්‍යාංශය මඟින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට යැවීමට පෙර අදාළ විගණන සහ කළමනාකරණ කමිටුව සහ කළමනාකරණ මණ්ඩල යටතේ විශ්ලේෂණාත්මක අවස්ථාවේ පවතී.

නව පියවරයන්

○ සිඩා(CIDA) කාර්ය මණ්ඩලයේ හැකියාවන් සහ කාර්ය සාධනය පුළුල් කිරීම අරමුණු කොට 2015 වසර තුළ නව පියවර කිහිපයක් හඳුන්වා දී ඇත.

1.සිඩා(CIDA)හි කාර්යයන් සඳහා ඍජුව අදාළ වන්නා වූ විවිධ විෂය ක්ෂේත්‍රයන්ගේ අභ්‍යන්තර සහ බාහිර සම්පත් දායකයින්ගේ දායකත්වය මත අඛණ්ඩව වෘත්තිය සංවර්ධන වැඩසටහන් පවත්වනු ලබයි. ඉන් ඇතැම් වැඩසටහන් මඟින් සේවකයින්ගේ හැකියාවන් සහ ආකල්ප වර්ධනය කරයි.

2. සේවා ස්ථානයේදී සේවකයින් මුහුණ පාන ගැටළු පිළිබඳ දුක් ගැනවිලිවලට සවන් දී ඒවාටද අපක්ෂපාතීව, ස්වාධීනව, පාරදෘශ්‍යභාවයකින් යුතුව විසඳා ආයතනය තුළ මනා පරිසරයක් ගොඩනැගීම සඳහා සිඩා (CIDA)හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දුක්ගැනවිලි සහන කමිටුව නමින් අනු කමිටුවක් ස්ථාපිත කර ඇත. මෙම කමිටුව වෙත අභියාචනා 5 ක් ඉදිරිපත් කර ඇති අතර කමිටු නිර්දේශ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට තිබේ.

3. ස්වයං ඇගයීම තුළින් 'කාර්ය සාධනය ඇගයීම'නමින් කණිෂ්ඨ කළමණාකරුවන් සහ ඉහළ සේවකයින් සඳහා කාර්ය සාධනය මැනීමේ නව ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත. මෙහි පළවෙනි වාර්තාගත කාලවකවානුව 2015 දෙසැම්බර් 1 සිට 2016 මාර්තු 31 දින දක්වා වන අතර පසුව අනාගතයේදී සිදුකළ හැකි වෙනස්කම් සහ අනාගත භාවිතය සඳහා එහි සාර්ථකත්වය ඇගයීමට ලක්කරනු ලබයි.

2015.12.31 දින වන විට ස්ථිර කාර්ය මණ්ඩලයේ සම්පූර්ණ ගණන 260 කි. (සභාපතිතුමා සහ ක්‍රියාකාරී අධ්‍යක්ෂ ඇතුළුව)

2015.01.01 දින සිට 2015.12.31 දින දක්වා කාලය තුළ සේවකයින් 5 දෙනෙකු බඳවා ගත් අතර සේවකයින් 5 දෙනෙකු විශ්‍රාම ගොස් (7) හත්දෙනෙකු ආයතනයෙන් ඉල්ලා අස් වී ඇත.

- **2015.12.31 දිනට ස්ථිර කාර්යමණ්ඩලයේ සංක්ෂිප්ත වාර්තාව**

රැකියා වර්ගය	ගණන
ජ්‍යෙෂ්ඨ කළමනාකරු (HM)	06
කළමනාකරු (MM)	17
කණිෂ්ඨ කළමනාකරු (JM)	24
කළමනාකරණ සහකාර(කාර්මික)	16
කළමනාකරණසහකාර(කාර්මික නොවන)	71
ආරක්ෂක සේවා	23
ප්‍රාථමික මට්ටම (පුහුණු) (PL 3)	63
ප්‍රාථමික (අර්ධ පුහුණු) (PL 2)	04
ප්‍රාථමික (නුපුහුණු) (PL 1)	34
එකතුව	**258**



කාර්ය මණ්ඩලය වෙත පවරනු ලබන කාර්යයන් ඔවුන්ගේ දැනුම සහ කුසලතාවයන් අතර ඇති පරතරය හඳුනාගැනීමෙන් අනතුරුව ඔවුන්ගේ හැකියාවන් නංවාලීම සඳහා 2015 වසරේදී දේශීය හා

විදේශීය පුහුණු වැඩසටහන් සංවිධානය කරන ලදි. එම තොරතුරු ඇමුණුමෙහි අන්තර්ගත කොට ඇත.

❖ **වැඩසටහන් අංක 01 -** ගිවිසුම්නීතිය සහ සමාගම් නීතිය – සම්පත් දායකයෙකු වශයෙන් ඉංජිනේරු ආචාර්ය ආනන්ද රණසිංහ මහතා විසින් කණිෂ්ඨ කළමනාකරුවන් සහ ඉහළ කාර්ය මණ්ඩලය සඳහා සිඩා (CIDA)ශ්‍රවණාගාරයේදී ගිවිසුම් නීතිය සහ සමාගම් නීතිය පිළිබඳ දේශණයක් පවත්වන ලදි.

❖ **වැඩසටහන් අංක 02 –** කාර්යාල ක්‍රමවේදයන්ට සහ සේවකයින්ගේ එදිනෙදා ජීවිතයට අදාළවන්නා වූ නීතිමය කරුණු පිළිබඳව දැනුම වර්ධනය කිරීමේ අරමුණින් ''නීතිය සහ යුක්තිය පිළිබඳ'' වැඩසටහන් 2 ක් සිඩා (CIDA)ශ්‍රවණාගාරයේ දී 2015.06.08 සහ 2015.07.09 දිනැතිව පවත්වන ලදි. ජී. වන්නිනායක මහතා, උප සභාපති /ක්‍රියාකාරි අධ්‍යක්ෂ විසින් මෙම වැඩසටහන මෙහෙයවන ලදි.

❖ **වැඩසටහන්අංක 03 -** කණිෂ්ඨ කළමනාකරු සහ ඉහළ කාර්ය මණ්ඩල ගණයන්ට අයත් නිලධාරින්ගේ අධ්‍යයන වාර්තා ලිවීමේ හැකියාව නංවාලීම සඳහා ''වාර්තා රචනය'' පිළිබඳ වැඩසටහනක් සිඩා (CIDA)සභාපති, ඉංජිනේරු සී.එච්.ඩී. තිසේරු විසින් සිඩා(CIDA) සම්මන්ත්‍රණ ශාලාවේදී 2015.06.10 දින පවත්වන ලදි.

❖ **වැඩසටහන් අංක 04-** ධනාත්මක ආකල්ප සහ කණ්ඩායම් වැඩ දිරිගැන්වීම, යන මාතෘකාව යටතේ කොළඹ විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සිරි හෙට්ටිගේ මහතා විසින් සිඩා (CIDA)ශ්‍රවණාගාරයේ දී 2015.09.23 දින වැඩසටහනක් පවත්වන ලදි.

❖ **වැඩසටහන් අංක 05–** රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය පිළිබඳ වැඩසටහනක් අයිවන් තිසේරා මහතා, මුදල් අමාත්‍යාංශයේ විශ්‍රාමික අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ප්‍රසම්පාදන ඒජන්සියේ හිටපු අධ්‍යක්ෂ විසින් සිඩා (CIDA)සම්මන්ත්‍රණ ශාලාවේදී 2015.10.20 හා 2015.10.23 දිනැතිව පවත්වන ලදි. ජ්‍යෙෂ්ඨ කළමනාකරු, කණිෂ්ඨ කළමනාකරු යන සේවා ගණයන්ගේ කාර්ය මණ්ඩලයට අයත් නිලධාරින් ඇතුළුව අදාළ කළමනාකරණ සහකාර (කාර්මික) සහ (කාර්මික නොවන) සේවකයින් මේ සඳහා සහභාගි වූහ.

❖ **වැඩසටහන් අංක 06 - ටෝස්ට් මාස්ටර්ස් 'කථනය හැඩගැස්වීම' පිළිබඳ පාඨමාලාව**

කළමනාකරණ කාර්ය මණ්ඩලයේ පොදු කථන හැකියාව නංවාලීම සඳහා එක් දිනක වැඩසටහනක් පවත්වන ලදි.
ඉහත වැඩසටහන් වලට අමතර ව ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සම්පත් දායකයින්ගේ සහාය තුළින් බඳවා ගැනීම් පරිපාටියට අනුව අදාළ සේවා ගණයන්ගේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයන්ට ඍජුවම බලපාන්නා වූ කරුණු සම්බන්ධයෙන් පහත වැඩසටහන් පවත්වන ලදි.

- ❖ **වැඩසටහන් අංක 1-පොදු කාර්යාල ක්‍රම සහ හැසිරීම**

  තිලිණි කරන්නාගොඩ, උපදේශක (ශ්‍රී.ලං.ප.සේ) ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් මේ පිළිබඳව වැඩසටහනක් ප්‍රධාන කාර්යාලයේදී සහ OTC හි 2015.06.24 සහ 2015.08.25 දිනැතිවPL 3, PL 2 & PL 1 යන කාර්ය මණ්ඩල ගණයන් සඳහා පවත්වන ලදි.

- ❖ **වැඩසටහන් අංක 02 –**කාර්යාල ක්‍රමවේදය සහ පොදු පරිපාලනය ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ උපදේශක ඒ.එච්.එච්.එල්.අබේරත්න මහතා විසින් කළමනාකරණ සහකාර (කාර්මික නොවන) සේවක ගණයන් සඳහා මෙම වැඩසටහන සිඩා (CIDA)ශ්‍රවණාගාරයේ දී 2015.06.24 දින පවත්වන ලදි. .

- ❖ **වැඩසටහන් අංක 03 –කාර්යාල ක්‍රමවේදය සහ පොදු පරිපාලනය**

මෙම පාඨමාලාව තිලිණි කරන්නාගොඩ මිය විසින් ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ උපදේශක (ශ්‍රී.ලං.ප.සේ) කණිෂ්ඨ කළමනාකරු සහ ඉහළ කාර්ය මණ්ඩල ගණයන් සඳහා සිඩා (CIDA)ශ්‍රවණාගාරයේදී 2015.06.30 දින පවත්වන ලදි.

- ❖ **වැඩසටහන් අංක 04 - ගිණුම් ක්‍රම, මූල්‍ය රෙගුළාසි සහ රාජ්‍ය ගිණුම් කළමනාකරණය පිළිබඳ පාඨමාලාව**

  පී.ඩී. කුලරත්න මහතා විසින් ජ්‍යෙෂ්ඨ උපදේශක/ගිණුම්, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය විසින් සිඩා(CIDA)ශ්‍රවණාගාරයේදී මධ්‍යම කළමනාකරුවන්, කණිෂ්ඨ කළමනාකරුවන් සහ කළමනාකරණ සහකාරවරුන් සඳහා සිඩා (CIDA)ශ්‍රවණාගාරයේදී 2015.07.23 දින පවත්වන ලදි.

- **විදේශ පුහුණු අවස්ථා**

ආයතනයේ පොදු සමාජීය වගකීමක් වශයෙන් NAITAහි කාර්මිකයින්, පරිගණක යෙදවුම් සහායකයින් සහ පිළිගැනීමේ නිලධාරි තනතුරුවලට අයත් ආධුණික පුහුණුවන්නන් සඳහා පුහුණු අවස්ථාවන් ලබාදීමට ආයතනය සමත් වී ඇත.

ආයතනයට ආදායම් ඉපයීම සඳහා මානව සම්පත් සහ පරිපාලන අංශ මඟින් ද දායකත්වය සපයයි. ශ්‍රවණාගාරය, සම්මන්ත්‍රණ ශාලා, සාකච්ඡා කාමර සහ කතරගම නිවාඩු නිකේතනය කුළියට දීම සහ නිසි කළමනාකරණය මඟින් රු. 3,646,445.00 මුදලක් උපයාගෙන ඇත.

2015 වසරේ ලබා දී ඇති දේශීය පුහුණු අවස්ථා

අනු අංකය	නම	තනතුර	අංශය	වැඩසටහන	ආයතනය	දිනය/කාලය	පාඨමාලා ගාස්තුව	අදහස්
1	ඩබ්.කේ.වී. ජයතිස්ස මෙනවිය	පුස්තකාලයාධිපති -II	මාන. ස. සහ පරිපාලන	ශ්‍රී ලංකාවේ පුස්තකාලයන්හි පුස්තකාල කළමනාකරණය සඳහා භාවිතා කරනු ලබන මෘදුකාංග පිළිබඳ සම්මන්ත්‍රණය	ජාතික විද්‍යා පදනම	2015.01.30	–	–
2	එස්.කේ අමරසේකර මහතා	අධ්‍යක්ෂ (සංවර්ධන)	සංවර්ධන	CIOB 4 වන ලෝක ඉදිකිරීම් සම්මන්ත්‍රණය - 2015	ඉදිකිරීම් පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය	2015.06.12 - 13	10,000.00	–
3	ආර්.බී.එම්. ගුණවර්ධන මහතා	අධ්‍යක්ෂ (උපදේශණ සේවා)	උපදේශණ සේවා	CIOB 4 වන ලෝක ඉදිකිරීම් සම්මන්ත්‍රණය - 2015	ඉදිකිරීම් පිළිබඳ ශ්‍රී ලංකා ආයතනය	2015.06.12 - 13	10,000.00	–
4	සී.එස්. කරුණාරත්න මෙනවිය	නි. අධ්‍යක්ෂ (උපදේශණ සේවා)	උපදේශණ සේවා	ගිවිසුම් සහ ප්‍රසම්පාදන කළමනාකරණය පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව (පාඨමාලා අංක 6)	සිඩා	2015	–	
5	කේ.ජී.සී. අල්විස් මෙනවිය	නීති නිලධාරි සහ ගොඩනැගිලි අංශය	මානව සම්පත් සහ පරිපාලන	_ එම _	සිඩා	2015	–	
6	පී.ජී.පී. වීරසේකර මහතා	අධ්‍යක්ෂ /කළමනාකරු	සීට්‍රැක්	_ එම _	සිඩා	2015	–	
7	ආර්.එම්.ආර්. බණ්ඩාර මහතා	කාර්මික සහකාර	ඕ.ටී.සී.	_ එම _	සිඩා	2015	–	
8	ඩබ්.කේ.වී. ජයතිස්ස මෙනවිය	පුස්තකාලයාධිපති -II	මානව සම්පත් සහ පාලන	තොරතුරු තාක්ෂණයේ නව අංශයන් පිළිබඳ සම්මන්ත්‍රණය	ජාතික විද්‍යා පදනම	2015.07.13	–	–
9	ජී.ජී.පී.එන්. සුමිත් මහතා	කළමනාකරණ සහකාර	මානව සම්පත් සහ පාලන	වියදම් සහ ගෙවීම් ක්‍රමය	පී.ජී.ආර්.ජී. ආයතනය	2015.07.23	6,000/-	–
10	එල්.බී.පී. බාලසූරිය මිය	ගිණුම් නිලධාරී	මූල්‍ය	වියදම් සහ ගෙවීම් ක්‍රමය	පී.ජී.ආර්.ජී. ආයතනය	2015. 09. 08	5,400.00	–
11	කේ.කේ. චන්ද්‍රකාන්ති මිය	කළමනාකරණ සහකාර/වැඩබලන/ගිණුම් නිලධාරි	මූල්‍ය	වියදම් සහ ගෙවීම් ක්‍රමය	පී.ජී.ආර්.ජී. ආයතනය	2015. 09. 09	5,400.00	–
12	ඩී.ජී.එස්.කේ. කරුණාරත්න මිය	රාජ්‍ය කළමනාකරණ සහකාර	මූල්‍ය	වියදම් සහ ගෙවීම් ක්‍රමය	පී.ජී.ආර්.ජී. ආයතනය	2015. 09. 10	5,400.00	–
13	එච්.ජී.ඕ.අයි. පෙරේරා මෙනවිය	රාජ්‍ය කළමනාකරණ සහකාර	මූල්‍ය	වියදම් සහ ගෙවීම් ක්‍රමය	පී.ජී.ආර්.ජී. ආයතනය	2015. 09 .11	5,400.00	–
14	ආර්.ජී.කේ. එස්.එච්.එම්. රණතුංග මෙනවිය	රාජ්‍ය කළමනාකරණ සහකාර	මූල්‍ය	වියදම් සහ ගෙවීම් ක්‍රමය	පී.ජී.ආර්.ජී. ආයතනය	2015. 09. 12	5,400.00	–
15	කේ.ජී.එස්. ස්ටැන්ලි මහතා	සහකාර අධ්‍යක්ෂ	කර්මාන්ත පුහුණුව	සෞඛ්‍ය සහ ආරක්ෂිත කළමනාකරණය පිළිබඳ පාඨමාලාව	අයි.ඊ.එස්. එල්	2015.08.05, 08 -	22,000.00	–
16	ඩබ්.කේ.වී. ජයතිස්ස මෙනවිය	පුස්තකාලයාධිපති -II	මානව සම්පත් පාලන	පුස්තකාල සහ තොරතුරු තාක්ෂණය පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණය	ශ්‍රී ලංකා පුස්තකාල සංගමය	2015.09.17 - 18	6,000.00	–

17	අයි.එම් ගුණසේකර මිය	වැඩබලන සහකාර අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)	මානව සම්පත් පාලන	මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කිරීම (අවසන් ගිණුම්) 2015 වසර සඳහා	පී.ආර්.ඒ.ජී. ආයතනය	2015.09.29	6,000.00	–
18	ඩබ්.ඒ.ඒ. විජේසිංහ මහතා	පරිපාලන නිලධාරී	මානව සම්පත් සහ පාලන	මානව සම්පත් කළමනාකරණය පිළිබඳව උසස් ජාතික ඩිප්ලෝමාව	එන්.අයි.බී.එම්	2014 .-2015 සැප්තැම්බර්	55,000.00	
	අඛණ්ඩ සේවා සංවර්ධන වැඩසටහන							
20	කණිෂ්ඨ කළමනාකරණ සහ ඉහළ කාර්ය මණ්ඩල ගණයන්			ගිවිසුම් නීතිය සහ සමාගම් නීතිය	සිඩා	2015.04.30	6500.00	
21	සියළුම කාර්ය මණ්ඩලය			නීතිය සහ යුක්තිය		2015.06.08 සහ 2015.07.09		
22	කණිෂ්ඨ කළමනාකරු සහ ඉහළ කාර්ය මණ්ඩල වර්ග			වාර්තා ලිවීම		2015.06.10		
23	සියළුම කාර්ය මණ්ඩලය			දිරිමත් කිරීම, ධනාත්මක ආකල්ප සහ කණ්ඩායම් වැඩ		2015.09.23		
24	කණිෂ්ඨ කළමනාකරු සහ ඉහළ කාර්ය මණ්ඩල වර්ග සහ කළමනාකරණ සහකාර තනතුරු වලට අදාළ කාර්ය මණ්ඩල			රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රමවේදය		2015.10.20 2015.10.23	30,000.00	
25	කළමනාකරණ කාර්ය මණ්ඩලය			ටෝස්ට් මාස්ටර් කථන සැකසුම් පාඨමාලාව		දින10	200,000.00	
	කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා පාඨමාලා පැවැත්වීම							
26	ප්‍රාථමික මට්ටමේ කාර්ය ගණය			සාමාන්‍ය කාර්යාල ක්‍රමවේදය සහ විනය	සිඩා	2015.06.2420 15.08.07	24,000.00	කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා අභ්‍යන්තර වැඩසටහන්
27	කළමනාකරණ සහකාර (කාර්මික) (කාර්මික නොවන) කාර්ය මණ්ඩල ගණයන්			කාර්යාල ක්‍රම සහ සාමාන්‍ය පරිපාලනය				
28	කණිෂ්ඨ කළමනාකරණ සහ ඉහළ කාර්ය මණ්ඩල ගණය			කාර්යාල ක්‍රමවේදය සහ සාමාන්‍ය පරිපාලනය		2015.06.30		
29	මධ්‍යම කළමනාකරණ, කණිෂ්ඨ කළමනාකරණ, කළමනාකරණ සහකාර			ගිණුම් ක්‍රම, මූල්‍ය රෙගුලාසි සහ රාජ්‍ය මූල්‍ය කළමනාකරණය		2015.07.23		
30	ප්‍රාථමික මට්ටමේ කාර්ය මණ්ඩලය			සාමාන්‍ය කාර්යමණ්ඩල ක්‍රමවේදය සහ හැසිරීම	ඕ.ටී.සී.	2015.08.07		

2015 වසර තුල සපයා ඇති විදේශ පුහුණු අවස්ථා

අනු අංකය	නම	තනතුර	අංශය	පුහුණු පාඨමාලාව	දිනය/කාලය
01	ජේ.ඒ.එන්.එන්.කේ. ජයකොඩි මිය	අධ්‍යක්ෂ (ඉලෙක්ට්‍රොනික යාන්ත්‍රික සේවය)	සීටැක්	යන්ත්‍ර පිරික්සීම සහ පුහුණු පාඨමාලාව - ජපානය	2015.04.06 - 2015.04.10
02	ආර්.පී.පී.පෙරේරා මහතා	පුහුණු නිලධාරි	සීටැක්	යන්ත්‍ර පිරික්සීම සහ පුහුණු පාඨමාලාව - ජපානය	2015.04.06 - 2015.04.11
03	ඩී.පී.කේ. ඔබේසේකර මහතා	පුහුණු නිලධාරි	සීටැක්	යන්ත්‍රෝපකරණ පරීක්ෂාව සහ පුහුණු වැඩසටහන - ජපානය	2015.04.06 - 2015.04.12
04	එච්.එන්.උදය කුමාර මහතා	උපදේශක	සීටැක්	යන්ත්‍රෝපකරණ පරීක්ෂාව සහ පුහුණු වැඩසටහන - ජපානය	2015.04.06 - 2015.04.13
05	වාස්තු විද්‍යාඥ එච්.කේ.බාලචන්ද්‍ර මහතා	අධ්‍යක්ෂ ජනරාල්	මානව සම්පත් සහ පාලන	ආසියානු නගරවල වැය කළ හැකි නිවාස පිළිබඳ දැනුවත් කිරීමේ පාඨමාලා	2015.12.06 - 2015.12.19

6.6 මූල්‍ය අංශය

1.1 වාර්තාමය වගන්තිය

2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත මගින් (ඉක්ටාඩ්) ඉදිකිරීම් අභ්‍යාස සහ සංවර්ධන ආයතනය ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (සිඩා)යන නමට පරිවර්තනය කරන ලදි. වර්තමානයේ ඉක්ටාඩ්හි නෛතික අනුප්‍රාප්තිකයා වශයෙන් සිඩා ක්‍රියා කරයි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් බලාත්මක කරනු ලැබූ 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතෙහි ප්‍රතිපාදන යටතේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (සිඩා) රාජ්‍ය සංස්ථාවන් වශයෙන් ස්ථාපිත කරන ලදි. 2014 අංක 33 දරන ඉහත පනතෙහි 1 කොටස යටතේ 2015 ජනවාරි 06 දිනැති අංක 1896/19 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත 2014 දෙසැම්බර් මස 29 වන දින සිට ක්‍රියාත්මක විය. නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශයේ විෂය පථය යටතට ගැනෙන සිඩා ආයතනය අංක 123, ''සව්සිරිපාය'' විජේරාම මාවත, කොළඹ 07 යන ලිපිනයෙහි ස්ථාපිත කොට ඇත.

1.2 ප්‍රධාන කාර්යයන් සහ ස්වභාවය

'සිඩා' හි මෙහෙවර වන්නේ, ජාතික ඉදිකිරීම් ප්‍රතිපත්තිය හරහා රෙගුලාසි පැනවීම, ශක්‍යතා වර්ධනය සහ නැංවීම මඟින් තිරසාර ජාතික සංවර්ධනයකට ඉවහල් වන්නා වූ ගෝලීය සහ දේශීය අවශ්‍යතාවයන් සපුරාලිය හැකි උසස් ප්‍රමිතීන් ප්‍රවර්ධනය තුළින් ශක්තිමත් මෙන්ම වෘත්තීය තත්ත්වයෙන් යුතු කර්මාන්තයන් සහතික වීම තුළින් ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් කර්මාන්තය සඳහා උපායශීලී නායකත්වයක් ලබාදීම.''

1.3 සේවක සංඛ්‍යාව

2015 දෙසැම්බර් 31 දිනට සිඩාහි සේවක සංඛ්‍යාව 256 විය. 2014 වසර සාපේක්ෂ ගණන 263 කි.

1.4 මූල්‍ය වසර

2015 දෙසැම්බර් 31 දිනට අවසන් මාස 12 ක කාලය සිඩා හි මූල්‍ය වසර ලෙස දැක්වේ.

2. වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

2.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ පදනම

සිඩා හි මූල්‍ය ප්‍රකාශනය ඓතිහාසික පිරිවැය පදනම්ව ශ්‍රී ලංකා රුපියල් වලින් සකස් කර ඉදිරිපත් කර තිබේ.

2.2 'සිඩා' හි මූල්‍ය ප්‍රකාශනය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කර ඇත. එමගින් ආවරණය නොවන ක්ෂේත්‍රයන් සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ ගිණුම් ප්‍රමිතීන් අනුගමනය කොට ඇත.

2.3 වත්කම් සහ තක්සේරුකරණයේ පදනම

2.3.1 මූල්‍ය ප්‍රකාශනයෙහි දේපළ යන්ත්‍ර හා උපකරණ හීනවන ක්ෂයවීම් පිරිවැය පදනම්ව වාර්තාකර ඇත.

දේපළ, යන්ත්‍ර සහ උපකරණ සඳහා දරන පිරිවැය ප්‍රතිප්‍රවාණයින අගයන් හෝ ඕනෑම අහඹු මිලදී ගැනීමකදී දරන පිරිවැයට සමානය.

2.3.2 සියළුම දේපළ, යන්ත්‍ර සහ උපකරණ මත සරල මාර්ග ක්‍රමය යොදමින් ක්ෂයවීම් ප්‍රතිපාදන ගණනය කර ඇත. ඒවායේ ඉදිරියට ඇස්තමේන්තුගත සඵල ආයුකාලය අනුව එම ක්ෂයවීම් ප්‍රතිපාදන සමාන වාරික අගයන්ගෙන් අඩුකර ගැනීම සඳහා එසේ ගණනය කර ඇත. 2015 වසර සඳහා එම අගයන් ක්‍රියාත්මක වන අයුරු පහත පරිදි වේ,

විස්තරය	**ආයු කාලය**	**වටිනාකම අනුපාතය (%)**
භූමිය		0.0
ගොඩනැගිලි වැඩි දියුණුව	40	2.5
ලී බඩු සහ කාර්යාල උපකරණ	5	20.0
යන්ත්‍රෝපකරණ සහ උපකරණ	8	12.5
ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ	4	25.0
මෙවලම් සහ ආයුධ	5	20.0
මෝටර් රථ	8	12.5

පුස්තකාල ග්‍රන්ථ

දේපළ, යන්ත්‍ර සහ උපකරණ යන එක් එක් අයිතමයන්ගේ විශේෂිත කොටස් සඳහා ක්ෂයවීම් අගයන් වෙන් වෙන්ව ගණනය කරනු ලැබේ. ඒවායේ ක්ෂයවීම් ආරම්භ වන්නේ භාවිතය ඇරඹීමත් සමගය. සින්නක්කර භූමි සඳහා ක්ෂයවීම් සැළකිල්ලට නොගැනේ.

2.4 **ස්ථාවර වත්කම්**

සිඩා සතුව පවතින ස්ථාවර වත්කම් පහත දැක්වේ.

දේපළෙහි විස්තරය	**අයිතිය/භාරකාරත්වය**	**තත්වය**
ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) ප්‍රධාන ගොඩනැගිල්ල 'සව්සිරිපාය' කොළඹ 07 යන ලිපිනයෙහි ස්ථාපිත කර ඇත.	මෙම ගොඩනැගල්ල ඉක්ටාඩ් විසින් ඉදිකිර ඇති අතර ඉක්ටාඩ්/සිඩා කාර්යාලය සඳහා එය භාවිතා කරයි.	2016.05.14 දින අවසන් වීමට නියමිත සිඩා (CIDA) සහ ටවර්හෝල් පදනම යන ආයතන දෙක ඇතුළත් දේපළ නාගරික සංවර්ධන අධිකාරිය මඟින් බදු පදනම මත ලබා ගෙන ඇත.
බත්තරමුල්ලෙහි පිහිටි නිවාස සැළසුම් සහ ගොඩනැගිලි මධ්‍යස්ථානය (CHPB)	ඉක්ටාඩ් මඟින් ඉදිකරන ලද ගොඩනැගිල්ල ඉක්ටාඩ්/සිඩා ආයතන ස්ථාපිත කර ඇත.	නාගරික සංවර්ධන අධිකාරියට අයත් දේපළ 99 අවුරුදු බදු යටතේ ඉක්ටාඩ් විසින් බදු පදනම මත ලබා ගෙන ඇත.
ක්‍රියාකරු පුහුණු විද්‍යාලය, ගල්කුලම (ඕ.ටී.සී)	රජය සතු භූමියකි. එහි ස්ථාපිත ගොඩනැගිල්ල ඉක්ටාඩ්/සිඩා විසින් පදිංචිය සඳහා භාවිතා කරයි.	තිරප්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ විෂය පථය යටතට මෙම භූමිය අයත් වේ.

ඉදිකිරීම් යන්ත්‍ර උපකරණ පුහුණු මධ්‍යස්ථානය (සීට්‍රැක්)	ඉක්ටාඩ් විසින් ඉදිකරන ලද ගොඩනැගිල්ල ඉක්ටාඩ්/සිඩා යන ආයතන පිහිටුවා ඇත.	නාගරික සංවර්ධන අධිකාරියට අයත් භූමිය ඉක්ටාඩ් විසින් 99 අවුරුදු බදු යටතේ ලබාගෙන ඇත.
දහයියාගම නිල නිවස	ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් භූමිය සහ ගොඩනැගිල්ල ඉක්ටාඩ්/සිඩා යන ආයතන ස්ථාපිත කොට ඇත.	භූමිය සහ ගොඩනැගිල්ල ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් එකකි.
කතරගම නිල නිවස	භූමිය ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් එකකි. (ජා.නි.ස.අ.)ගොඩනැගිල්ල ඉක්ටාඩ් විසින් ඉදිකර ඇති අතර ඉක්ටාඩ්/සිඩා යන ආයතන ස්ථාපිත කර ඇත.	ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් භූමියකි.

2.5 භාණ්ඩ ලේඛණය

සාමාන්‍ය පිරිවැය පදනම මත අමතර කොටස්, නඩත්තු උපකරණ, සනීපාරක්‍ෂක ද්‍රව්‍ය සහ ලිපිලේඛණ, තොග ආදිය භාණ්ඩ ලේඛනයේ ඇතුලත් කර ඇත.

2.6 බදු ඉඩම් පිළිබඳව සැළකිල්ලට ගැනීමේදී බදු කාල සීමාවට අයත් සමාන වාරික ප්‍රමාණයකින් බදු වාරිකය කපා හරිනු ලබයි.

2.7 තොග වටිනාකම රු.133,111,692 වේ.

2.8 මුදල් කල හැකි වත්කම්

යම් වත්කමක් ඇස්තමේන්තුගත මුදල් කර ගැනීමේ වටිනාකම හා සමාන අගයකින් නැවත අයකර ගත හැකි බොල් හා අවිනිශ්චිත ශුද්ධ ප්‍රතිපාදන.

2.9 බොල් ණය සහ අවින්ශ්චිත ණය සඳහා ප්‍රතිපාදන

අවිනිශ්චිත සහ බොල් ණය සඳහා ප්‍රතිපාදන ගණනය කර පහත දැක්වෙන ආකාරයෙන් ගිණුම් වල ඉදිරිපත් කර ඇත.

නොගෙවා ඇති කාල සීමාව	**ලබා ඇති ප්‍රතිපාදන**
මාස 12 ට අඩු	-
අවුරුදු1 සිට 2	5%
අවුරුදු2සිට 3	
අවුරුදු3සිට4	
අවුරුදු4සිට 5	100%
අවුරුදු 5ට වැඩි	

2.10 මුදල් සහ මුදල් සාව්‍යයන්

ආයෝජන, බැංකු තැන්පතු මුදල් සහ අත ඉතිරි මුදල් යන තෙවර්ගයෙන්ම මුදල් හා මුදල් සාව්‍යයන් සමන්විතය.

2.11 විලම්භිත ආදායම

විලම්භිත ආදායමෙහි අන්තර්ගත වන්නේ මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන වියදම් සඳහා ලබාදෙන ප්‍රාග්ධන ප්‍රදානයන්ය.

2.12 විශ්‍රාමික පාරිතෝෂිකය

මූල්‍ය ප්‍රකාශනයෙහි විශ්‍රාම වැටුප් පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇත්තේ, සෑම සේවකයෙකුම මුල්‍ය වසරෙහි අවසන් මස උපයා ගන්නා ලද අඩ මසක වැටුප පදනම්ව සම්පූර්ණ කර ඇති එක් එක් වසර සඳහා සේවය ආරම්භ කළ වසරේ සිට අවසන් වසර දක්වා එම අඩ වැටුප හා සමාන වටිනාකමකින් යුතු අගයකින් පාරිතෝෂිකය ගණනය කිරීමෙනි. කෙසේ නමුත් 1983 අංක 12 දරන විශ්‍රාම වැටුප් පාරිතෝෂික පනතට යටත්ව මේ සඳහා සේවකයෙකුට අයිතිවාසිකමක් දැරිය හැක්කේ තමා නොකඩවා වසර 5 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්නම් පමණි.

2.13 රජයේ ප්‍රදාන

2.13.1 පුනරාවර්තන ප්‍රදාන

ආදායම් ගිණුමෙහි රජයෙන් ලැබෙන්නා වූ පුනරාවර්තන දීමනා ඉක්ටාඩ් හි ආදායම් මාර්ගයක් වශයෙන් නිරූපිතය.

2.13.2 ප්‍රාග්ධන ප්‍රදාන

රජයෙන් මුදල් හා එවැනි ආකාරයෙන් ලැබෙන්නා වූ ප්‍රාග්ධන ප්‍රදානයන් විලම්භිත ආදායම වශයෙන් සැළකේ. එය සෑම වත්කමකම සඵල ආයුකාලය පුරාවට න්‍යායානුගත සහ තාර්කික පදනම මත ගණනය කිරීමෙන් ලබාගන්නා වූ ආදායම ලෙස හැඳින්වේ.

2.13.3 ප්‍රාග්ධන ප්‍රදාන

ප්‍රාග්ධන ප්‍රදාන යටතේ අත්පත් කර ගන්නා දේපළ සහ උපකරණ වල වටිනාකමෙහි රු. 64,583,433.79 කි.

2.14 ආදායම හැඳින්වීම

පහත දැක්වෙන මූලයන්ගෙන් ආයතනය ආදායම උපයා ගන්නා අතර ඒවා ගිණුම්කරණයේදී උපචිත පදනම මත හඳුනා ගැනේ.

(අ) යන්ත්‍රෝපකරණ කුළියට දීම.

(ආ) පාඨමාලා ගාස්තු

(ඇ) ප්‍රකාශන අලෙවිය

(ඈ) ශ්‍රවණාගාරය,සම්මන්ත්‍රණශාලා සහ රැස්වීම් ශාලා කුළියට දීම.

(ඉ) සම්මන්ත්‍රණ සහ වැඩමුළු

2.15 වියදම

සියළුම වියදම් සැළකිල්ලට ගනු ලබන්නේ උපචිත පදනම යටතේය.

2.16 නෛතික ගැටළු

සේවකයින්ට අදාළ ගැටළු පිළිබඳ නෛතිකකාර්යයන් කම්කරු විනිශ්චය සභා, කම්කරු දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව යන ආයතනයන්හි 2015 දෙසැම්බර් 31 දින දක්වා අවසන් නොවී පවතී.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA)

ඉදිකිරීම්, පුහුණු හා සංවර්ධන ආයතනයේ නෛතික අනුප්‍රාප්තිකයා

2015.12.31 දිනට පැවති නඩු පිළිබඳ ලේඛණය

නඩු අංකය	උසාවිය/ආයතනය	පියවර
ඩබ්.ඩී. විතාරණ මහතා	කම්කරු දෙපාර්තමේන්තුව	• සේවක අර්ථසාධක අරමුදල් හිඟ ගෙවීම. ගෙවිය යුතු සේවක අර්ථ සාදක අරමුදල් ශේෂය ගණනය කර අදාළ ලේඛණ කම්කරු දෙපාර්තමේන්තුවට යොමු කිරිම. • ගෙවීම් පිළිබඳ සළකා බැලීම සඳහා කාලය ලබාගැනීම. • කම්කරු දෙපාර්තමේන්තුවෙන් පිළිතුරු ලිපියක් අපේක්ෂාවෙන් සිටීම.
ජී.කොළඹගේ මහතා	කම්කරු දෙපාර්තමේන්තුව	• හිඟ පාරිතෝෂික ගෙවීම. • හිඟ පාරිතෝෂික ගෙවීම් ගණනය කර අදාළ ලේඛණ කම්කරු දෙපාර්තමේන්තුවට යොමු කිරිම. • ගෙවීම් සළකා බැලීම සඳහා කාලය ලබා ගැනීම
ඩබ්.ඩී. විතාරණමහතා	කම්කරු දෙපාර්තමේන්තුව	• පාරිතෝෂික හිඟ ගෙවීම • හිඟ පාරිතෝෂික ගෙවීම් ගණනය කර අදාළ ලේඛන කම්කරු දෙපාර්තමේන්තුවට යොමු කිරිම. • කම්කරු දෙපාර්තමේන්තුවෙන් පිළිතුරු ලිපියක් අපේක්ෂාවෙන් සිටීම.
ඩබ්.සී. විතාරණ මහතා	කම්කරු විනිශ්චය සභාව	• සේවය අවසන් කිරීම. • නඩුව විභාග වෙමින් පවතී.
එන්.කේ.මිරැන්ඩා මහතා	කම්කරු විනිශ්චය සභාව	• සේවය අවසන්කිරිම. • නඩුව විභාග වෙමින් පවතී.
පී.බී.එච්.කුලසිංහ මහතා	කම්කරු විනිශ්චය සභාව සහ කොළඹ මහාධිකරණය	• සේවය අවසන් කිරීම • නැවත සේවයේ පිහිටුවීම. • පසුගිය වේතන චෙක්පත් සේවකයින්ට ලබාදීම. • චෙක්පතෙහි සඳහන් මුදල් ප්‍රමාණය පිළිබඳ සේවකයා විසින් ප්‍රශ්න නගා ඇත.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය

මූල්‍ය ත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2015 දෙසැම්බර් 31 දිනට

විස්තරය	සටහන	2015 වසර රුපි.	2014 වසර රුපි.
වත්කම්			
ජංගම වත්කම්			
බැංකු හා අත ඉතිරිය	1	149,266,960.70	64,105,008.89
ආයෝජන - භාණ්ඩාගාර බිල්පත්	2	-	15,707,803.00
වෙළඳාම් සහ අනිකුත් ලැබීම්	3	56,243,994.68	20,649,479.87
තොග	4	133,111,692.58	138,714,770.41
පෙර ගෙවීම්		1,212,531.51	2,025,158.01
		339,835,179.47	**241,202,220.18**
		-	
ක්‍රියාත්මක වෙමින් පවතින ප්‍රාග්ධන වත්කම්		41,347,582.20	49,287,934.16
ජංගම නොවන වත්කම්			
දේශීය යන්ත්‍ර සහ උපකරණ	5	935,544,721.56	936,667,416.50
මුළු වත්කම්		**1,316,727,483.23**	**1,227,157,570.84**
වගකීම්			
ජංගම වගකීම්			
ණයගැතියන් සහ ලැබිය යුතු මුදල්	6	**80,388,350.09**	**94,975,003.42**
ජංගම නොවන වත්කම්			
පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදන	7	61,791,488.71	59,743,932.55
නැවත ගෙවිය යුතු විදේශාධාර		2,663,658.98	2,663,658.98
		64,455,147.69	**62,407,591.53**
මුළු වගකීම්		**144,843,497.78**	**157,382,594.95**
ශුද්ධ වත්කම්		**1,171,883,985.45**	**1,069,774,975.89**
ශුද්ධ වත්කම් කොටස්			-
විලම්භිත ආදායම භාණ්ඩාගාර ප්‍රදාන	8	527,367,186.34	418,580,503.21
ඉක්ටාඩ් වෙතින් බාරගන්නා ලද ශුද්ධ වත්කම්	9	25,449,909.19	149,907,162.02
ස්ථාවර වත්කම් සමුච්චිත අතිරික්තය ප්‍රතිතක්සේරුකරණය	10	625,744,563.49	625,744,563.49
හිඟ	11	(6,677,673.57)	(124,457,252.83)
මුළු ශුද්ධ වත්කම්/කොටස්		**1,171,883,985.45**	**1,069,774,975.89**

පිටු අංක 6 සිට 21 දක්වා ඇති වැදගත් ගිණුම් ප්‍රතිපත්ති සහ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශණයන්ගේ වැදගත් අංගයකි.

සහතිකය

2015 දෙසැම්බර් 31 දිනට කරන ලද කාර්යයන් සහ 2015 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා අතිරික්තය/හිඟය පිළිබඳව සත්‍ය සහ සාධාරණ විනිශ්චයන් ඉහත මූල්‍ය ප්‍රකාශනයන් මගින් ඉදිරිපත් කර ඇති බවට සහතික වෙමු.

කේ.එම්.එස්.මංගලිකා
සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)
සිඩා

වාස්තු විද්‍යාඥ එච්.කේ.බාලචන්ද්‍ර
අධ්‍යක්ෂ ජනරාල්
සිඩා

සී.එච්. ද තිසේරා
සභාපති සහ සිඩා
කළමනාකරණ මණ්ඩල සාමාජික

ඉංජිනේරු එල්.ඩබ්.පාලිත
සිඩා කළමනාකරණ
මණ්ඩල සාමාජික

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
මූල්‍ය කාර්ය සාධනය පළිබඳ ප්‍රකාශය 2015 දෙසැම්බර් 31 දිනට

විස්තරය	සටහන	2015 වසර රු.	2014 වසර රු.
ආදායම	12	199,507,051.82	207,724,114.78
අඩුකළා			
ආදායම් උපයන ක්‍රියාකාරකම් සඳහා වියදම්	13	207,557,347.27	213,868,214.59
ආදායම් ඉපයීම		(8,050,295.45)	(6,144,099.81)
භාණ්ඩාගාර ලැබීම් - සීට්‍රැක්		12,000,000.00	14,100,000.00
අමාත්‍යාංශ ලැබීම්		-	16,320,000.00
භාණ්ඩාගාර ලැබීම් - නිපුණතා සංවර්ධන		53,150,000.00	-
භාණ්ඩාගාර ලැබීම් - ප්‍රධාන කාර්යාලය		8,000,000.00	17,929,999.28
භාණ්ඩාගාර ලැබීම් - නඩත්තු		13,294,095.00	21,400,000.00
		78,393,799.55	63,605,899.47
භාණ්ඩාගාර ලැබීම් - පුනරාවර්තන		30,000,000.00	28,016,000.00
අනෙකුත් ආදායම්	14	32,993,329.83	39,428,828.99
අඩුකළා			
පරිපාලන වියදම්	15	59,984,398.54	52,345,983.42
අනෙකුත් වියදම්	16	21,494,284.29	29,978,245.93
මූල්‍ය පිරිවැය		372,048.73	409,844.18
ලාභ/අලාභ ක්ෂය වෙන් කිරීමට පෙර		59,536,397.82	48,316,654.93
අඩුකළා			
ක්ෂය වීම්	17	65,284,666.37	68,931,081.81
ලාභ/අලාභ අවදානම් සහ බොල් ණය සඳහා ප්‍රතිපාදනයන්ට පෙර		(5,748,268.55)	(20,614,426.88)
අඩුකළා		-	
අවදානම් සහ බොල් ණය සඳහා ප්‍රතිපාදන		929,405.02	(229,670.79)
අදාළ කාලය සඳහා ශුද්ධ ලාභ/අලාභ		(6,677,673.57)	(20,384,756.09)

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය
2015 දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා ශුද්ධ වත්කම්/කොටස් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

		සමුච්චිත අතිරික්තය/හිඟය	ස්ථාවර වත්කම් ප්‍රතිපූරණය	විලම්භිත ආදායම භාණ්ඩාගාර ප්‍රදානය	ප්‍රදාන	ඉක්ටාඩ් වෙතින් භාරගන්නා ලද ශුද්ධ වත්කම් (09.06.1992)	ඉක්ටාඩ් වෙතින් බාරගන්නා ලද ශුද්ධ වත්කම් 31.12.2014	එකතුව
		රු.	රු.	රු	රු.	රු	රු	රු
2015 දෙසැම්බර් 31 ට ශේෂය		(171,320,042.01)	259,369,929.03	371,215,686.51	121,649,558.36	149,907,162.02	-	730,822,293.91
ගණකාධිකාරී ඇස්තමේන්තුවේ වෙනස්කම්		67,247,545.27						67,247,545.27
		(104,072,496.74)	259,369,929.03	371,215,686.51	121,649,558.36	149,907,162.02		798,069,839.18
අදාළ කාලය සඳහා අතිරික්තය(හිඟය)		(20,384,756.09)						(20,384,756.09)
භාණ්ඩාගාර ප්‍රදාන		-	-	62,900,000.00				62,900,000.00
විලම්භිත ආදායම - ප්‍රාග්ධන ප්‍රදාන				(29,977,186.24)				(29,977,186.24)
ප්‍රදාන සංක්‍රාම සමුච්චිත වියදම් සඳහා				-	(32,665,581.62)			(32,665,581.62)
U.N.D.P.ප්‍රදාන සමුච්චිත වියදම් සඳහා සංක්‍රාම				-	(73,179,523.80)			(73,179,523.80)
JICA ආධාර සීට්‍රැක් පුස්තකාල ග්‍රන්ථ				-	(1,310,450.00)			(1,310,450.00)
ප්‍රධාන අමාත්‍යාංශය වත්කම්				207,540.00	(207,540.00)			-
ප්‍රධාන GTZ වත්කම්				14,234,462.94	(14,286,462.94)			(52,000.00)
අතිරික්ත ප්‍රතිප්‍රවාණය සීට්‍රැක් පුස්තකාල ග්‍රන්ථ			1,310,450.00	-				1,310,450.00
හිඟය ප්‍රතිප්‍රවාණය සීට්‍රැක් යන්ත්‍රෝපරණ			(1,662,554.42)	-				(1,662,554.42)
අතිරික්ත ප්‍රතිප්‍රවාණය		-	366,726,738.88					366,726,738.88
ඉදිරියට ගෙනාවා 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය		**(124,457,252.83)**	**625,744,563.49**	**418,580,503.21**	**-**	**149,907,162.02**	**-**	**1,069,774,975.89**
ගිණුම් ඇස්තමේන්තුවල වෙනස්කම්		-	-					-
		(124,457,252.83)	625,744,563.49	418,580,503.21	-	149,907,162.02		1,069,774,975.89
අදාළ කාලය සඳහා අතිරික්තය (හිඟය)		(6,677,673.57)	-	-	-	-		(6,677,673.57)
භාණ්ඩාගාර ප්‍රදාන ප්‍රාග්ධන		-	-	133,215,000.00				133,215,000.00
විලම්භිත ආදායම - භාණ්ඩාගාර ප්‍රදාන		-		(24,428,316.87)				(24,428,316.87)
2014.12.31 ට සමුච්චිත හිඟය		124,457,252.83					(124,457,252.83)	-
2014.12.31 දිනට ඉක්ටාඩ් වෙතින් භාරගන්නා ලද ශුද්ධ වත්කම්				-	-	(149,907,162.02)	149,907,162.02	-
ඉදිරියට ගෙනාවා 2015.12.31 ට ශේෂය		**(6,677,673.57)**	**625,744,563.49**	**527,367,186.34**	**-**	**-**	**25,449,909.19**	**1,171,883,985.45**

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය		
2015.12.31 න් අවසන් කාල පරිච්ඡේදය සඳහා වක්‍ර මුදල් ප්‍රවාහ ප්‍රකාශය		
	2015	2014
	රු.	රු.
මෙහෙයුම් කාර්යයන්ගෙන් මුදල් ප්‍රවාහය		
	(6,677,673.57)	(20,384,756.09)
සාමාන්‍ය කටයුතු වලින් අතිරික්තය (ඌනතාවය)		
ගැළපුම්		
ක්ෂයවීම්	65,052,252.73	68,698,468.17
බදු කුළිය	232,613.64	232,613.64
පාරිතෝෂික වෙන්කිරීම්	4,757,373.66	5,735,956.05
පොළී ආදායම භාණ්ඩාගාර බිල්පත්	(739,121.26)	(1,124,471.79)
ලාභය/අලාභය වැය කළ හැකි ස්ථාවර වත්කම්	190,072.44	-
බොල් ණය ප්‍රතිපාදන	929,405.02	(229,670.79)
විලම්භිත ආදායම	(24,428,316.87)	(29,977,186.24)
පූර්ව වසරේ ගැළපුම්	-	(38,597,560.15)
ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර/(අලාභ) ලාභ මෙහෙයුම්	**39,316,605.79**	**(15,646,607.20)**
අනෙකුත් ජංගම වත්කම් වැඩිවීම්/අඩුවීම්	(14,586,653.33)	24,916,036.21
මෙහෙයුම් වලින් උපයන මුදල්	(22,167,863.54)	25,436,911.70
පාරිතෝෂික ගෙවීම්	**2,562,088.92**	**34,706,340.71**
මෙහෙයුම් කටයුතු වලින් ලැබූ ශුද්ධ ආදායම	(2,709,817.50)	(4,298,790.00)
ආයෝජන කටයුතු මගින් මූල්‍ය සංචරණය	**(147,728.58)**	**30,407,550.71**
යන්ත්‍ර හා උපකරණ විකිණීමෙන් උත්පාදන	421,462.36	108,424.20
වැය කළ හැකි ස්ථාවර වත්කම් ලාභය/අලාභය	(190,072.44)	
පොළී ආදායම් - භාණ්ඩාගාර බිල්පත්	739,121.26	1,215,999.95
ආයෝජන භාණ්ඩාගාර බිල්පත්	15,707,803.00	
ආයෝජන කටයුතු වලින් ලැබූ මුළු මුදල් ප්‍රවාහය	**(47,905,119.61)**	**(35,040,357.98)**
භාණ්ඩාගාර ප්‍රදාන	133,215,000.00	62,900,000.00
	-	-
මූල්‍ය කටයුතු වලින් ලැබූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**133,215,000.00**	**62,900,000.00**
මුදල් සහ මුදල් සාධ්‍යයන්ගේ (ද්‍රවශීල වත්කම්) ශුද්ධ මුදල් වැඩිවීම්/අඩුවීම්	85,162,151.81	58,267,192.73
කාලපරිච්ඡේදය ආරම්භයේදී මුදල් හා එවැනි ද්‍රවශීල වත්කම්	64,105,008.89	5,837,816.16
කාලපරිච්ඡේදය අවසානයේදී මුදල් හා එවැනි ද්‍රවශීල වත්කම්	**149,267,160.70**	**64,105,008.89**

සංකේත අංකය	විස්තරය	ව්‍යාපෘති අංකය	2015 වසර රු.	2014 වසර රු
	සටහන 1			
	බැංකු හා අත ඉතිරි මුදල්			
	ලංකා බැංකුව - ටොරින්ටන්		-	-
680	සිඩා ප්‍රධාන කාර්යාලය		34,112,875.01	
681	සිඩා ක්‍රියාකරු පුහුණු කිරීමෙ මධ්‍යස්ථානය		63,260,004.66	
682	සිඩා සීට්‍රැක්		50,065,698.03	
683	සී.අයි.ඩී. අරමුදල		98,500.00	
684	ලංකා බැංකුව, කොල්ලුපිටිය ශාඛාව		-	3,671,357.92
685	ලංකා බැංකුව බත්තරමුල්ල (සීට්‍රැක්)		-	27,572,655.44
686	ලංකා බැංකුව ටොරින්ටන්		-	1,884,506.30
			147,537,077.70	**33,128,519.66**
694	අත ඉතිරි මුදල් - පැලවත්ත		-	17,400.00
691	අත ඉතිරි මුදල් (ප්‍රධාන කාර්යාලය)		-	3,092,490.68
697	අත ඉතිරි මුදල් ටොරින්ටන් සිඩා - ප්‍රධාන කාර්යාලය		1,444,727.80	
699	අත ඉතිරි මුදල් පැලවත්ත - සිඩා-සීට්‍රැක්		282,500.00	
			1,727,227.80	**3,109,890.68**
693	අත ඉතිරි මුදල්(ක්‍රියාකරු පුහුණු මධ්‍යස්ථානය)		-	27,863,943.35
692B	සුළු මුදල් අග්‍රිමය	10	2,655.20	2,655.20
			2,655.20	**27,866,598.55**
			149,266,960.70	**64,105,008.89**
	සටහන 2			
	ආයෝජනය		-	
551	භාණ්ඩාගාර බිල්පත් (හීනවන අරමුදල)		-	15,707,803.00
			-	**15,707,803.00**

සංකේත උංකය	විස්තරය	ව්‍යාපෘති අංකය	2015 වසර	2014 වසර
			රු.	රු.
	සටහන - 3			
	වෙළඳ සහ අනෙකුත් ලැබීම්			
	ණයගැතියන්			
	ණය ගැති පාලනය			
620a	ණය ගැති පාලනය - ප්‍රධාන කාර්යාලය	11	220,458.75	645,058.75
627a	ණය ගැති පාලනය - ප්‍රධාන කාර්යාලය, සිඩා	11	1,966,590.00	-
627b	ණය ගැති පාලනය - සී.එච්.පී.ඩී.	12	1,474,238.17	565,225.03
620c	ණය ගැති පාලනය - සිට්රැක්	13	1,192,498.00	4,086,652.56
627c	ණය ගැති පාලනය - සිට්රැක්	13	1,636,121.50	
620d	ණය ගැති පාලනය - ඕ.ටී.සී.	14	1,553,965.51	6,576,206.28
627d	ණය ගැති පාලනය - ඕ.ටී.සී.	14	574,124.25	
621	ණයගැති නිෂ්කාශනය	15	5,298,287.88	5,298,287.88
623	අයවිය යුතු සෞඛ්‍ය රක්ෂණය		-	784,066.60
624	අයවිය යුතු භාණ්ඩාගාර ප්‍රදාන		39,338,592.53	-
634	අයවිය යුතු කොන්ත්‍රාත් ලියාපදිංචි ගාස්තුව	16	1,547,706.51	1,111,573.13
625	අයවිය යුතු හිඟ වැටුප්		-	76,960.90
642	විවිධ ණය ගැතියන්	17	115,315,277.56	115,401,553.26
648	ලැබිය යුතු	18	239,463.05	82,456.24
			170,357,323.71	**134,628,040.63**
	තැන්පතු			
632	සේවා සඳහා තැන්පතු	19	218,296.00	480,966.70
			218,296.00	**480,966.70**
	අත්තිකාරම්			
628	සැපයුම් කරුවන් සඳහා අත්තිකාරම්	20	472,798.77	381,907.48
629	සේවා සඳහා අත්තිකාරම්	21	307,239.50	10,139.50
656	පොදු අත්තිකාරම්	22	490,605.00	214,615.00
662	වැටුප් අත්තිකාරම්	23	61,000.00	
671	පුහුණු වැඩසටහන් සඳහා අත්තිකාරම්	24	20,930.00	80,405.00
672	තත්ත්ව සංවර්ධන ව්‍යාපෘති සඳහා අත්තිකාරම්	25	100,000.00	100,000.00
			1,452,573.27	**787,066.98**
	කාර්ය මණ්ඩල ණයගැතියෝ			
650	උත්සව අත්තිකාරම්	26	47,534.70	222,534.70
652	ගමන් ගාස්තු අත්තිකාරම්	27	3,425.00	3,425.00
654	ඉන්ධන අත්තිකාරම්	28	20,040.00	41,030.00
658	ආපදා ණය	29	5,060,810.16	4,472,819.00
659	පොත් සඳහා ණය	30	800.00	1,000.00
			5,132,609.86	**4,740,808.70**
			177,160,802.84	140,636,883.01
679	අවිනිශ්චිත ණය සඳහා ප්‍රතිපාදන		(120,916,808.16)	(119,987,403.14)
			56,243,994.68	**20,649,479.87**
	සටහන 4			
	තොග		-	
1120	තොග(ඕ.ටී.සී.)	31	42,154,966.68	46,747,773.07
1120	තොග(සීට්‍රැක්)	32	82,287,564.85	82,249,187.37
1120	තොග (ප්‍රධාන කාර්යාලය)	33	8,669,161.05	9,717,809.97
			133,111,692.58	**138,714,770.41**

දේපළ යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ

සටහන් 5

		සේවා අංකය	පිරිවැය වසර 2015.01.01	එකතුකිරීම් 2015	ඉවත දැමිය හැකි/විනාශ කළහැකි 2015		මුළු පිරිවැය වසර 2015.12.31	හිගය 2015	සමුච්චිත ක්ෂයවීම් වසර 2015.12.31	වසර අවසානයේ කපාහරින ලද අගයන් 2015.12.31	වසර අවසානයේ කපාහරන ලද අගයන් 2014.12.31
			රු.	රු.	රු.		රු.	රු.	රු.	රු.	රු.
500	භූමිය		77,000.50	-			77,000.50	77,000.50	-	77,000.50	77,000.50
								-			
502	ගොඩනැගිලි	1		-		-					-
	ගොඩනැගිලි ප්‍රතිප්‍රවාණ 1		595,725,000.00				595,725,000.00	14,893,125.00	14,893,125.00	580,831,875.00	595,725,000.00
	ගොඩනැගිලි වෙනත් 11		25,297,763.41				25,297,763.41	632,444.09	632,444.09	24,665,319.32	25,297,763.41
503B	ගොඩනැගිලි - වෙනත්	2	1,381,815.10	-		-	1,381,815.10	34,545.38	34,545.38	1,347,269.72	1381815.10
504	පරිශ්‍රය අළුත්වැඩියාව	3	57,540,625.95	-	-	-	57,540,625.95	7,192,578.13	7,192,578.13	50,348,047.82	57,540,625.95
506	මොටර් රථ	4	56,794,801.38	11,807,462.09	(290,399.86)	-	68,311,863.61	11,816,584.01	11,816,584.01	56,495,279.60	56,794,801.38
508	ගෘහභාණ්ඩ සවිකිරිම සහ කාර්යාල උපකරණ	5	172,910,977.14	51,200,000.00	-	-	224,110,977.14	25,387,844.74	25,387,844.74	198,723,132.40	172,910,977.14
509	ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ	6	4,251,259.58	79,390.00	(131,062.50)	-	4,199,587.08	1,066,749.45	1,066,749.45	3,132,837.63	4,251,259.58
510	මෙවලම් හා ආයුධ	7	17,833,504.76	1,461,761.70	-	-	19,295,266.46	3,627,543.63	3,627,543.63	15,667,722.83	17,833,504.76
1124	පුස්තකාල ග්‍රන්ථ - ප්‍රධාන කාර්යාලය	8	1,216,921.48	34,820.00	-	-	1,251,741.48	243,384.30	243,384.30	1,008,357.18	1,216,921.48
1122	පුස්තකාල ග්‍රන්ථ - සීට්‍රැක්	9	786,270.00	-			786,270.00	157,254.00	157,254.00	629,016.00	786,270.00
				-				-	-		
			933,815,939.00	64,583,433.79	(421,462.36)	-	997,977,910.23	65,052,052.73	65,052,052.73	932,925,858.00	933,815,939.30
501	බද්දට ගන්නා භූමි		2,851,477.20			-	2,851,477.20	232,613.64	232,613.64	2,618,863.56	2,851,477.20
							1,000,829,387.93	**65,284,666.37**	**65,284,666.37**	**935,544,721.56**	**936,590,416.00**
							-				

සංකේත අංකය	විස්තරය	ව්‍යාපෘති අංකය	2015 වසර රු	2014 වසර රු
	සටහන - 6 **ණයගැතියන් සහ උපචිත**			
702	කලින් ලද ආදායම	34	2,909,508.45	3,456,219.20
703	කලින් ලද ආදායම් කොන්ත්‍රාත් ලියාපදිංචි ගාස්තු	35	40,645,751.55	44,073,965.02
704	ගෙවිය යුතු පූර්ව විශ්‍රාම වැටුප්	36	2,333,418.35	2,184,671.53
710	ණය ගැති පාලනය	37	5,666,226.92	2,640,379.74
711	විවිධ ණයගැතියන්	38	16,697,532.75	29,551,848.08
714	උපචිත වියදම්	39	9,813,869.52	10,597,227.98
730	ගෙවිය යුතු - සේ.අ.අ.	40	1,789,747.28	1,808,593.11
732	ගෙවිය යුතු -සේ.භා.අ	41	214,770.27	217,031.76
734	මුද්දර ගාස්තු		25.00	-
743	ගෙවිය යුතු ආදායම් බදු		-	13,067.00
706	අයකර ගත හැකි ටෙන්ඩර් තැන්පතු	42	317,500.00	432,000.00
			80,388,350.09	**94,975,003.42**
	සටහන - 7			
715	**ගෙවිය යුතු පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන**	43		
	ශේෂය ඉදිරියට ගෙන ගියා 2015.01.01		59,743,932.55	58,306,766.50
	ගෙවා ඇති පාරිතෝෂික - 2015		(2,709,817.50)	(4,298,790.00)
	පාරිතෝෂික වෙන්කිරීම් - 2015		4,757,373.66	5,735,956.05
			61,791,488.71	**59,743,932.55**

සංකේත අංකය	විස්තරය	ව්‍යාපෘති අංකය	2015 වසර රු	2014 වසර රු
	සටහන - 08			
816	**භාණ්ඩාගාර ප්‍රදාන - ප්‍රාග්ධනය - 2015**			
	ශේෂය ඉදිරියට ගෙන ගියා 2015.01.01		418,580,503.21	371,215,686.51
	භාණ්ඩාගාර ප්‍රදාන - ප්‍රාග්ධනය - 2015		133,215,000.00	62,900,000.00
	අමාත්‍යාංශයෙන් ලද වත්කම්		-	207,540.00
	ප්‍රදාන (වත්කම්)		-	14,234,462.94
	විලම්භිත ආදායම - භාණ්ඩාගාර ප්‍රදාන - 2015		(24,428,316.87)	(29,977,186.24)
			527,367,186.34	**418,580,503.21**
	සටහන - 9			
	ඉක්ටාඩ් වෙතින් බාර ගන්නා ලද ශුද්ධ වත්කම්			
			-	
	ඉක්ටාඩ් වෙතින් හිඟ ශේෂය ඉදිරියට ගෙන ගියා 1992.06.09-2014.12.31		(124,457,252.83)	
	ඉක්ටාඩ් ව්‍යාපෘතියෙන් බාර ගන්නා ලද ශුද්ධ වත්කම් 1986.04.01-1992.06.09		149,907,162.02	
812	ඉක්ටාඩ් ව්‍යාපෘතියෙන් බාරගන්නා ලද ශුද්ධ වත්කම් 1986.04.01-1992.06.09		-	149,907,162.02
			25,449,909.19	**149,907,162.02**
	සටහන - 10			
817	**ප්‍රතිගණනය - ස්ථාර වත්කම්**			
	වර්ෂය ආරම්භයේ ශේෂය		625,744,563.49	259,369,929.03
	ප්‍රතිගණනය 2011 සීට්‍රැක් පුස්තකාල ග්‍රන්ථ ඌන ඇගයුම්		-	1,310,450.00
	ප්‍රතිගණනය 2012 සීට්‍රැක් යන්ත්‍ර පිරිවැය සහ ඌන ඇගයුම් ක්ෂයවීම්		-	(1,662,554.42)
	ප්‍රතිගණනය 2014 සී.එච්.පී.බී. සහ සීට්‍රැක් ගොඩනැඟිලි		-	366,726,738.88
			625,744,563.49	**625,744,563.49**
	සටහන 11			
850	**සමුච්චිත අරමුදල**			
	වර්ෂය මුල හිඟ ශේෂය		(124,457,252.83)	(171,320,042.01)
	ගැළපුම්		-	67,247,545.27
	ඉදිරියට ගෙන ගියා හිඟ ශේෂය 2014 බාරගන්නා ලද ශුද්ධ වත්කම් වලට මාරු කිරීම		124,457,252.83	
	අතිරික්තය/(2015 වසර සඳහා හිඟ)		(6,677,673.57)	(20,384,756.09)
	2015.12.30 වසර අවසානයේ ශේෂය		**(6,677,673.57)**	**(124,457,252.83)**

සංකේත උංකය	විස්තරය	2015 වසර රු.	2014 වසර රු.
	සටහන - 12		
	ආදායම		
100	ව්‍යාපෘති වලින් ආදායම	-	8,928,571.42
102	යන්ත්‍රෝපකරණ කුලියට දීම	1,656,555.23	13,124,396.00
103	අළුත්වැඩියා ගාස්තු	191,550.90	285,638.39
104	ශ්‍රවණාගාරය සහ සම්මන්ත්‍රණශාලා	9,622,853.07	5,952,193.11
105	කුලියට දීම	91,925.00	116,500.00
106	වෘත්තිය පරීක්ෂණ ආදායම්	47,993,763.00	50,220,037.00
108	පාඨමාලා ගාස්තු	13,963,300.00	13,325,057.50
107	සම්මන්ත්‍රණ කුඩා පරිමාණ කොන්ත්‍රාත් ලියාපදිංචිය සී-11*	9,351.36	30,558.00
109	කොන්ත්‍රාත් දායක	95,448,850.52	93,615,554.55
110	කුලිය	3,820,769.00	3,992,540.00
112	ප්‍රකාශන අළෙවිය	7,125,469.59	8,381,919.01
114	පරිගණක කුලියට දීම	1,035,622.52	390,464.26
115	නිල නිවාස	420,151.00	314,000.00
128	NVQ පුහුණු පාඨමාලාවන්ගේ ආදායම	4,000,000.00	3,000,000.00
135	නවාතැන් ගාස්තු	4,027,894.22	3,858,323.71
120	උපදේශණ සේවා	220,000.00	709,892.86
124	බේරුම්කරණ/සමථකරණ ගාස්තු	865,180.20	350,000.00
125	ව්‍යාපෘති කළමනාකරණ සේවා	2,287,220.96	1,083,468.97
136	ඉක්ටාඩ් සමථකරුවන්ගේ සංචිතය	80,345.25	45,000.00
137	නිපුණතා සංවර්ධන පුහුණු පාඨමාලාව	6,646,250.00	
		199,507,051.82	**207,724,114.78**
	සටහන - 13		
	ආදායම් ඉපයීමේ කටයුතු සඳහා වියදම්		
	පෞද්ගලික වේතන	-	
200	වැටුප් සහ වේතන	43,077,506.97	49,881,575.81
201	ජීවන වියදම් දීමනාව	16,793,784.65	15,875,714.47
203	පැමිණීම දිරිගැන්වීමේ දීමනාව	2,471,653.45	2,610,773.73
206	දූවිලි දීමනාව	148,900.00	158,850.00
208	වැඩ බැලීමේ දීමනාව	172,213.12	306,586.87
210	අනෙකුත් දීමනා	28,795,996.69	2,229,387.41
220	නිවාඩු හා අතිකාල ගෙවීම් - වක්‍ර	4,321,310.74	4,388,637.22
220a	නිවාඩු හා අතිකාල ගෙවීම් - සෘජු	1,878,935.49	4,012,435.91
224	වෘත්තීය ආයතන සඳහා සාමාජික මුදල් දායකත්වය	71,331.20	36,136.60
226	අතිරේක ගෙවීම්	2,317,247.00	2,222,937.00
330	සේ.අ.අ.	8,406,584.63	8,215,563.32
332	සේ.භා.අ.	1,676,606.14	1,647,821.24
334	පාරිතෝෂිකය	3,185,644.92	4,148,783.58
336	විශ්‍රාම වැටුප්	50,795.00	50,804.90
		113,368,510.00	**95,786,008.06**

සංකේත අංකය	විස්තරය	2015 වසර රු.	2014 වසර රු.
	ගමන් වියදම්	-	
236	ගමන් (දේශීය)	349,129.50	334,866.00
236a	ගමන් (ආදායම් ඉපයීම්) සෘජු	193,680.50	1,296,202.50
		-	-
		542,810.00	**1,631,068.50**
	සැපයුම් සහ අවශ්‍යතා		
240	ඡායා පිටපත් වියදම්	1,185,114.25	2,155,995.09
242	ලිපිද්‍රව්‍ය	1,133,845.66	1,599,682.35
244	කාර්යාලයීය අවශ්‍යතා	169,643.83	425,732.73
245	ජාල පදනම් ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචිය	-	166,143.46
246	මුද්‍රණය, යතුරු ලියනය සහ පරිවර්තනය	1,531,669.70	1,822,910.32
248	ග්‍රන්ථ සහ වාර සඟරා	205,304.96	305,846.40
249	ඉවත්කළ හැකි සහ විනාශ කළ හැකි	216,744.92	682,962.60
250	ශ්‍රව්‍ය දෘශ්‍ය පාරිභෝජ්‍යය	37,950.44	88,461.10
280	රක්ෂණ (වත්කම්)	295,197.48	330,004.12
		4,775,471.24	**7,577,738.17**
	නඩත්තු වියදම්		
		-	
260	ගොඩනැඟලි	2,686,498.28	5,013,138.23
262	ලී බඩු සවිකිරීම සහ කාර්යාලයීය උපකරණ	1,107,902.54	1,181,710.96
264	මගී වාහන	1,043,502.24	1,612,636.11
266	අනෙකුත් වාහන	154,713.47	176,191.00
268	යන්ත්‍රසූත්‍ර සහ උපකරණ	7,585,262.97	8,209,628.74
270	මෙවලම් හා ආයුධ	7,552.56	32,281.31
272	අළුත්වැඩියා, නඩත්තු සහ වෙනත්	23,375.50	2,015.00
		12,608,807.56	**16,227,601.35**
	කොන්ත්‍රාත් සේවා		
		-	-
290	මගී වාහනවල ඉන්ධන තෙල් හා ධාවන වියදම්	3,894,777.62	3,379,814.32
292	අනෙකුත් වාහනවල ඉන්ධන තෙල් හා ධාවන වියදම්	4,093,957.56	8,572,372.93
294	වාරික සහ කුළී ගාස්තු(වාහන)	633,747.00	2,056,433.05
296	තැපැල් ගාස්තු	1,061,388.00	1,097,435.50
298	දුරකථන	764,569.01	1,039,422.85
299	අන්තර්ජාල ගාස්තු	503,425.78	198,257.70
306	විදුලිය	11,245,388.90	12,232,201.31
308	ජල බදු	2,034,991.13	1,886,234.52
310	සෞඛ්‍ය හා සණීපාරක්ෂක	4,327,273.94	3,901,681.64
312	ආරක්ෂණ සේවය	2,130,304.50	2,003,701.38
		30,689,823.44	**36,367,555.20**

සංකේත අංකය	විස්තරය	2015 වසර රු.	2014 වසර රු.
	පුහුණු කටයුතු		
360	ශිෂ්‍යත්ව සහ පුහුණුව (දේශීය)	169,819.57	193,500.00
362	ශිෂ්‍යත්ව සහ පුහුණුව (විදේශීය)	115,820.00	243,085.00
390	උපදේශකයින් සඳහා ගාස්තු සහ දීමනා	411,400.00	4,425,717.74
392	ගුරු මණ්ඩලය සඳහා ගාස්තු සහ දීමනා	8,904,350.00	8,852,105.00
394	සහාය කාර්ය මණ්ඩලය සඳහා දීමනා	389,550.00	81,900.00
396	සංවර්ධන පිරිවැය ගාස්තු සහ දීමනා	344,600.00	118,500.00
410	පුහුණු උපකරණ	102,171.38	162,182.10
412	පුහුණුව සඳහා අමතර කොටස්	4,649,032.13	6,500,000.00
414	පුහුණුව සඳහා ලබන ඉන්ධන	2,509,199.79	4,200,000.00
418	අත් මෙවලම් සහ කුඩා උපකරණ	16,154.71	81,726.92
424	පුහුණුවන්නන් සඳහා නිල ඇඳුම්	834,304.14	809,155.10
425	පුහුණු වැඩසටහන් සඳහා සංග්‍රහ	6,734,397.00	6,669,887.00
439	කාර්ය මණ්ඩල සුභසාධනය	130,020.66	
440	පුහුණුවන්නන් සඳහා දීමනා	2,170,250.00	3,289,500.00
441	දේශණ ශාලා ගාස්තු ආදිය	117,358.64	1,346,407.33
443	උපකරණ කුළියට දීම	37,200.00	112,349.00
445	NVQ වියදම්	4,000,000.00	
446	නිපුණතා සංවර්ධන වැඩසටහන්	3,246,842.60	
		34,882,470.62	**37,086,015.19**
	වෙනත්		
344	ජා.ගො.බ	2,404,560.00	2,914,754.00
346	කාර්ය මණ්ඩල සඳහා නිල ඇඳුම්	316,732.20	638,987.42
348	කාර්ය මණ්ඩල සඳහා තේ පැන්	1,194,390.52	1,187,057.01
350	සෞඛ්‍ය රක්‍ෂණය	708,584.26	769,978.24
351	බොල් ණය		860,609.35
354	වෙනත්	1,150.00	15,050.00
369	ප්‍රදර්ශණ	70,662.58	222,694.14
370	ප්‍රචාරණය සහ දැන්වීම්	2,775,776.08	7,494,002.47
372	විනෝද උත්සව	460,613.00	1,741,891.00
373	ආසන දීමනාව	1,734,000.00	2,705,883.00
383	වැඩබිම් පරීක්‍ෂණ දීමනා	620,000.00	
378	සාමාන්‍ය රක්‍ෂණය	88,539.75	65,936.18
380	නීති සහ වෘත්තිය ගාස්තු		45,000.00
382	බලපත්‍ර ගාස්තු	18,510.14	30,218.08
384	වෙනත් වියදම්	41,346.00	182,551.76
385	කුලී හා වරිපනම්	78,429.88	77,009.47
388	නවාතැන් ගාස්තු	176,160.00	240,606.00
		10,689,454.41	**19,192,228.12**
	ආදායම් ඉපැයීමේ කටයුතු වලින් සමස්ථ වියදම	**207,557,347.27**	**213,868,214.59**

සංකේත අංකය	විස්තරය	2015 වසර රු.	2014 වසර රු.
	සටහන - 14		
	වෙනත් ආදායම්		
116	ආපසු නොගෙවනු ලබන ටෙන්ඩර් ගාස්තු	194,163.05	108,638.32
118	දඩ, අධිභාර සහ වෙනත්	33,071.25	18,475.00
111	විලම්භිත ආදායම	24,428,316.87	29,977,186.24
119	පොලී ආදායම - භාණ්ඩාගාර බිල්පත්	739,121.26	1,124,471.79
122	විවිධ	865,240.31	750,886.58
126	විවිධ (අනුග්‍රහ)	992,958.04	1,870,000.00
141	විවිධ ආදායම් (VAT නොමැතිව)	78,209.05	431,328.20
167	කොන්ත්‍රාත්කරුවන් සඳහා හැඳුනුම්පත්	10,500.00	23,100.00
169	ඉදිකිරීම් සේවක හැඳුනුම්පත්	290,750.00	242,600.00
329	ඉක්ටාඩ් තත්ත්ව ජර්නලය	210,000.00	120,000.00
377	ඉක්ටාඩ් තත්ත්ව සංවර්ධන ව්‍යාපෘතියේ ආදායම	5,151,000.00	4,762,142.86
		32,993,329.83	**39,428,828.99**
	සටහන - 15		
	පරිපාලන වියදම්		
	පෞද්ගලික වේතන		
200	වැටුප් හා වේතන	22,381,713.33	27,301,150.80
201	ජීවන වියදම් දීමනාව	7,972,834.12	8,343,011.81
203	පැමිණීමේ දිරිගැන්වීම් දීමනාව	1,182,397.26	1,426,001.55
208	වැඩ බලන දීමනාව	296,303.82	388,264.70
210	අනෙකුත් දීමනා	12,781,063.70	233,790.00
220	නිවාඩු දින සඳහා ගෙවීම් - අතිකාල	4,083,364.94	4,121,262.00
220a	නිවාඩු දින සඳහා ගෙවීම් (සෘජු)	-	140,926.44
224	වෘත්තීය ආයතන සඳහා සාමාජික දායකත්වය	36,483.62	19,410.97
226	අමතර ගෙවීම්	1,112,139.00	1,187,397.00
330	සේ.අ.අ.	4,337,384.50	4,382,468.15
332	සේ.භා.අ.	872,187.63	809,003.20
334	පාරිතෝෂික	1,633,153.74	1,587,172.47
		56,689,025.66	**49,939,859.09**
	ගමන් වියදම්		
236	ගමන් (දේශීය) - වක්‍ර	340,137.25	457,698.50
		340,137.25	**457,698.50**
	සැපයුම් සහ අවශ්‍යතා		
240	ඡායා පිටපත් වියදම්	1,222,071.98	754,026.06
242	ලිපිද්‍රව්‍ය	297,055.21	232,102.79
244	කාර්යාලයීය අවශ්‍යතා	129,227.62	114,402.79
246	මුද්‍රණ, යතුරු ලියන සහ පරිවර්තන	148,388.00	10,385.00
248	පොත් සහ සඟරා පරිවර්තන	427,239.11	213,220.00
249	ඉවතලිය හැකි සහ විනාශ කළ හැකි		170,866.01
250	ශ්‍රව්‍ය දෘශ්‍ය පාරිභෝජ්‍යය	80,409.91	63,719.59
280	රක්ෂණ (වත්කම්)	650,843.80	389,703.59
		2,955,235.63	**1,948,425.83**
	මුළු එකතුව - පරිපාලන වියදම්	**59,984,398.54**	**52,345,983.42**

සංකේත අංකය	විස්තරය	2015 වසර රු.	2014 වසර රු.
	සටහන - 16		
	අනෙකුත් වියදම්		
	නඩත්තු වියදම්		
		-	-
260	ගොඩනැගිලි	2,225,868.14	5,530,751.16
262	ගෘහභාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ	1,122,115.08	1,051,149.52
264	මගී වාහන	2,863,124.82	2,752,963.28
268	යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ	-	9,609.50
272	වෙනත්	23,470.00	
		6,234,578.04	**9,344,473.46**
	කොන්ත්‍රාත් සේවා		
		-	-
290	මගී වාහනවල ඉන්ධන තෙල් හා ධාවන වියදම්	2,444,344.15	5,001,029.73
294	වාරික සහ කුළී ගාස්තු (වාහන)	75,720.00	29,944.00
296	තැපැල් ගාස්තු	263,479.84	278,766.66
298	දුරකථන	950,416.64	830,755.08
299	අන්තර්ජාල ගාස්තු	285,940.63	282,262.06
306	විදුලිය	4,431,029.71	5,091,448.93
308	ජල බදු	312,321.33	369,436.56
310	සෞඛ්‍ය හා සනීපාරක්ෂාව	1,430,026.19	1,393,583.48
312	ආරක්ෂක සේවය	219,679.88	539,668.89
		10,412,958.37	**13,816,895.39**
	පුහුණු කටයුතු		
360	ශිෂ්‍යත්ව සහ පුහුණුව (දේශීය)	264,655.43	174,000.00
362	ශිෂ්‍යත්ව සහ පුහුණුව (විදේශීය)	55,387.40	33,875.00
390	උපදේශකයින් සඳහා වැටුප් හා දීමනා	-	
394	සහාය කාර්ය මණ්ඩලය සඳහා වැටුප් හා දීමනා	4,750.00	
410	පුහුණු උපකරණ	-	2,016.23
416	පුහුනු ආධාර		420.00
428	විශේෂ කාර්ය සඳහා වියදම්		92,000.00
440	පුහුණු දීමනා	575,600.00	911,632.27
439	කාර්ය මණ්ඩල ශුභසාධනය	116,868.93	
443	උපකරණ කුලියට දීම		4,113.00
		1,017,261.76	**1,218,056.50**

සංකේත අංකය	විස්තරය	2015 වසර රු.	2014 වසර රු.
	වෙනත්		
		190,072.44	-
123	ලාභය/අලාභය ස්ථාවර වත්කම් භාවිතය	116,841.00	90,414.00
344	ජා.ගොඩ.බ.	255,111.17	353,203.62
346	කාර්ය මණ්ඩල සඳහා නිල ඇඳුම	527,359.00	526,287.00
348	කාර්ය මණ්ඩලය සඳහා තේ පැන්	460,928.59	714,896.18
350	සෞඛ්‍ය රක්ෂණය	4,300.00	9,050.00
354	වෙනත්	39,120.25	149,399.50
369	ප්‍රදර්ශණ	819,577.37	2,435,773.96
370	ප්‍රචාරණය සහ දැන්වීම්	386,126.00	573,775.00
372	විනෝද උත්සව	614,650.00	224,900.00
373	ආසන දීමනාව	120,500.00	189,999.64
374	විගණන දීමනා	3,643.92	3,258.98
378	සාමාන්‍ය රක්ෂණය	34,840.00	26,551.00
380	නීති සහ වෘත්තිය ගාස්තු	205,586.47	215,004.40
382	බලපත්‍ර ගාස්තු	48,977.56	13,625.23
384	වෙනත් වියදම්	1,852.35	4,082.07
385	කුලී හා වරිපනම්		68,600.00
388.00	නවාතැන් ගාස්තු	**3,829,486.12**	**5,598,820.58**
	මුළු එකතුව - වෙනත් වියදම්	**21,494,284.29**	**29,978,245.93**
	සටහන 17		
	ක්ෂයවීම්		
282	ණය වීම්	-	
	ප්‍රාග්ධන දීමනා	24,428,316.87	29,977,186.24
	වෙනත්	40,623,735.86	38,721,281.93
283	**බද්ද කුලිය**		
	ප්‍රධාන කාර්යාලය	200,000.00	200,000.00
	සී.එච්.පී.බී.	32,613.64	32,613.64
		65,284,666.37	**68,931,081.81**

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } සිඊඑන්/බී/ සිඅයිඩීඒ/ එෆ්ඒ/15
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2016 සැප්තැම්බර් 22 දින

සභාපති,

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනතේ 29(2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, .- இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

AGDSL

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
Auditor General's Department

2. මූල්‍ය ප්‍රකාශන

2.1 විගණන මතය

මූල්‍ය ප්‍රකාශනවලින්, 2015 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රී ලංරාගිප්‍ර) අනුකූලවීම

ශ්‍රී ලංරාගිප්‍ර 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම - උපදේශක හා විනිශ්චය සේවාවන්ගෙන් ලැබෙන ආදායම උපචිත පදනමට ගිණුම්ගත කරනු වෙනුවට මුදල් පදනමට මූල්‍ය ප්‍රකාශනවලට ගෙන තිබුණි. එබැවින් මෙම සේවාවන්ගෙන් ලැබිය යුතු ආදායම තහවුරු කරගෙන සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි.

2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට ඉන්වෙන්ට්‍රි විෂයයන්ගේ ශේෂය භෞතිකව සත්‍යාපනය කර අගය කොට මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කරනු වෙනුවට රු.133,111,692 ක් වූ ඉන්වෙන්ට්‍රි විෂයයන් පිළිබඳ ලෙජර් ශේෂයන් එදිනට මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර තිබුණි. එබැවින් මූල්‍ය ප්‍රකාශනවලට එයින් වන බලපෑම නිශ්චය කරගත නොහැකි විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ වාර්ෂික තොග සත්‍යාපන වාර්තා අනුව, ඉන්වෙන්ට්‍රි විෂයයන් 1,057 ක් අනවශ්‍ය තොග ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේවුවද, ඒ සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයක් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන ප්‍රදාන යටතේ ලද මුදලින් මුළු වටිනාකම රු.2,179,600 කට දේපල, පිරියත හා උපකරණ අත්කරගෙන තිබුණි. කෙසේවුවද, අධිකාරිය විසින් රු.2,000,000 ක මුදලක් පමණක් සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රාග්ධනිත කර තිබුණි. එබැවින් සමාලෝචිත වර්ෂය අවසානයට ශුද්ධ වත්කම් රු.179,600 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) අධිකාරිය විසින් සේවය අවසන් කිරීම හේතුවෙන් සේවකයන් විසින් අධිකාරියට එරෙහිව ගොනුකර ඇති නඩු 04 කට අදාළව රු.863,698 ක මුදලක් ගෙවිය යුතු මුදල් ලෙස හඳුනාගෙන තිබුණි. කෙසේවුවද, මේ සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයක් කර නොතිබුණි.

2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද කාල විශ්ලේෂණය අනුව පිළිවෙලින් වර්ෂ 03 කට වැඩි කාලයක් හා වර්ෂ 05 කට වැඩි කාලයක් පැවති රු.2,550,614 ක් හා රු.1,719,187 ක් වූ විවිධ ණය හිමි ශේෂයන් නිරවුල් කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පියවර ගෙන නොතිබුණි.

(ආ) 1997 සිට 2004 වර්ෂය දක්වා කාල පරිච්ඡේදය තුළ මෝටර් වාහන සහ පිරියත හා යන්ත්‍රෝපකරණ කුලියට දීමට අදාළව ජාතික උපකරණ හා යන්ත්‍රෝපකරණ ආයතනයෙන් (NEMO) ලැබිය යුතු රු.114,529,393 ක මුදලක් 2015 දෙසැම්බර් 31 වනවිටත් අයකර ගැනීමෙන් තොරව පැවතුණි. කෙසේවුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල මෙම හිඟ ශේෂයන් සඳහා සම්පූර්ණ ප්‍රතිපාදනයක් කර තිබුණි.

2.2.4 හඳුනා නොගත් වෙනස්කම්

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වෙළඳ හා වෙනත් ලැබිය යුතු ශේෂයන් සහ අදාළ උපලේඛනයන්හි ශේෂයන් අතර රු.300,000 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම.
(අ). 1971 අංක 38 දරන මුදල් පනත	
(i) 11 වගන්තිය	මුදල් අමාත්‍යාංශයෙන් අවශ්‍ය අනුමැතිය ලබාගැනීමෙන් තොරව රු.15,707,803 ක මුදලක් සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි.
(ii) 14(1) වගන්තිය	සමාලෝචිත වර්ෂය සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාවේ පිටපතක් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි.

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.6,677,674 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.20,384,756 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලවල රු.13,707,082 ක වර්ධනයක් දැක්වුණි. කුසලතා සංවර්ධන පුහුණු වැඩසටහනෙන් ආදායම රු.6,646,250 කින් වැඩිවීම සහ ආදායම් උත්පාදන කාර්යයන් සඳහා වියදම් රු.6,310,868 කින් අඩුවීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරියේ 258 ක් වූ කාර්යමණ්ඩලය, රු.මිලියන 1,316 ක් වටිනා මුළු වත්කම් හා සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු රු.මිලියන 223 ක් වූ රජයේ දායකත්වය උපයෝජනයෙන් අධිකාරියේ මෙහෙයුම් ඌනතාවය රු.මිලියන 6.6 ක් විය.

(ආ) ඉකුත් වර්ෂයේ සියයට 1.6 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ ඌනතාවය මුළු වත්කම්වලින් සියයට 0.5 ක් නියෝජනය වූ අතර, එයින් සියයට 1.1 ක හිතකර තත්ත්වයක් දැක්වුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරියේ ක්‍රියාකාරී සැලැස්ම අනුව, අධිකාරියේ ක්‍රියාකරු පුහුණු මධ්‍යස්ථානයට (Operator Training Centre) සහ ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානයට (Construction Equipment Training Centre) සමාලෝචිත වර්ෂය තුළ එහි ඉලක්කගත අභ්‍යන්තර ඉපැයීම් සපුරා ගැනීමට නොහැකිවී තිබුණි. විස්තර පහත දැක්වේ.

විස්තරය	ඉලක්කගත ආදායම	ඉටුකර ගැනීම	ඉලක්කගත ආදායමේ ප්‍රතිශතයක් ලෙස ඉටුකර ගැනීම්
	රු.මිලියන	රු.මිලියන	
ක්‍රියාකරු පුහුණු මධ්‍යස්ථානය			
- වෙනත් උපකරණවලින් සහ යන්ත්‍ර ක්‍රියාකරු පුහුණු වැඩසටහනෙන් ආදායම	17.27	13.47	77.9
- යන්ත්‍ර හා උපකරණ කුලියට දීමෙන් ආදායම	18.00	1.62	.9

ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය

- ඉදිකිරීම් උපකරණ පුහුණු ආදායම	16.55	8.31	50.2
- වැඩමුළු, අලුත්වැඩියා කාර්යයන් සහ උපදේශක සේවා ආදායම	18.50	11.43	61.8

අධිකාරියේ ඉහළ මට්ටමේ කළමනාකරණයේ අවධානය මේ සම්බන්ධයෙන් යොමුකර නොතිබුණි.

(ආ) ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානයේ (CETRAC) වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්මට අනුව, මධ්‍යස්ථානයේ ප්‍රධාන කාර්යයන් වූයේ, ඉදිකිරීම්වලට අදාළ පුහුණු වැඩසටහන් පැවැත්වීම හා ඉදිකිරීම් කර්මාන්තය සඳහා කළමනාකරණ සේවා සැපයීමයි. කෙසේවුවද, ශ්‍රවණාගාරය හා සම්මන්ත්‍රණ කාමරය කුලියට දීමෙන් ඉදිකිරීම් උපකරණ පුහුණු මධ්‍යස්ථානය විසින් 2015 වර්ෂය තුළදී ආදායමෙන් ප්‍රධාන කොටස උපයා තිබුණි.

(ඇ) අධිකාරියේ මානව සම්පත් සංවර්ධන සැලැස්ම මාස 03 ක කාලයක් ඇතුළත පිළියෙල කිරීම සඳහා රු.150,000 ක එකවර ගෙවීමකට 2015 අප්‍රේල් 27 දින අධිකාරිය විසින් පැවරුම් පදනම මත උපදේශකයෙකු පත්කර තිබූ අතර ඔහුගේ කාර්යසාධනය පදනම්ව වාරික තුනකින් ගෙවීම කළ යුතු විය. තවද, උපදේශකවරයා විසින් නිමකරන ලද වැඩ විස්තර (යෝජනා කරන ලද ලියවිල්ලේ කෙටුම්පත් පිටපතක්) 2015 ජූලි 05 දින අධ්‍යක්ෂ (මානව සම්පත්) වෙත ඉදිරිපත් කර තිබූ අතර, රු.50,000 ක මුදලක් 2015 අගෝස්තු 10 දින ඔහුට ගෙවා තිබුණි. කෙසේවුවද, මානව සම්පත් සංවර්ධන සැලැස්මේ අවසාන පිටපත 2016 මැයි අවසානය වනවිටත් අධිකාරියට ඉදිරිපත් කර නොතිබුණි.

4.2 කළමනාකරණ දුර්වලතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල 1996 වර්ෂයේ සිට වර්ෂයක් පාසා ඉදිරියට ගෙන එන ලද රු.2,663,659 ක විදේශ ආධාර මුදල් ශේෂය මහා භාණ්ඩාගාරයට ආපසු ගෙවීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) ජාතික පාරිසරික ඉදිකිරීම් තාක්ෂණ තේමා පියෙස (National Environment Construction Technical Theme Park) මගින් ආදර්ශ ඉදිකිරීම් ක්‍රම හඳුන්වාදීම හා ප්‍රදර්ශනය කිරීම, නවීන හා සාම්ප්‍රදායික ගොඩනැගිලි ද්‍රව්‍ය හා ශිල්පීය ක්‍රම වර්තමානයේ යොදා ගැනීම සහ ඉදිකිරීම් පිළිබඳ දැනුම සමාජ ප්‍රජාව සඳහා දැක්වීම හා බෙදාහැරීම ක්‍රමයෙන් විකාශය කර තිබුණි. ඉහත ව්‍යාපෘතිය 2011 දෙසැම්බර් මාසයේදී ආරම්භ කර තිබූ අතර, 2014 දෙසැම්බර් මාසයේදී නිම කිරීමට සැලසුම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී ආදර්ශ නිවාස 05 ක් ඉදිකිරීමට ව්‍යාපෘතිය සැලසුම් කර තිබුණි. කෙසේවුවද, ආදර්ශ නිවාස 04 ක් පමණක් ගොඩනැගීම ආරම්භ කර තිබූ අතර, එයින් 02 ක් පමණක් නිශ්චිත ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුළදී සම්පූර්ණ කර තිබුණි. ඉතිරි ආදර්ශ නිවාස 2016 මැයි 31 වනවිටත් ඉදිකර නොතිබුණි.

(ii) ව්‍යාපෘති යෝජනාවේ ඇතුළත් වැසි ජල අස්වනු පද්ධති සහිත නිවාස ඉදිකිරීම, බලශක්ති කාර්යක්ෂමතාවය ලෙස සූර්ය බල ශක්තිය ඵලදායීව යොදා ගැනීම ප්‍රදර්ශනය කිරීම, ආදර්ශ සුළං බලය උත්පාදන පිරියත ස්ථාපනය කිරීම, වියළි කලාප ප්‍රදේශ සඳහා බොරලු පාරවල් ඉදිකිරීම යනාදී කාර්යයන් 2016 මැයි අවසානය වනවිටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) තේමා පියෙස (Theme Park) ඉදි කරන ලද ඉඩමේ අයිතිය නිරවුල්ව හඳුනාගෙන නොතිබුණි.

4.3 විශ්‍රාම ප්‍රතිලාභ සඳහා අරමුදලක් ගොඩනැගීම

පාරිතෝෂික ගෙවීම සඳහා 2015 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල රු.61,791,489 ක ප්‍රතිපාදනයක් කර තිබුණද, අනාගත වගකීම් දැරීම සඳහා එම ප්‍රතිපාදන ආයෝජනය කිරීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

4.4 අභ්‍යන්තර විගණන ඒකකය

අධිකාරිය විසින් සහකාර අභ්‍යන්තර විගණක හා කළමනාකරණ සහකාර යන නිලධාරීන් දෙදෙනෙකු පමණක් 2011 ජූනි සිට අභ්‍යන්තර විගණන අංශයට වැඩ බැලීමේ පදනම මත පත්කර තිබුණි.

4.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අධිකාරියේ මූල්‍ය ප්‍රතිඵලය රු.6,677,674 ක ඌනතාවයක් විය. කෙසේවුවද, එහි කාර්යමණ්ඩලයට වාර්ෂික ප්‍රසාද දීමනා ගෙවීමේ අරමුණ සඳහා රු.31,529,349 ක ශුද්ධ ලාභයක් එම කාල පරිච්ඡේදය සඳහාම පෙන්නුම් කරමින් වෙනම ආදායම් ප්‍රකාශනයක් අධිකාරිය විසින් පිළියෙල කර තිබුණි. ඒ අනුව, 2015 දෙසැම්බර් 09 දිනැති අංක 02/2015 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයට පටහැනිව සමාලෝචිත වර්ෂය තුළ වාර්ෂික ප්‍රසාද දීමනා ලෙස එහි සේවක මණ්ඩලයට රු.2,317,245 ක මුදලක් ගෙවා තිබුණි.

4.6 **මානව සම්පත් කළමනාකරණය.**

2015 දෙසැම්බර් 31 දිනට අධිකාරියේ අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 360 ක් හා 258 ක් විය. වර්ෂ කිහිපයක සිට පුරප්පාඩු තනතුරු පිරවීමට ප්‍රමාණවත් පියවර ගැනීමෙන් තොරව, අභ්‍යන්තර විගණක, අධ්‍යක්ෂ (මුදල්), නියෝජ්‍ය අධ්‍යක්ෂ මෙහෙයුම් (පුහුණු මධ්‍යස්ථානය) ආදී විධායක මට්ටමේ තනතුරු 18 ක් ඇතුළත්ව පුරප්පාඩු 102 කින් පුරප්පාඩු 27 ක් 2015 දෙසැම්බර් 31 දිනට වැඩ බැලීමේ පදනම මත පත්කර තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

5. **ගිණුම්කටයුතු භාවය හා යහපාලනය**

5.1 **අයවැය ලේඛනමය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

6. **පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු වේ.

(අ) ගෙවිය යුතු හා ලැබිය යුතු ගිණුම් - ගෙවිය යුතු හා ලැබිය යුතු ශේෂයන් අදාළ පාර්ශවයන් විසින් සනාථ කර නොතිබුණි.

(ආ) ආදායම් කළමනාකරණය - අධිකාරිය විසින් අනුක්‍රමික පිළිවෙලකින් තොරව ඉන්වොයිසි නිකුත් කර තිබුණි.

එච්.එම්. ගාමිණී විජේසිංහ

විගණකාධිපති.